ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்பு பணியகம்

Sri Lanka Bureau of Foreign Employment



වාර්ෂික වාර්තාව 2016

SLSI SYSTEM CERTIFIED ISO 9001

එතෙර සවියට මෙතෙර අත්වැල



ආයුබෝවන්!

පෙළගැස්ම

- සභාපතිතුමාගේ පණිවුඩය 02
- අධ්‍යක්ෂ මණ්ඩලය 03
- සමූහ ව්‍යුහය 05
- දැක්ම, මෙහෙවර, තත්ත්ව ප්‍රතිපත්තිය හා අරමුණු 07
- විශේෂ කරුණු 08
- මෙහෙයුම් සිතියම 13
- ආංශික ප්‍රගතිය (පිටත් වීමට පෙර) 14
  - ගුවන්තොටුපල 15
  - පළමු අනුමැති 15
  - අවසන් අනුමැති 17
  - නීති 18
  - බලපත්‍ර 21
  - අලෙවිකරණ 22
  - බැඳවා ගැනීම් 25
  - විශේෂ විමර්ශන 37
  - පුහුණු - ගෘහස්ථ 38
  - පුහුණු - ගෘහස්ථ නොවන 42
- ආංශික ප්‍රගතිය (සේවා කාලය තුළ) 44
  - සමථ 45
  - විදේශ දූත මණ්ඩල පරිපාලන හා විදේශ සම්බන්ධතා 45
  - විදේශ සම්බන්ධතා II 49
- ආංශික ප්‍රගතිය (පෙරළා පැමිණීමෙන් පසුව) 50
  - මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකය 51
  - ප්‍රත්‍යානුකලන 53
  - සමාජ විද්‍යා 53
  - සුභසාධන 56
- ආංශික ප්‍රගතිය (උපකාරක සේවා) 58
  - පරිපාලන හා මානව සම්පත් 59
  - මුදල් 60
  - නඩත්තු 62
  - තොරතුරු තාක්ෂණ 63
  - අභ්‍යන්තර විගණන 65
  - සැලසුම් හා අධීක්ෂණ 66
  - ප්‍රසම්පාදන 67
  - ප්‍රචාරක හා මහජන සම්බන්ධතා 68
  - පර්යේෂණ 69
  - ප්‍රවාහන 69
- විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව 70
- සභාපතිතුමාගේ සමීක්ෂණ වාර්තාව 86

සභාපතිතුමාගේ පණිවුඩය



2016 වසර සඳහා පිහිටුවන ලද ක්‍රියාපිළිවෙත් හා අරමුණු මගින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වාර්ෂික ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට සහයක් ලැබිණ. පාරිභෝගික කේන්ද්‍රීයතාව සහ මෙහෙයුම් ආශ්‍රිත විශිෂ්ටතාව වැඩිදියුණු කරමින් මෙම කර්මාන්තය ජාතික ආර්ථිකයේ ප්‍රමුඛස්ථානයක් කරා රැගෙන යාමේ අරමුණින් අපගේ විදේශ සහ දේශීය ශාඛාද ඇතුළත් වන පරිදි කාර්යාංශය පුරාවටම නිසි පද්ධති හා ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමට අපි කටයුතු කළෙමු. මෙම ප්‍රයත්නය සාර්ථක කර ගැනීම වෙනුවෙන් අපගේ කාර්ය මණ්ඩලය හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන ලද දායකත්වය සහ විදේශ රැකියා අමාත්‍යතුමියගේ හා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ මගපෙන්වීම ප්‍රශංසනීය ය.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙතෙක් අත්කර ගත් ඉහළම ලාභය සනිටුහන් කරමින් රු. මිලියන 1,309 ක ලාභයක් වාර්තා කිරීමට 2016 වසරේදී හැකි වූ අතර විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණය එහිලා උපස්ථම්භක විය. ගත වූ වසරට සාපේක්ෂව බැලීමේදී 2016 දී රටින් බැහරට ගිය පිරිස 7.79% කින් අඩුව ඇති නමුදු රට තුළට ප්‍රේෂණය වූ මුදල් ප්‍රමාණයෙහි 3.74% ක ඉහළ යාමක් වාර්තා වී ඇත. 2016 වසරට අදාළ මුළු ප්‍රේෂණය ඇ.එ.ප. ඩොලර් බිලියන 7.2 ක් වන අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙතෙක් වාර්තා කළ ඉහළම ප්‍රේෂණ මුදල් ප්‍රමාණය වන්නේද එය බව සතුටින් සඳහන් කරමි.

මෙම සමාලෝචනයට ලක් වන වසර තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ සහ දීප ව්‍යාප්ත ශාඛා ජාලයෙහි මුදල් ගනුදෙනු කටයුතු වෙනුවෙන් ඒකාබද්ධ පරිගණක පද්ධතියක් හඳුන්වා දෙන ලදී. මෙම පහසුකම විදේශ ශාඛා වෙතද ඉදිරියේදී ව්‍යාප්ත කෙරෙනු ඇත.

අපගේ මෙහෙවර වන ''දේශීය ආර්ථිකයට දායක වෙමින් හා සියලුම පාර්ශ්වකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින් ජනතාවට තම කුසලතාවන්ගෙන් එතෙර රැකියා වෙළෙඳපොලෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම'' මත පදනම්ව වෙනස්වන වෙළෙඳපොල තත්ත්වයන්ට අනුකූල වන පරිදි අපගේ වර්ධනය වැඩිදියුණු කරගත හැකි තැනකට අප පත්ව ඇත.

ආර්. කේ. ඔබේසේකර,
සභාපති,
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය

ආර්. කේ. ඔබේසේකර මහතා
සභාපති

උපුල් දේශප්‍රිය මහතා
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

චන්ද්‍රානි සේනාරත්න මිය
අධ්‍යක්ෂ

එස්. එස්. ගනේගම ආරච්චි මහතා
අධ්‍යක්ෂ

නෙවිල් කරුණාරත්න මහතා
අධ්‍යක්ෂ

ගාමිණී රත්නායක මහතා
අධ්‍යක්ෂ

කේ. කේ. ඊ. වීරසිංහ මහතා
අධ්‍යක්ෂ

එම්. එෆ්. එම්. අර්ෂද් මහතා
අධ්‍යක්ෂ

එම්. එෆ්. එම්. ෆනූර් මහතා
අධ්‍යක්ෂ

එම්. එම්. මොහොමඩ් මහතා
අධ්‍යක්ෂ



''කිසියම් රටක
සුවිශාලම වත්කම
එහි වැසියන් යනු
ජනප්‍රිය කියමනකි''

සමූහ ව්‍යුහය

1 විදේශ රැකියා අමාත්‍යාංශය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය විසින් 2015 සැප්තැම්බර් 21 දින නිකුත් කරන ලද අංක 1933/13 දරණ අති විශේෂ ගැසට් පත්‍රිකාව ප්‍රකාරව පහත සඳහන් විෂය පරාසය සහිතව විදේශ රැකියා අමාත්‍යාංශය ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සිය එකී අති විශේෂ ගැසට් පත්‍රිකාව මගින් විදේශ රැකියා අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන පරිදි පිහිටුවන ලදී.

2 විදේශ සේවා නියුක්ති කාර්යාංශය

1985 අංක 21 දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිහිටුවන ලද අතර 1994 අංක 04 සහ 2009 අංක 56 දරන පනත් මගින් ඊට අදාළ විධිවිධාන සංශෝධනය කරන ලදී.

3 ශ්‍රී ලංකා විදේශ රැකියා පුද්ගලික සමාගම

ශ්‍රී ලංකා විදේශ රැකියා පුද්ගලික සමාගම යනු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පූර්ණ හිමිකාරත්ව අනුබද්ධිත ආයතනයකි.



''ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මෙතෙක් වාර්තා කරන ලද රු. මිලියන 1,309 ක් වූ ඉහළම ලාභය 2016 වසරේදී සනිටුහන් කරන ලදී''

දැක්ම

එතෙර වෙළඳපොළ සඳහා නිපුණතාවයෙන් පිරි මිනිස් සම්පත සැපයීමේ ලොව හොඳම තේරීම බවට ශ්‍රී ලංකාව පත්වීම.

මෙහෙවර

දේශීය ආර්ථිකයට දායක වෙමින් හා සියළුම පාර්ශවකරුවන්ගේ යහපත සුරක්ෂිත කරමින්, ජනතාවට තම කුසලතාවයන්ගෙන් එතෙර රැකියා වෙළඳපොළෙහි යහපත් ප්‍රතිලාභ ලැබිය හැකි කාර්යක්ෂම හා සමානත්වයෙන් යුතු මාර්ගයන් බිහි කිරීම.

තත්ත්ව ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය එහි සේවාවන්හී ගුණාත්මකභාවය අඛණ්ඩව ඉහළ නංවමින් පාරිභෝගික තෘප්තිය අතික්‍රමණය කිරීම පිණිස කාර්යක්ෂම හා ඵලදායී සේවා සැපයීම සඳහා කැපවී සිටී.

අරමුණ

1. ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත රැකියා අවස්ථා පුළුල් කිරීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම.

2. විදේශ රැකියා කර්මාන්තය නියාමනය කිරීම හා ඊට අවශ්‍ය සහය ලබා දීම.

3. ශ්‍රී ලංකාවෙන් පිටත රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් සහ රට තුළ වාසය කරන ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුභසාධනය හා ආරක්ෂාව සහතික කිරීමේ විධිවිධාන අනුගමනය කිරීම.

විශේෂ කරුණු

විශේෂ කරුණු

විගමනික සේවකයන් සඳහා වන්දි ගෙවීම

සමථ ඒකකය ආශ්‍රිතව පැමිණිලි විසඳීමේ ක්‍රියාවලියට අනුකූලව පැමිණිලි 295 කට අදාළව දේශීය හා විදේශීය රැකියා නියෝජිතායතන වෙතින් රු. 10,534,890.00 ක මුදලක් අයකර ගන්නා ලද අතර ඉන් අනතුරුව වන්දි මුදල් හෝ හිඟ වැටුප් වශයෙන් එකී මුදල විගමනික සේවකයන් හට ගෙවන ලදී.

විදේශ රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකික සේවකයන්ට අදාළව විදේශ ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහය වීම සහ විදේශ රටවල් ආශ්‍රිත ශ්‍රී ලාංකික විදේශ මෙහෙවර හරහා එකී ප්‍රතිපත්ති ක්‍රියාවේ යෙදවීම:

රට	කාරණය	අත්සන් තැබූ දිනය
ඕශ්‍රායලය	ඕශ්‍රායලයේ පදිංචි වයස්ගත හෝ ආබාධිත පුද්ගලයන් රැකබලා ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත්ව ගිය සේවකයින් බඳවා ගැනීම හා ස්ථානගත කිරීම සඳහා වන නියමු වැඩසටහන	25.05.2016
සෞදි අරාබිය	ගෘහ සේවක සේවිකාවන් බඳවා ගැනීමේ ගිවිසුම	යෝජිත
සයිප්‍රසය	ශ්‍රී ලාංකික මෘන්පවර් සේවකයන් සේවයට බඳවා ගැනීමේ අවබෝධතා ගිවිසුම	යෝජිත
ඇමරිකා එක්සත් ජනපදය	සාත්තු සේවකයන් සඳහා වූ අවබෝධතා ගිවිසුම	03.05.2016
ලෙබනනය	මෘන්පවර් සේවකයන් බඳවා ගැනීම සඳහා වූ අවබෝධතා ගිවිසුම	යෝජිත

හිඟ වැටුප්, වන්දි මුදල් සහ ශ්‍රී ලාංකික සේවකයන්ගේ අනෙකුත් ඉල්ලීම් ලබා දීම වෙනුවෙන් සහය වීම:

රට	පුතිලාභීන් සංඛ්‍යාව	මුදල (රුපියල්)
සෞදි අරාබිය	46	22,057,884.75
කුවේට්	02	259,013.58
ඕමානය	02	748,740.80
කටාර්	01	604,196.27
ජෝර්දානය	01	1,141,091.00
මුළු මුදල		**24,810.926.40**

JITCO වැඩසටහන

ශ්‍රී ලංකාව හා ජපානය අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් ආරම්භ කරන ලද මෙම වැඩසටහන විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍රවර්ධන හා සුභසාධන අංශයේ සහයෝගය යටතේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ක්‍රියාත්මක කොට ප්‍රවර්ධනය කරන ලද අතර පුහුණු ශ්‍රමිකයින් බඳවා ගැනීමෙන් අනතුරුව බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන හරහා වැඩිදුර වෘත්තීය පුහුණුව ලබා දීම සඳහා ජපානය බලා පිටත්ව යනලදී.

www.slbfe.lk වෙබ් අඩවියෙහි ලියාපදිංචි බලපත්‍රලාභී නියෝජිත ආයතන හරහා සේවකයින් බඳවා ගැනීම සිදු කරන ලදී. පුහුණු ලාභීන් බඳවා ගැනීමේ අවසරය සෑම බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතනයක්ම වෙත හිමි නොවූ හෙයින් මෙම වැඩසටහන සඳහා තෝරා ගන්නා ලද ඇතැම් නියෝජිත ආයතන සඳහා විශේෂ අවසරයක් ලබා දීමට කටයුතු කරන ලදී.

JITCO වැඩසටහන යටතේ 2016 වසරේදී නියෝජිත ආයතන 23 ක් ලියාපදිංචි කරන ලද අතර, නව නියෝජිත ආයතන 04 ක් ලියාපදිංචි කරන ලදී.

වෙනත් ක්‍රියාකාරකම්



කොළඹ ක්‍රියාදාම සමුළුවට අදාළ අමාත්‍යවරුන්ගේ රැස්වීම 2016 අගෝස්තු 25 දින කොළඹ ගාලු මුවදොර හෝටලයේදී පවත්වන ලද අතර විගමනික සේවකයන්ට අදාළ ගැටළු හා ඔවුන්ගේ සංවර්ධනයට අදාළ කරුණු සාකච්ඡා කරනු පිණිස සාමාජික රටවල් 11 ක අමාත්‍යවරු ඊට සහභාගී වූහ.



ඕමානය සහ ශ්‍රී ලංකාව අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුව ශ්‍රමිකයින් හා ඔවුන් පුහුණු කිරීමට අදාළ කරුණු සාකච්ඡා කරනු පිණිස ඕමාන රාජ්‍ය නියෝජිත පිරිසක් 2016 සැප්තැම්බර් 19 සිට 22 දක්වා පැවැත්වුණු තාක්ෂණික සන්ධාන කමිටු රැස්වීම සඳහා සහභාගී වනු පිණිස ශ්‍රී ලංකාව බලා පැමිණියේය.





2016 නොවැම්බර් 02 දින පැවැත්වුණු සියලුම බලපත්‍ර ලාභී නියෝජිත ආයතන සඳහා වූ දැනුවත් කිරීමේ වැඩසටහන.



මතුගම විගමනික සේවක සම්පත් මධ්‍යස්ථානයේ පරිපාලන ගොඩනැගිල්ල සඳහා මුල්ගල තැබීම.



කතරගම යෝජිත සංචාරක බංගලාවේ සමාරම්භක උත්සවය.



ගරු අමාත්‍යතුමිය 2016 පෙබරවාරි මාසයේදී සිදු කළ ඕමාන සහ කුවේට් සංචාරයෙන්.



විදේශ ශ්‍රමික කාන්තාවක් වෙත හිමි නිඟ වැටුප් ලබා දුන් අවස්ථාව.



නැගෙනහිර පළාතේ විදේශ විගමණික සේවකයන්ගේ දරුවන් වෙනුවෙන් පවත්වන ලද ශිෂ්‍යත්ව ප්‍රදානය.



සබරගමුව පළාතේ විදේශ විගමණික සේවකයන්ගේ දරුවන් වෙනුවෙන් අරලියගහ මන්දිරයේදී පවත්වන ලද ශිෂ්‍යත්ව ප්‍රදානය.



සහන නිවාස යොජනා ක්‍රමය යටතේ, ආබාධිත විදෙස් ශ්‍රමිකයන් වෙත නිවාස පරිත්‍යාග කිරීම.



ආබාධයට ලක් වූ විදෙස් ශ්‍රමිකයෙකු වෙනුවෙන් නිවසක් ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම.

2016 වසර තුළ සිදු කරන ලද තත්ත්ව වැඩිදියුණු කිරීම්

පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන්

- 2016 වසර තුළ වැඩසටහන් 06 ක් පවත්වන ලදී

පුහුණු වඩසටහන්වල කාල සීමා දීර්ඝ කිරීම

- රූපලාවන්‍ය වැඩසටහන් හරහා ප්‍රසිද්ධිය වැඩිදියුණු කිරීම
- ළමාරක්ෂණ සැසි ඇතුළත් කිරීම
- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා වෙන් කර ඇති කාලසීමාව දීර්ඝ කිරීම
- පුහුණුකරුවන් සඳහා වන මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්

පුහුණුකරුවන්ගේ නිපුණතා සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම

- ආහාර සහ චර්යාත්මක පුහුණුව
- රූපලාවන්‍ය වැඩසටහන් හරහා ප්‍රසිද්ධිය වැඩිදියුණු කිරීම
- ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා වෙන් කර ඇති කාලසීමාව දීර්ඝ කිරීම
- පුහුණුලාභීන් සඳහා නව නිල ඇඳුම් පරිපාටියක් හඳුන්වා දීම
- පුහුණුකරුවන් සඳහා වන මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්

පුහුණුකරුවන් සඳහා පුහුණුව

- HIV / AIDS තුරන් කිරීමට අදාළව අලුතින් දියත් කරන ලද ක්‍රමවේද
- කාන්තා ශ්‍රමික හිමිකම්
- මානසික-සමාජ වැඩසටහන් හරහා ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිටුදැකීම
- මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්

රැකියා බැංකුව

විදේශ රැකියා අපේක්ෂිතයන් හට කාර්යාංශයේ අන්තර්ජාලය පාදක කරගත් රැකියා බැංකුව හරහා හෝ ප්‍රධාන කාර්යාලයෙන් හෝ දිවයින පුරා ඕනෑම ශාඛාවකින් ලබාගන්නා අයදුම්පතක් මගින් සෘජුවම ලියාපදිංචි විය හැකිය. විදේශ රැකියා ආයතනවලට රැකියා අපේක්ෂකයන් සොයා ගැනීමට මෙමඟින් හැකියාව ලැබේ.



www.slbfe.lk



මෙහෙයුම් සිතියම


විදේශ රැකියා අපේක්ෂා කරන්නා
සුදුසුකම් සැපිරූ ශ්‍රමිකයා
නැවත පැමිණීමේදී
සේවයේ නිරතව සිටියදී
සුභසාධන පහසුකම්
සුදුසුකම් සපුරා නැත
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
අවශ්‍ය පුහුණුව
ස්වයං පදනම මත
දේශීය නියෝජිතායතනය හරහා
කාර්යාංශ පුහුණු මධ්‍යස්ථානය
කාර්යාංශ ලියාපදිංචිය
පිටත්ව යාම
විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල
විදේශ නියෝජිතයන්
සේවා යෝජකයා

ආංශික කාර්යසාධනය

පිටත්ව යෑමට පෙර

ගුවන් තොටුපල ඒකකය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කටුනායක සහ මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපල ආශ්‍රිත පිටවීමේ හා ඇතුළු වීමේ පර්යන්තවල කවුන්ටර ආශ්‍රිතව ක්‍රියාත්මක වන අතර කළමනාකාරවරුන් තිදෙනෙකුගේ සෘජු අධීක්ෂණය යටතේ විදේශ රැකියා සඳහා පිටත්ව යන හා පැමිණෙන ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් ලියාපදිංචි කිරීම හා සුභසාධන පහසුකම් සැලසීම මෙහි අරමුණයි.

එසේම, අවශ්‍යතා සහිතව පැමිණෙන විගමණික ශ්‍රමිකයන්ගේ සුභසාධන කටයුතු සිදුකිරීම සඳහා ''සහන පියස'' නමින් විශේෂ සුභසාධන මධ්‍යස්ථානයක් කටුනායක ගුවන්තොටුපල ආශ්‍රිතව පැය 24 පුරා විවෘතව ඇත.

ගුවන්තොටුපල පිටවීමේ පර්යන්ත ආශ්‍රිත කාර්යාංශ කවුළුවේ කාර්යයන්/කාර්යසාධනය

ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද විදෙස් ගමන් බලපත්‍ර සහිතව රැකියා වීසා මත පුද්ගලයන් විදේශගත වීමේදී ඔවුන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි ලියාපදංචි වී ඇතිද යන වග පරීක්ෂා කිරීම ගුවන්තොටුපලෙහි පිහිටා ඇති කාර්යාංශ ඒකකයට අනුයුක්ත කර ඇති නිලධාරීන් විසින් සිදු කරනු ලබයි. සේවා කාලය අවසාන වී නැවත ශ්‍රී ලංකාවට පැමින මුල් සේවා ස්ථාන වලට ම නැවත පිටත්ව යන විගමණික ශ්‍රමිකයින්ගේ ලියාපදිංචි කිරීමද මෙම ඒකකය මගින් සිදුකරයි. 2016 වසරේදී ලියාපදිංචි කිරීම් 68,754 ක් වාර්තා වූ අතර ඉන් ලැබුණු සමස්ථ ආදායම රු. 295,463,130 ක් විය.

කටුනායක ගුවන්තොටුපොලෙහි ළඟාවීමේ පර්යන්තය ආශ්‍රිත කාර්යාංශ කවුළුවේ ක්‍රියාකාරකම්/කාර්යසාධනය

තමන් විදේශයන්හිදී සේවය කරමින් සිටියදී මුහුණ පාන්නට සිදු වූ විවිධ ප්‍රශ්න හේතුවෙන් පෙරළා ශ්‍රී ලංකාව බලා එන ශ්‍රමිකයන් ළඟාවීමේ පර්යන්තයේදී අප නිලධාරීන් විසින් පිළිගනු ලැබීමෙන් අනතුරුව වැඩිදුර පියවර වෙනුවෙන් "සහන පියස සුභසාධන මධ්‍යස්ථානය" වෙත යොමු කරනු ලැබේ.

"සහන පියස" සුභසාධන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්/කාර්යසාධනය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සුභසාධන මධ්‍යස්ථානය වන 'සහන පියස' මගින් විදේශයන්හි සේවයකරමින් සිටියදී විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පාන්නට සිදු වූ ශ්‍රී ලංකාව බලා පැමිණි විගමණික ශ්‍රමිකයන්ට ප්‍රවාහන පහසුකම්, ගමන් වියදම්, ආහාර සහ නවාතැන් පහසුකම්, වෛද්‍ය ප්‍රතිකාර හා රෝහල් පහසුකම් ආදී සේවාවන් සපයනු ලැබේ. මෙම ශ්‍රමිකයන්ගේ පහසුව පිණිස ගිලන් රථයක් සහ වෑන් රථ දෙකක් සෑම විටම සහන පියසේ සුදානමින් තැබේ. 2016 වසරේදී සහන පියස සුභසාධන මධ්‍යස්ථානය වෙත ලියාපදිංචි වීම් 6,531 ක් හිමි වූ අතර එමගින් ලැබුණු සමස්ථ ආදායම රු. 99,416,309 ක් විය.

පළමු අනුමැති අංශය

පළමු අනුමැති අංශයේ ප්‍රධාන කාර්යභාරයන් වන්නේ ස්වයං මාර්ගයෙන් විදේශගතවන විගමණික ශ්‍රමිකයන්ට අදාල ලියාපදිංචි කිරීම් සඳහා සහය දැක්වීම, විදෙස් ශ්‍රමිකයන් බඳවා ගැනීම සඳහා රැකියා නියෝගිත ආයතන වල රැකියා ඇණවුම් සහ ප්‍රචාරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දීම, රැකියා ඇණවුම් වල වලංගු භාවය තානාපති කාර්යාල හරහා තහවුරු කිරීම ආදියයි.

කාර්යයන්	2011	2012	2013	2014	2015	2016
ලබා දුන් පළමු අනුමැති ප්‍රමාණය	5,763	10,656	6,326	6,184	5,632	4,359
වෙළඳ දැන්වීම් ප්‍රමාණය	4,000	3,056	3,583	3,232	2,756	2,277
ඉකුත් වූ රැකියා ඇණවුම් දීර්ඝ කිරීම	2,298	0	2,979	3,274	1,802	1,748
ස්වයං-ලියාපදිංචි වීම් (තමන් සතුව ආරක්ෂිත රැකියා අවස්ථා ඇති අය)	114,898	101,797	109,560	114,842	134,167	141,334



කුවේට්

කුවේටය ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් කුසලතා පාදක කරගත් රැකියා අවස්ථා රැසක් ලබා දෙන රටක් වන අතර ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් එකී රැකියා අවස්ථාවලින් ඵල නෙළා ගනිමින් ඇත. 2016 වසරේදී කුවේට් රාජ්‍යයේ රැකියා නියුක්තිය 60,000 ඉක්මවමින් ඉහළ ගොස් ඇත.

අවසන් අනුමැති අංශය

අවසන් අනුමැති අංශයේ ප්‍රධාන කාරයභාරය හා අරමුණ වන්නේ නිසි නෛතික ක්‍රමවේද අනුගමනය කරමින් විදෙස් රැකියා වෙළෙඳපොල සඳහා කුසලතා පිරිපුන් මානව සම්පත් බඳවා ගැනීම වෙනුවෙන් විදේශ රැකියා නියෝජිත ආයතන වෙත කාර්යක්ෂම සේවාවක් ලබා දීමයි.

එම අරමුණ සාක්ෂාත් කරගනු පිණිස අවසන් අනුමැති අංශය විසින් පහත සඳහන් සේවා ලබා දෙනු ලැබේ.

- බලපත්‍රලාභී විදේශ රැකියා ආයතන මගින් සිදු කරනු ලබන බඳවාගැනීම් සඳහා අනුමැතිය ලබා දීම.
- අවසන් අනුමැති ක්‍රියාවලියේදී හඳුනාගනු ලබන සැකසහිත ලේඛන විමර්ශන සඳහා යොමු කිරීම.
- අවශ්‍ය පාර්ශව වෙත අවසන් අනුමැතිය සම්බන්ධයෙන් තොරතුරු ලබා දීම.

2016 සිට 2011 දක්වා ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය මධ්‍යස්ථාන හරහා ලබා දුන් අවසන් අනුමැතිවලට අදාළ සංඛ්‍යාන දත්ත



අවසන් අනුමැති අංශයේ සැකැස්ම



නීති අංශය

විදේශ රැකියා කර්මාන්තය තුළ ඇති නීති විරෝධී අවභාවිතයන් තුරන් කිරීමේ හා ශ්‍රී ලාංකිකයන් සඳහා යහපත් පරිචයන් වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙහි නීති අංශය ස්ථාපිත කරන ලදී.

නීති අංශයේ ක්‍රියාකාරකම්

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙනුවෙන් මහේස්ත්‍රාත් අධිකරණ, දිස්ත්‍රික් අධිකරණ, ඉහළ උසාවි, අභියාචනාධිකරණය, ශේෂ්ඨාධිකරණය, මානව හිමිකම් කොමිෂන් සභාව හා කම්කරු උසාවිය හමුවේ පෙනී සිටීම.
- විවිධ සිදුවීම්වලට අදාළ පැමිණිලි, චෝදනා පත්‍ර හා අනෙකුත් නෛතික ලිපි ලේඛන කෙටුම්පත් කිරීම.
- මහජනතාව විසින් සිදු කරන ලද පැමිණිලිවලට අදාළව නෛතික පියවර ගොනුගත කිරීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව පවරා ඇති නඩුවලට අදාළව කාර්යාංශය වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනෙකුත් අංශවලට අවශ්‍ය නීතිමය උපදෙස් ලබා දීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙනුවෙන් දිවුරුම් ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් කෙටුම්පත් කිරීම හා තහවුරු කිරීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ කාර්ය මණ්ඩලය වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- පොලිස් නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩල සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- අවශ්‍ය අවස්ථා වලදී නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- බලපත්‍ර අලුත් කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම.
- රක්ෂණ මුදල් ගෙවීමට අදාළ නිර්දේශ ලබා දීම.





විදේශ රැකියා නියුක්තිය පිළිබඳව අවබෝධය පුළුල් කරනු වස් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය සහ රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් "එතෙර ශ්‍රමයට නීතියෙන් අත්වැලක්" නමින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. ඒ අනුව, 2016 වසර තුළ එවැනි වැඩසටහන් 04 ක් පවත්වන ලද අතර නිලධාරීන් 800 කට අධික ප්‍රමාණයක් ඊට සහභාගී විය. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට සමථ ක්‍රමවේදය, මානව හිමිකම් සහ ස්වභාවික යුක්තිය පිළිබඳ රීතිය, විනය ක්‍රමවේද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ දක්වා ඇති විමර්ශන ක්‍රමවේද, මිනිස් ජාවාරමේ වින්දිතයන් හඳුනාගැනීම සහ අදාළ උපදෙස් සඳහා ඔවුන් යොමු කිරීම වැනි මාතෘකා එහිදී සාකච්ඡාවට බඳුන් කෙරිණ.

2011 සිට 2016 දක්වා කාලය තුළ නඩු මගින් දඩ වශයෙන් අයකර ගත් මුදල් සහ කාර්යාංශයේ ශ්‍රමික සුභසාධන අරමුදල වෙත ප්‍රේෂණය කළ මුදල්

විස්තරය	2011	2012	2013	2014	2015	2016
නඩු මගින් අයකරගත් මුදල් (රු.)	6,656,321	3,487,638	1,433,688	4,188,207	5,266,859	3,880,400
දඩ මුදල් (රු.)	3,014,000	1,296,000	1,195,000	1,544,000	6,393,000	7,702,500
කාර්යාංශය වෙත ප්‍රේෂණය කළ මුදල් (රු.)	2,260,500	934,500	896,250	1,158,000	4,626,000	5,746,875

2016 දී නීති අංශය විසින් සම්පූර්ණ කරන ලද කාර්යභාරයන්

වැඩසටහන/කාර්යභාරය	එකතුව
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට එරෙහිව ගොනු කරන ලද නඩුවලට අදාළව අධිකරණ හා විනිශ්චය සහාවන්හි පෙනී සිටීම	101
නීති කඩ කළ බලපතුලාභී සහ බලපත්‍ර රහිත පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම	212
බලපතුලාභී සහ බලපත්‍ර රහිත පුද්ගලයන්ට එරෙහිව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ගොනු කරන ලද නඩුවලට අදාළව අධිකරණ සහ විනිශ්චය සහාවන්හි පෙනී සිටීම	3,264
අංශවල කාර්යභාරයන් සඳහා අවශ්‍ය නෛතික සහය ලබා දීම	1,458
නෛතික ලේඛන කෙටුම්පත් කිරීම හා සහතික කිරීම	38
විදේශ රැකියා නීති සහ අනෙකුත් අදාළ නීති පිළිබඳව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ කාර්ය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	02
නීති නිලධාරීන් සතුව පවතින දැනුම යාවත්කාලීන කිරීම සඳහා ජාතික හා අන්තර්ජාතික නෛතික වැඩමුළු හා වැඩසටහන් සඳහා ඔවුන් සහභාගී කරවීම	04
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත යටතේ මිනිස් ජාවාරම තුරන් කිරීම පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් හා පොලිස් නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	02

2016 දී ආංශික ක්‍රියාකාරකම් සඳහා ලබා දුන් නෛතික සහය

ක්‍රියාකාරකම	එකතුව
බලපත්‍ර අලුත් කිරීම් වෙනුවෙන් ඉදිරිපත් කළ වාර්තා	1,159
සම්පූර්ණ කරන ලද රක්ෂණ මුදල් ගෙවීම් ගොනු	299
වෙනත් ආයතන විසින් පවත්වන ලද නෛතික වැඩමුළු	18
මානව හිමිකම් කොමිසමේ සහ අනෙකුත් සමාන ආයතනවල පෙනී සිටි සහ අවශ්‍ය අවස්ථාවලදී තොරතුරු ලබා දුන් වාර ගණන	10

2016 දී නිම කළ නීතිමය ක්‍රියාමාර්ගවල සාරාංශය











සෞදි අරාබිය

සෞදි අරාබිය යනු ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් රැකියා අවස්ථා රැසක් උදාකර දුන් සහ තවමත් එසේ කරමින් සිටින රටකි. 2016 වසර තුළදී 60,000 කට අධික ශ්‍රී ලාංකිකයන් පිරිසක් රැකියා සඳහා එරටට පිටත්ව ගොස් ඇත.

බලපත්‍ර අංශය

බලපත්‍ර අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතෙහි විධිවිධානවලට අනුව විදේශ රැකියා ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති පුද්ගලයන් වෙත බලපත්‍ර නිකුත් කිරීමයි.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා බලපත්‍ර අංශය විසින් පහත කාර්යයන් ඉටු කරනු ලබයි.

- විදේශ රැකියා බලපත්‍ර නිකුත් කිරීම.
- විදේශ රැකියා නියෝජිත ආයතනවල මෙහෙයුම් සඳහා සුදුසු කාර්යාල පරිශ්‍ර අනුමත කිරීම.
- විදේශ රැකියා නියෝජිත ආයතනවල අනීත කාර්යසාධනය සලකා බලමින් බලපත්‍ර අලුත් කිරීම.
- බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ක්‍රමවේද පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් මහජනතාව සහ රාජ්‍ය ආයතන වෙත තොරතුරු හා උපදෙස් ලබා දීම.
- අධිකරණ කටයුතු සඳහා සාක්ෂි ලබා දීම.

වසරේදී සිදු කරන ලද කාර්යභාරයන්හි සාරාංශය

කාරණය	එකතුව
නිකුත් කල නව බලපත්‍ර සංඛ්‍යාව	59
අලුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	1,041
අවලංගු කරන ලද බලපත්‍ර සංඛ්‍යාව	16
අධිකරණවල පෙනී සිටි වාර ගණන	305





බලපත්‍රලාභීන් 642 ක් වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ශ්‍රවණාගාරයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පවත්වන ලදී.

අලෙවිකරණ අංශය

උපායමාර්ග අනුගමනය කරමින් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙනුවෙන් විදේශ රටවල රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අලෙවිකරණ අංශය පිහිටුවන ලදී. අලෙවිකරණ අංශය විසින් විදේශ රටවල රැකියා ප්‍රවණතා පිළිබඳව පර්යේෂණ සිදු කරමින් අත් පත්‍රිකා, බැනර්, විස්තර ගොනු සහ වාර්තාමය වීඩියෝ පට ආදිය ඇසුරින් මහජනතාව දැනුවත් කිරීමෙහි නියැළී සිටී.



ප්‍රවර්ධනාත්මක අන්තර්ගත කිහිපයකට උදාහරණ

2016 වසරේදී ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සහයෙන් දියත් කරන ලද ප්‍රවර්ධනාත්මක වැඩසටහන්

රට	කර්මාන්තය	සාධිත ප්‍රතිඵල
ඊශ්‍රායලය	සාත්තු සේවා	ස්කයිප් සම්මුඛ පරීක්ෂණයක් මගින් 26 දෙනෙකු තෝරා ගන්නා ලදී
ඉතාලිය	සාත්තු සේවා	අවස්ථා 60 ක් හිමි විය
පෝලන්තය	පලතුරු කැපීම ආශ්‍රිත කර්මාන්ත	අවස්ථා 30 ක් ලැබිණ. රැකියා ඇණවුම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙත යොමු කරන ලදී.





2016 නොවැම්බර් 16 සිට 18 දක්වා පැවැත්වුණු ප්‍රවර්ධනාත්මක වැඩසටහනක් අතරවාරයේදී ශ්‍රී ලාංකික දූත පිරිස ජෝර්දානයේ අම්මාන් නුවර පිහිටි ඇගළුම් කම්හලක් වෙත ගිය අවස්ථාව

ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාලවල සහයද සමගින් මෙම අංශය විසින් ඕස්ට්‍රේලියාව, කැනඩාව, ජර්මනිය, ස්විට්සර්ලන්තය, චීනය, බෙල්ජියම, ප්‍රංශය, නෙදර්ලන්තය, ජපානය සහ එක්සත් රාජධානිය යන රටවල ඇති රැකියා අවස්ථා පිළිබඳව සොයා බලන ලදී.

විදේශ රැකියා අවස්ථා පිළිබඳව වන විවිධ වෙබ් අඩවිවල ඇතුළත් තොරතුරු මත පදනම් වෙමින් මාසික වෙළෙඳපොල වාර්තා සකස් කරන ලද අතර ඉන් අනතුරුව සුදුසු පියවර ගැනීම සඳහා එකී වාර්තා ශ්‍රී ලංකා විදේශ රැකියා පුද්ගලික සමාගම වෙත යොමු කරන ලදී.

විවිධ පුහුණු වැඩසටහන් සම්පූර්ණ කළ අභ්‍යාසලාභීන් ලියාපදිංචි කිරීමටත්, ඔවුන්ව අන්තර්ජාල රැකියා බැංකුවේ ලියාපදිංචි කිරීමටත් බලපතුලාභී විදේශ රැකියා ආයතන වෙත විද්‍යුත් තැපෑල හරහා ඔවුන්ගේ තොරතුරු යොමු කිරීමටත් මෙම අංශය කටයුතු කරන ලදී.

2016 වසරේදී අලෙවිකරණ අංශය විසින් වෘත්තීය පුහුණුව අපේක්ෂා කළ 3,415 දෙනෙකු වෙනුවෙන් විදේශ රැකියා අවස්ථා පිළිබඳව තරුණ තරුණියන් දැනුවත් කිරීම අරමුණු කරගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහන් 34 ක්, ප්‍රංගම සේවා 08 ක් සහ වෙළෙඳ ප්‍රදර්ශන ආදිය පවත්වන ලදී.

වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 08 ක් පවත්වන ලද අතර ඒ සඳහා නිලධාරීන් 361 ක් සහභාගී විය.



2016 මැයි 27 දින නියගම පැවැත්වුණු දැනුවත් කිරීමේ වැඩසටහන



2016 අප්‍රේල් 29 දින මොරටුව බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්වුණු ප්‍රංගම සේවා වැඩසටහන

රැකියා අවස්ථා ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාවලිය



අන්තර්ජාල රැකියා බැංකුව

විදේශ රැකියා අවස්ථා ලඟාකර ගැනීමට අපේක්ෂා කරන පුද්ගලයන්ගේ පහසුව වෙනුවෙන් අලෙවිකරණ අංශය විසින් අන්තර්ජාලය පාදක කරගත් රැකියා බැංකු සේවාවක් සපයනු ලබයි. කාර්යාංශයේ වෙබ් අඩවියට පිවිසීමෙන් සෘජුවම මේ සඳහා ලියාපදිංචි වීමට අවස්ථාව සලසා ඇත. එසේ කිරීමට අපහසු අයට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය හෝ දිවයින පුරා ඇති වෙනත් ඕනෑම ශාඛා කාර්යාලයක් වෙත හෝ පිවිස සිය අයදුම්පත් භාර දිය හැක.

තම කර්මාන්තයේ අවශ්‍යතා අනුව විදේශ රැකියා ආයතනවලට රැකියා අපේක්ෂකයන් සොයා ගැනීමට ඉඩ සලසන අවකාශයක් ලෙසද මෙම වෙබ් අඩවිය ක්‍රියාත්මක වෙයි.

2016 වසරේදී රැකියා අපේක්ෂකයන් 4,629 මෙම අන්තර්ජාල රැකියා බැංකුවෙහි ලියාපදිංචි වූ අතර (නියෝජිතායතන විසින් එකී අයදුම්පත් 36,041 වතාවක් පරීක්ෂාකර තිබේ) ලියාපදිංචි රැකියා අපේක්ෂකයන් 596 දෙනෙකු සාර්ථක ලෙස විදේශ රැකියා සඳහා පිටත්ව යන ලදී.

බඳවාගැනීමේ අංශය

මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වන්නේ 2004 දී ශ්‍රී ලංකාව හා දකුණු කොරියාව අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමට අනුකූලව ශ්‍රමිකයන් එරටට පිටත් කර යැවීමේ කාර්යයට සහය දැක්වීම හෙයින් මෙය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරයි. එම ගිවිසුම 2005 දී අලුත් කරන ලදී. මෙහිදී යොදාගනු ලැබෙන ක්‍රියාවලියට විභාග පැවැත්වීම, ශ්‍රමිකයන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම හා පිටත්ව යෑම් සංවිධානය කිරීම ආදිය ඇතුළත් වේ.

බඳවාගැනීමේ අංශය පහත කාර්යභාරයන් ඉටු කරයි

තෝරාගැනීම	සම්මුඛ පරීක්ෂණ හා අවසන් පියවර	පිටත් කර යැවීම	සුභසාධන
• සාමාන්‍ය EPS TOPIC (PBT) විභාගය • විශේෂ EPS TOPIC (CBT) විභාගය • නැවත අයදුම් කිරීම • කුසලතා පරීක්ෂණය	• සමත් වූවන් සම්මුඛ පරීක්ෂණවලට ලක් කිරීම • වෛද්‍ය, පොලිස් හා අනෙකුත් අවශ්‍ය වාර්තා සලකා බැලීම • SPAS වෙත දත්ත ඇතුළත් කිරීම	• ලේඛන සියල්ල සම්පාදනය කිරීම • පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම • වීසා ලබා ගැනීම	• පැමිණිලි විසඳීම • විශ්‍රාමික ප්‍රතිලාභ ලබා ගැනීමට සහය දැක්වීම • රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමට සහය දැක්වීම

2016 වසරේ ජයග්‍රහණ

බඳවාගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම

රැකියා අපේක්ෂිතයන් විදෙස් රැකියා සඳහා පිටත් කර යැවීමට ගත වූ කාලය දින 20 කින් අඩු කිරීමට මෙම අංශය පියවර ගන්නා ලදී. SPAS හි සිටින සෑම රැකියා අපේක්ෂකයෙකු හටම කල්තබා වලංගු පොලිස් වාර්තාවක් ළඟ තබා ගන්නා ලෙසත් පිටත්ව යාමට පෙර පුහුණුව ලබා ගන්නා ලෙසත් උපදෙස් දෙන ලදී. කිසිදු ප්‍රමාදයකින් තොරව නිවැරදි හා විශ්වාස කළ හැකි වෛද්‍ය වාර්තා ලබා ගැනීම සඳහා ශ්‍රී ජයවර්ධනපුර රෝහල සහ ලංකා රෝහල තෝරා ගන්නා ලදී. එසේම, එම රෝහල් දෙක සමගම මෙම අංශය සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට කටයුතු කර ඇත. අභිනවයෙන් පිහිටුවන ලද CBT මධ්‍යස්ථානයෙහි පරිගණක පාදක කරගත් පුහුණු වැඩසටහන් 04 ක් පවත්වන ලදී. පරිගණක 40 ක් ඇතුළු පහසුකම් රැසක්ම මෙම මධ්‍යස්ථානයෙහි ඇති Employment Permit System (EPS-TOPIC) විභාගයක් ධීවර කර්මාන්තය වෙනුවෙන් පළමු වරට පවත්වන ලද්දේද 2016 වසරේදීය.

සේවක අවසර පද්ධතිය (EMPLOYMENT PERMIT SYSTEM (EPS)) යටතේ ප්‍රවේශ අවස්ථා ලබා දීම

මධ්‍යස්ථාන 15 ක් හරහා රැකියා අපේක්ෂකයන් හට ප්‍රවේශ අවස්ථා 26,140 ක් පමණ ලබා දෙන ලදී. ධීවර කර්මාන්තයේ රැකියා සඳහා පුද්ගලයින් 3,776 දෙනෙකු ප්‍රවේශ අවස්ථා ලබා සිටි අතර 22,352 දෙනෙකු නිෂ්පාදන ක්ෂේත්‍රයේ රැකියා අවස්ථා ලබා ඇත.

මධ්‍යස්ථාන	නිකුත් කළ සංඛ්‍යාව	ප්‍රතික්ෂේපිත සංඛ්‍යාව
අතුරුගිරිය	2,776	01
මාතර	2,962	-
තංගල්ල	2,825	01
රත්නපුර	3,233	04
මහනුවර	3,085	-
කුරුණෑගල	1,899	01
අනුරාධපුර	629	01
ගාල්ල	2,589	02
කඩවත	2,612	-
සීදුව	1,125	02
පොලොන්නරුව	940	-
බදුල්ල	1,230	-
ත්‍රිකුණාමලය	154	-
වව්නියාව	79	-
යාපනය	02	-
එකතුව	**26,140**	**12**

නිකුත් කළ විභාග ප්‍රවේශ පත්‍ර පිළිබඳ තොරතුරු

ශ්‍රී ලංකාව 2004 වසරේදී කොරියානු ජනරජය සමග අවබෝධතා ගිවිසුමකට එළැඹී අතර එය 2015 දී අලුත් කරන ලදී. එම ගිවිසුමට අනුව, විභාග පැවැත්වීම, පුහුණු කිරීම සහ රැකියා සඳහා පිටත් කර යැවීම ඇතුළත් සමස්ථ ක්‍රියාවලියම මෙම අංශය වෙත පවරා ඇත.

බඳවාගැනීම් අංශයේ කාර්ය පරාසය





පසුගිය වසර 5 තුළ අත්කරගත් විශේෂ සාධනයන් (2011-2015)

2015

විශේෂ විශේෂ ප්‍රවීණතා පරීක්ෂණ 04 ක් හා සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ 03 ක් පවත්වන ලදී.

2014

පරිගණක ආශ්‍රිත විභාග පැවැත්වීමේ පරීක්ෂණාගාර පිහිටුවන ලද අතර පළමු වතාවට CBT විභාගය පවත්වන ලදී.

2012

නැවත පිටත්වීම් ක්‍රමය හඳුන්වා දෙන ලදී.
විදේශ රටවලට ශ්‍රමිකයන් සැපයීමෙහි නිරත රටවල් 15 ක් අතරින් ශ්‍රමිකයන් විදේශගත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ප්‍රශස්ත ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් විශිෂ්ටතා සම්මානය ශ්‍රී ලංකාවට හිමිවිය.

2011

09 වන කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය සාර්ථකව පැවැත්වීම වෙනුවෙන් ශ්‍රී ලංකාව සම්මානයට පාත්‍ර විය.
කොරියානු ජනරජය සමග විශේෂ අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලද අතර සිය කොන්ත්‍රාත් කාලය සාර්ථකව අවසන් කළ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් හට පෙරළා මෙරටට පැමිණීමෙන් වසර 05 ක් ඇතුළත විශ්‍රාමික ප්‍රතිලාභ ලබා ගැනීමට සහය ලබා දෙන ලදී.

2011 සිට 2015 දක්වා කොරියානු භාෂා ප්‍රවීණතා විභාග ප්‍රවේශපත් නිකුත් කිරීම

වර්ෂය	නිකුත් කරන ලද අයදුම්පත් ගණන		එකතුව	සමත් වූ පිරිස		එකතුව
	සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	විශේෂ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය		සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	විශේෂ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	
2011	50,733	-	50,733	11,213	-	11,213
2012	34,261	1,459	35,720	4,392	1,146	5,538
2013	20,498	-	20,498	2,531	-	2,531
2014	14,000	5,127	19,127	1,013	1,576	2,589
2015	19,893	1,861	21,754	7,157	1,071	8,228
එකතුව	**139,385**	**8,447**	**147,832**	**26,306**	**3,793**	**30,099**

2011 සිට 2015 දක්වා කාලය තුළ දකුණු කොරියානු රැකියා සඳහා ලැබුණු ගිවිසුම්

වර්ෂය	ලැබුණු රැකියා ගිවිසුම්		යළි අයදුම් කිරීම්	එකතුව
	සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	විශේෂ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය		
2011	5,674	-	-	5,674
2012	4,621	-	223	4,844
2013	4,124	767	524	5,415
2014	3,755	661	115	4,531
2015	4,086	895	546	5,527
එකතුව	**22,260**	**2,323**	**1,408**	**26,391**



කොරියානු ජනරජය

රැකියා බලපත්‍ර ක්‍රමය (EPS) යටතේ වාර්ෂිකව ශ්‍රී ලාංකිකයන් 5,000 කට අධික පිරිසක් සඳහා කොරියානු ජනරජය මඟින් රැකියා අවස්ථා සැපයේ. මෙය ශ්‍රී ලාංකික තරුණ ජනගහණය සඳහා ඉතා හිතකර රැකියා ගමනාන්තයකි. මේ වන විට 25,000 කට අධික ශ්‍රී ලාංකිකයන් පිරිසක් මෙම රටෙහි රැකියා අවස්ථා උදාකරගෙන ඇත.

පෙර විගමනික පුහුණුව (2011-2015)

වර්ෂය	පුහුණු ලාභීන්
2011	5,548
2012	4,667
2013	3,903
2014	3,505
2015	3,277
එකතුව	**20,900**



පුහුණු මධ්‍යස්ථානයේදී ශාරීරික යෝග්‍යතාව ඉහළ නැංවීම



කොරියානු භාෂාව හා සංස්කෘතිය පිළිබඳ දැනුවත් කිරීම

දකුණු කොරියාවේ රැකියා සඳහා පිටත්ව යාම් (2011-2015)

වර්ෂය	පිටත්ව ගිය පිරිස			එකතුව
	සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	විශේෂ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	යළි අයදුම් කිරීම්	
2011	5,346	-	-	5,346
2012	4,101	-	107	4,208
2013	3,592	714	523	4,829
2014	3,691	430	185	4,306
2015	3,706	876	425	5,007
එකතුව	**20,165**	**1,866**	**1,229**	**23,260**



විධිමත් ක්‍රමයකට අනුව ශ්‍රමිකයන් ගුවන් තොටුපලින් පිටත්ව යන අයුරු



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේදී කොරියානු රැකියා ලාභීන් වෙනුවෙන් පැවැත්වුණු දැනුවත් කිරීමේ වැඩසටහනක්

දකුණු කොරියාව බලා පිටව ගිය ශ්‍රමිකයන් රැකියා කාණ්ඩවලට අනුව

කාණ්ඩය	පිටත්ව ගිය පිරිස				
	2011	2012	2013	2014	2015
නිෂ්පාදන	5,339	3,671	4,397	3,786	3,514
ධීවර	-	549	425	437	1,319
රථ වාහන සම්බන්ධව	07	-	-	-	-
කෘෂිකාර්මික හා පශු සම්පත්	03	-	02	03	03
සේවා	-	01	05	01	01
ඉදිකිරීම්	-	-	-	80	170
එකතුව	**5,349**	**4,221**	**4,829**	**4,307**	**5,007**

කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය

කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය 2016 ඔක්තෝබර් 1 සහ 2 දිනවල මධ්‍යස්ථාන 04 ක් ආශ්‍රිතව පවත්වන ලද අතර ඉන් අනතුරුව ප්‍රවීණතා පරීක්ෂණයක්ද පවත්වන ලදී. අනිවාර්ය නිපුණතා පරීක්ෂණය 2016 නොවැම්බර් 18 සිට 25 දක්වා අතරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී පවත්වන ලදී. අයදුම්කරුවන් 3,440 දෙනෙකු මෙම පරීක්ෂණයට පෙනී සිටි අතර ඉන් 3,514 ක් සුදුසුකම් ලබන ලදී. මෙයින් අයදුම්කරුවන් 2,404 දෙනෙකු නිෂ්පාදන අංශයේ රැකියා සඳහාද, 1,038 ක් ධීවර කර්මාන්තය ආශ්‍රිත රැකියා සඳහාද අයදුම් කරන ලදී. මේ අතරින් නිෂ්පාදන අංශයේ 1,502 ක් හා ධීවර කර්මාන්තයේ රැකියා සඳහා අයදුම් කළ 505 ක් කොරියානු රැකියා සඳහා සුදුසුකම් ලබාගන්නා ලදී.

2016 වසරේදී පරිගණක පාදක කරගත්, අදියර 4 ක් යටතේ පැවැත්වුණු කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය වෙනුවෙන් ප්‍රවේශපත් 3,590 ක් නිකුත් කරන ලද අතර ඉන් 1,618 දෙනෙකු සමත්විය.

EPS ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම

2016 දී දකුණු කොරියාවේ රැකියා අවස්ථා සඳහා ගිවිසුම් 6,915 ක් නිකුත් කරන ලද අතර එයින් 6,038 ක් ම නිකුක් කරන ලද්දේ සාමාන්‍ය EPS TOPIC ක්‍රමය යටතේය. නැවත අයදුම් කිරීමේ කාණ්ඩය යටතේ ගිවිසුම් 877 ක් නිකුත් කරන ලද අතර අයදුම්කරුවන් 849 ක් අදාළ ගිවිසුම්වලට අත්සන තබන ලදී.

2016 දී දකුණු කොරියානු රැකියා සඳහා නිකුත් කළ හා අත්සන් තබන ලද ගිවිසුම්



රැකියා සඳහා දකුණු කොරියාව බලා පිටත්ව යාම්

අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම යටතේ අයදුම්කරුවන් 6,635 දෙනෙකු මෙම සමාලෝචනයට ලක් වන කාල සීමාව තුළ රැකියා සඳහා දකුණු කොරියාව බලා පිටත්ව ගොස් ඇත. එයින් 4,918 දෙනෙකු හට සාමාන්‍ය EPS TOPIC ක්‍රමය යටතේද, 813 ක් හට විශේෂ EPS TOPIC යටතේද රැකියා ලබා දුන් අතර අයදුම්කරුවන් 904 කට රැකියා අවස්ථා හිමි වූයේ යළි අයදුම් කිරීමේ ක්‍රමය යටතේය.

2016 වසරේදී රැකියා සඳහා දකුණු කොරියාව බලා පිටත්ව යාම්



දැනුවත්භාවය හා ධාරිතා ඉහළ නැංවීම

දකුණු කොරියානු රැකියා වෙළෙඳපොල ආශ්‍රිතව විශාල බලපෑමක් ඇති කිරීම සඳහා මෙම අංශය විසින් පියවර රැසක් ගන්නා ලදී. First point system EPS-TOPIC විභාග සඳහා පෙනී සිටීමට නියමිතව සිටි කොරියානු රැකියා අපේක්ෂිතයන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් මතුගම, ගාල්ල, රත්නපුර, කුරුණෑගල හා මහනුවර පුහුණු මධ්‍යස්ථාන ආශ්‍රිතව පවත්වන ලද අතර අති විශාල පිරිසක් ඊට සහභාගී විය. මෙම අංශයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන්ද විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර එහි අරමුණ වූයේ වඩා ඵලදායී ලෙස සේවා ලබා දීම ඉහළ නැංවීමයි. කොරියානු මානව සම්පත් ආයතනයේ (HRDS) අධ්‍යක්ෂතුමා විසින් එය පවත්වන ලදී. කොරියාවේ රැකියා කාලය නිම කොට පෙරළා ශ්‍රී ලංකාව බලා එන ශ්‍රමිකයන් අතර ආයෝජන අවස්ථා, කර්මාන්ත අංශයේ රැකියා අවස්ථා සහ සුළු පරිමාණ අපනයන කටයුතු ආදිය පිළිබඳ අවබෝධය පුළුල් කරනු පිණිස තවත් විශේෂ වැඩසටහනක් පවත්වන ලදී.

විගමණික ශ්‍රමිකයන්ගේ සුභසාධනය

කොරියානු ජනරජයේ රැකියාවල නිරත වී සිටින ශ්‍රී ලාංකිකයන්ගේ සුභසාධනය කෙරෙහි බඳවාගැනීම් අංශය විශේෂ අවධානයක් යොමු කරයි. දකුණු කොරියාවේ රැකියා සිදු කර නැවත මෙරටට පැමිණි ශ්‍රමිකයන් 284 ක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සිට විශ්‍රාමික ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා උපකාර ලබා දෙන ලදී. සේවා පාරිතෝෂික යෝජනා ක්‍රමයට (TEGICOM) අයදුම් කිරීමට අවශ්‍ය සහය ශ්‍රමිකයන් 16 දෙනෙකු හට ලබා දෙන ලදී. මේ අතර, ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන්ගේ පැමිණිලි 214 ක් විසඳන ලද අතර රු. 79,015,895 ක වටිනාකමකින් යුතු ණය පහසුකම් ලබා ගැනීම සඳහා මෙම අංශය 773 දෙනෙකු වෙත සහයෝගය ලබා දී ඇත.





අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී ප්‍රවේශපත්‍ර නිකුත් කළ අවස්ථාව

2016 ඔක්තෝබර් 01 හා 02 යන දිනවල රාජකීය විද්‍යාලය, අශෝක විද්‍යාලය, තර්ස්ටන් විද්‍යාලය හා ඉසිපතන විද්‍යාලය ආශ්‍රිත විභාග මධ්‍යස්ථාන 04 ක දී කොරියානු භාෂා ප්‍රවීණතා විභාගය හා ඊට සමගාමීව භාෂා කුසලතා පරීක්ෂණය පැවැත්වුණු අතර අයදුම්කරුවන් 557 ක් භාෂා කුසලතා පරීක්ෂණය සඳහා පෙනී සිටියහ. එය අනිවාර්ය පරීක්ෂණයක් නොවිණි. ඉන් පසුව 2016 නොවැම්බර් 18-25 අතර කාලයේදී අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේදී අනිවාර්ය නිපුණතා පරීක්ෂණයක්ද පැවැත්විණි.



නිපුණතා පරීක්ෂණයේදී බර හා උස මැනීම





ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කිරීම

විශේෂ (පරිණක පාදක) කොරියානු භාෂා පරීක්ෂණවල විස්තර

පරිගණක ආශ්‍රිත පරීක්ෂණය (CBT)	පැවැත්වුණු දින	නිකුත් කළ ප්‍රවේශපත් ගණන	සමත් වූවන්
CBT 01	01, 02 හා 03 පෙබරවාරි	652	347
CBT 02	27, 28 හා 29 අප්‍රේල්	833	432
CBT 03	25, 26 හා 27 ජූලි	1,227	619
CBT 04	18, 19 හා 20 ඔක්තෝබර්	878	220

කොරියානු ජාතික විශ්‍රාමික ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා අයදුම් කිරීමේ ප්‍රගතිය

කොරියාවේ රැකියාවල නිරතව සිට පෙරළා ශ්‍රී ලංකාව බලා පැමිණි ශ්‍රමිකයන් හට ශ්‍රී ලංකාවේ සිට විශ්‍රාමික ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමට අවශ්‍ය සහය ලබා දෙන ලදී. 2016 වසරේදී සහය ලබා දුන් අයදුම්පත් ප්‍රමාණය 2,684 ක් වූ අතර ඒ සියල්ලම සඳහා එකී ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් හිමි විය.

සේවා පාරිතෝෂික යෝජනා ක්‍රමය (TEGICOM)

මෙම පහසුකම ශ්‍රී ලංකාවට පැමිණි ශ්‍රමිකයන් 16 දෙනෙකු වෙත ලබා දෙන ලදී.

පැමිණිලි විභාග කිරීම

- පැමිණිලි 221 ක් අංශය වෙත ලැබිණි.
- පැමිණිලි 214 ක් විසඳන ලදී.
- පැමිණිලි 07 ක් වසර අවසානය වන විට නොවිසඳී තිබිණි.

ණය පහසුකම් ලබා දීම

බැංකුව	ණය පහසුකම් සඳහා යොමු කළ සංඛ්‍යාව	ණය ලබා දුන් සංඛ්‍යාව	ණය මුදල (රු).
ලංකා බැංකුව	663	447	45,867,946
ජාතික ඉතිරිකිරීමේ බැංකුව	148	76	7,720,858
මහජන බැංකුව	36	18	1,851,460
සෙලාන් බැංකුව	303	232	23,575,631
එකතුව	**1150**	**773**	**79,015,895**

රැකියා බලපත්‍ර ක්‍රමය යටතේ දකුණු කොරියාවේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයන් බඳවා ගැනීම

දකුණු කොරියාවේ රැකියා සඳහා නිකුත් කළ සේවා ගිවිසුම්

රැකියා සඳහා පිටත්වන ක්‍රමවේදය	එකතුව
සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	5,144
යළි අයදුම් කිරීම්	877
විශේෂ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	894
එකතුව	**6,915**

දකුණු කොරියාවේ රැකියා ලබා ගැනීම සඳහා රැකියා අපේක්ෂකයන් විසින් අත්සන් තබන ලද සේවා ගිවිසුම්

රැකියා සඳහා පිටත්වන ක්‍රමවේදය	එකතුව
සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය හා විශේෂ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	5,810
නැවත අයදුම් කිරීම්	849
එකතුව	**6,659**

රැකියා අපේක්ෂකයන් විසින් ප්‍රතික්ෂේප කරන ලද සේවා ගිවිසුම්

රැකියා සඳහා පිටත්වන ක්‍රමවේදය	එකතුව
සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය හා විශේෂ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	222
නැවත අයදුම් කිරීම්	25
එකතුව	**247**

රැකියා සඳහා පිටත්ව යාම්

රැකියා සඳහා පිටත්වන ක්‍රමවේදය	එකතුව
සාමාන්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	4,918
යළි අයදුම් කිරීම්	813
විශේෂ භාෂා ප්‍රවීණතා පරීක්ෂණය	904
එකතුව	**6,635**

රැකියා බලපත්‍ර ක්‍රමය පිළිබඳව පවත්වන ලද පුහුණු වැඩසටහන්

දිනය	මධ්‍යස්ථානය
11.05.2016	මතුගම පුහුණු මධ්‍යස්ථානය
11.05.2016	ගාල්ල පුහුණු මධ්‍යස්ථානය
12.05.2016	රත්නපුර පුහුණු මධ්‍යස්ථානය
13.05.2016	කුරුණෑගල පුහුණු මධ්‍යස්ථානය
13.05.2016	මහනුවර පුහුණු මධ්‍යස්ථානය



කුරුණෑගල පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන



මාතර පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන



මතුගම පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන



මහනුවර පැවැති දැනුවත් කිරීමේ වැඩසටහන



රත්නපුර පැවැති පුහුණු වැඩසටහන

බඳවාගැනීම් අංශයේ නිලධාරීන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන

වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීම ඉලක්ක කරගත් විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකාවේ කොරියානු මානව සම්පත් ආයතනයේ (HRDS) අධ්‍යක්ෂවරයා විසින් පවත්වන ලදී.






කොරියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි කොරියානු රැකියා ලාභීන් සඳහා සුහඳ හමුවක් පැවැත්වීම

කොරියාවේ රැකියාවල නිරතව සිට පෙරළා ශ්‍රී ලංකාව බලා පැමිණි ශ්‍රමිකයන් වෙනුවෙන් සුහඳ හමුවක් 2016.12.08 දින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ශ්‍රවණාගාරයේදී පැවැත්වූ අතර පහත කෙෂ්ත්‍ර කෙරෙහි එහිදී අවධානය යොමු විය:

- ආයෝජන අවස්ථා
- කර්මාන්ත අංශයේ රැකියා අවස්ථා
- සුළු පරිමාණයේ අපනයන කටයුතු








ඕමානය

ඕමානයද ශ්‍රී ලාංකිකයන් හට රැකියා අවස්ථා රැසක් ලබා දෙන මැද පෙරදිග කලාපීය රටක් වන අතර ශ්‍රී ලාංකික වෘත්තිකයෝ රැසක් එරට සිටිති. 2016 වසරේදී රැකියා අවස්ථා සඳහා ශ්‍රී ලාංකිකයන් 2,500 කට අධික පිරිසක් ඕමානය වෙත ගොස් ඇත.

විශේෂ විමර්ශන අංශය

1994 අංක 04 පනත මගින් සංශෝධිත 1985 අංක 21 දරන පනතේ විධිවිධාන යටතේ කැබිනට් පත්‍රිකාවක් හරහා පොලිස් නිලධාරීන් අනුයුක්ත කිරීමේ පදනම මත ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශය පිහිටුවන ලදී.

විශේෂ විමර්ශන අංශයේ ප්‍රධාන කාර්යභාරයන්

පහත කාරණාවලට සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂ විමර්ශන අංශයේ නිලධාරීන්ට බාධා සිදු වන පරිදි කටයුතු කරන පුද්ගලයන් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු මෙහෙයවීමේත්, ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමේත් බලය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පවරා තිබේ:

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් නොමැතිව පුද්ගලයන් විදේශ රැකියා සඳහා බඳවා ගැනීම, බඳවාගැනීමට උත්සාහ ගැනීම හෝ විදේශ රැකියා ලබා දීම සිදු කරන බවට චෝදනා ලබන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම.
- උසාවි නියෝගයකින් තොරව චූදිතයන් වටලා අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය බලතල ඉහත පනතේ 62 වගන්තිය යටතේ මෙම අංශයේ නිලධාරීන් වෙත බලතල පවරා ඇත.
- කවර හෝ බලපත්‍රලාභියෙකු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අනුමත කරන ලද ගාස්තුවක් හැර වෙනත් කවර හෝ ගාස්තුවක් හෝ අමතර අයකිරීමක් සිදු කරන්නේ නම් අධිකරණ නියෝගයකින් තොරව එකී මුදල් ප්‍රමාණය නැවත අයකර ගෙන චූදිතයන් අත්අඩංගුවට ගැනීම සඳහා අවශ්‍ය විමර්ශන කටයුතු සහ නෛතික පියවර ගැනීමට බලතල ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ නිලධාරීන් වෙත පවරා ඇත.
- විදේශ රැකියා අවස්ථා ලබා දීමට අදාළව කවර හෝ ආකාරයක කුඩ ලේඛන සැකසීමක් සිදු ව ඇත්නම් ශ්‍රී ලංකා විදේශ රැකියා නියුක්ති කාර්යාංශ පනතේ 63 වගන්තියෙහි නියම කර ඇති පරිදි අධිකරණ නියෝගයකින් තොරව එවැනි පුද්ගලයන් අත්අඩංගුවට ගැනීමට බලතල මෙම අංශයේ නිලධාරීන් වෙත පවරා ඇත.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලබා ගත් පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව වෙළඳ දැන්වීම් හා ප්‍රචාරණ දැන්වීම් පළ කරන නියෝජිතයන්, ප්‍රනකාශකයන් හෝ මුද්‍රණ ශිල්පීන් අධිකරණ නියෝගයකින් තොරව අත්අඩංගුවට ගැනීම.
- සිතාසි යොමු කිරීම හා චූදිතයන්ට එරෙහිව අධිකරණය විසින් නිකුත් කරනු ලබන වරෙන්තු ක්‍රියාවට නැංවීම.
- විදේශ රැකියා කර්මාන්තයට අදාළ පොලිස් නිලධාරීන් හා අනෙකුත් රාජ්‍ය නිලධාරීන් අතර ඉහත කී පනතේ විධිවිධාන පිළිබඳව අවබෝධය පුළුල් කිරීම සඳහා වැඩමුළු සංවිධානය කිරීම.
- වෙස්වලාගත් නිලධාරීන්, විශේෂ ඔත්තුකරුවන් සහ අවශ්‍ය නම් චූදිතයන් හට සේවය සපයන පුද්ගලයන්ගේ සහය ලබා ගනිමින් ප්‍රවේක්ෂණ සිදු කිරීම තුළින් තොරතුරු රැස් කිරීම.

2016 වසරට අදාළ කාර්යසාධන ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකම්	එකතුව
ලැබුණු පැමිණිලි සංඛ්‍යාව	2,080
විදේශ රැකියා ව්‍යාපාරවල නිරතව සිටින බලපත්‍ර නොලත් පුද්ගලයන්ට එරෙහිව ලැබුණු පැමිණිලි සංඛ්‍යාව	973
විසඳූ පැමිණිලි සංඛ්‍යාව	3,327
සාර්ථක ලෙස ඉටු කළ වගකීම්	177
නීති අංශය වෙත යවන ලද පැමිණිලි සංඛ්‍යාව	125
සිතාසි නිකුත් කිරීම හා වරෙන්තු ක්‍රියාවට නැංවීම	661
දැනුවත් කිරීමේ වැඩසටහන්	02

පුහුණු අංශය - ගෘහස්ථ

පුහුණු අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ විදේශ රැකියා අවස්ථා සඳහා අවශ්‍ය නිපුණතා පිරිපුන්, තරගකාරී හා කාර්යක්ෂම ශ්‍රමිකයන් නිර්මාණය කිරීමට කැප වීමයි. මෙම අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු අංශය විසින් පසු-ප්‍රතිචාර සහ සංවර්ධන කටයුතුවලට අදාළව ප්‍රමිති පාලන විධිවිධාන පවත්වාගෙන යයි. දීප ව්‍යාප්ත පුහුණු මධ්‍යස්ථාන ජාලය නිරීක්ෂණය කරමින් ඊට අදාළ අධීක්ෂණ කටයුතු මෙහෙයවන අතරම පුහුණු මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය පුහුණු උපකරණ ලබා දීම හා ශ්‍රමිකයන් රැකියා සඳහා පිටත්ව යාමට පෙර පුහුණු වැඩසටහන් හා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම හා පුහුණු උපකාරක ද්‍රව්‍ය සකස් කිරීම හා සමාලෝචනය කිරීමද මෙම අංශය විසින් සිදු කරනු ලබයි. තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිසමේ අනුමැතිය ලබා ගැනීම හා පුහුණු මධ්‍යස්ථාන සඳහා ප්‍රමිති අනුමැතීන් ලබා දීමද මෙම අංශයේ අධීක්ෂණය යටතේ සිදු කෙරෙයි.

2016 වසරේදී ජාතික වෘත්තීය සුදුසුකම් ඇගයීම සඳහා මෙම අංශය යටතේ පවතින පුහුණු මධ්‍යස්ථාන වෙත පැවරුණු අතර පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 06 ක් පවත්වන ලදී. මෙම පුහුණු වැඩසටහන් අතරතුරදී විදෙස් ශ්‍රමිකයන්ගේ ධාරිතා සහ පුහුණුකරුවන් වෙනුවෙන් වන පුහුණු වැඩසටහන් ඉහළ නැංවීම අරමුණු කරගෙන ළමා ආරක්ෂණය, රූපලාවණ්‍ය ශිල්පය, මූල්‍ය සාක්ෂරතාව, කාන්තා ශ්‍රමිකයින්ගේ හිමිකම්, ගෘහස්ථ හිංසනය පිටුදැකීම සහ HIV / AIDS තුරන් කිරීම වැනි මාතෘකා ආවරණය කෙරිණි.



අම්පාර පුහුණු මධ්‍යස්ථානයේ අධීක්ෂණ කටයුතු



පන්නිපිටිය පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන



මතුගම පුහුණු මධ්‍යස්ථානය වෙත ගිය නිරීක්ෂණ චාරිකාව

සිදු කරන ලද පුහුණු වැඩසටහන්

පුහුණු පාඨමාලාව	කාල සීමාව	අවධානය යොමු කළ අංශ	පුහුණු මධ්‍යස්ථාන
ගෘහ සේවිකා	දින 40	මැද පෙරදිග	තංගල්ල, පන්නිපිටිය, රත්නපුර, මහනුවර, දඹුල්ල, පොලොන්නරුව, කුරුණෑගල
ගෘහ සේවිකා	දින 35	යුරෝපය, පෙරදිග ආසියාව, සයිප්‍රස්, සිංගප්පූරුව, හොංකොං, මැලේසියාව, මාලදිවයින	මතුගම
සාන්තු සේවා පාඨමාලාව	දින 35		සීදුව, කුරුණෑගල
RPL පුහුණු වැඩසටහන	දින 10		මහනුවර, පන්නිපිටිය, කුරුණෑගල
භාෂා සාක්ෂරතාව	දින 18	සිංහල, දමිළ, ඉංග්‍රීසි	රත්නපුර, මහනුවර

2016 වසරේදී පවත්වන ලද පුහුණු වැඩසටහන්වලට සාපේක්ෂව පුහුණුව ලැබූ පිරිස

වැඩසටහන	එකතුව
මැදපෙරදිග (දින 21)	**270**
ගෘහ සේවක - සයිප්‍රස්	**210**
ගෘහ සේවක - සිංගප්පූරුව / හොංකොං	**118**
රැකියා නියුක්තිකයන් සඳහා වන පාඨමාලාව - මැද පෙරදිග	**436**
රැකියා නියුක්තිකයන් සඳහා වන පාඨමාලාව - සයිප්‍රස්	**37**
රැකියා නියුක්තිකයන් සඳහා වන පාඨමාලාව - මැද පෙරදිග	**2,331**
ගෘහ සාන්තු සේවා පාඨමාලාව - ඊශ්‍රායලය	**820**
ගෘහ සාන්තු සේවා පාඨමාලාව - යුරෝපය හා පෙරදිග ආසියාව	**377**
ගෘහ සේවක - RPL	**381**
සාක්ෂරතාව - සිංහල	**79**
සාක්ෂරතාව - දමිළ	**99**
සාක්ෂරතාව - ඉංග්‍රීසි	**0**
මූලික ඉංග්‍රීසි - 1 මට්ටම	**11**

2012 සිට 2016 දක්වා පුහුණු අංශයේ ප්‍රගති වාර්තාව

වර්ෂය	ක්‍රියාකාරකම	විස්තර	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ පිරිස
2012	ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්	මැද පෙරදිග	1,517	31,957
		ඊශ්‍රායලය - දින 28	49	1,080
		ඊශ්‍රායලය - දින 15	24	520
		සයිප්‍රස්	75	1,484
		සිංගප්පූරුව	18	320
		දින 07	184	4,268
		දින 05	1,600	45,292
		සාක්ෂරතාව	250	5,980



කටාර්

කටාර් යනු ශ්‍රී ලාංකිකයන් අති විශාල පිරිසක් වෙත සතුටුදායක ජීවන මාර්ගයන් උදාකර දී ඇති රටකි. 2016 වසරේදී ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් 30,000 කට අධික පිරිසක් රැකියා අවස්ථා සඳහා කටාර් බලා පිටත් වී ඇති අතර ඒ අනුව එහි සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව 145,000 දක්වා ඉහළ ගොස් ඇත. මෙම ශ්‍රමිකයන් අතරින් බහුතරය පිරිමි ශ්‍රමිකයන් වේ.

වර්ෂය	ක්‍රියාකාරකම	විස්තර	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ පිරිස
2013	ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්	මැද පෙරදිග	1,029	18,054
		ඊශ්‍රායලය - දින 28	43	1,122
		ඊශ්‍රායලය - දින 15	24	475
		සයිප්‍රස්	31	593
		සිංගප්පූරුව	30	563
		දින 07	113	3025
		දින 05	1,400	45,565
		සාක්ෂරතාව	94	1,993

වර්ෂය	ක්‍රියාකාරකම	විස්තර	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ පිරිස
2014	ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්	මැද පෙරදිග		11,225
		ඊශ්‍රායලය - දින 28	41	1,109
		ඊශ්‍රායලය - දින 15	03	77
		සයිප්‍රස්	25	538
		සිංගප්පූරුව	19	359
		දින 07	1,430	42,810
		දින 05	63	712

වර්ෂය	ක්‍රියාකාරකම	විස්තර	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ පිරිස
2015	ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්	මැද පෙරදිග (දින 21)	470	7,686
		සාක්ෂරතාව (දින 18)	54	731
		සිංගප්පූරුව (දින 30)	15	248
		ඊශ්‍රායලය (දින 30)	40	926
		සයිප්‍රස් (දින 30)	24	534
		දින 07	66	756
		ඉතාලිය	02	58
		Headway ඉංග්‍රීසි භාෂා පාඨමාලාව	60	1,589

වර්ෂය	ක්‍රියාකාරකම	විස්තර	වැඩසටහන් සංඛ්‍යාව	පුහුණුව ලැබූ පිරිස
2016	ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන් සඳහා පැවැත්වූ පුහුණු වැඩසටහන්	මැද පෙරදිග	139	2,601
		ගෘහ සේවක - සිංගප්පූරුව / හොංකොං / මැලේසියාව	07	118
		ගෘහ සේවක - සහකාර - සයිප්‍රස්	14	310
		ගෘහ සේවක - යුරෝපය හා පෙරදිග ආසියාව	19	377
		ගෘහස්ථ සාත්තු සේවක පාඨමාලාව - ඊශ්‍රායලය	42	846
		ගෘහ සේවක - RPL	67	854
		මූලික ඇංග්‍රීසි 1 මට්ටම	01	11
		සාක්ෂරතාව	13	178

පුහුණු අංශය - ගෘහස්ථ නොවන

කුසලතා පිරිපුන් විදෙස් ශ්‍රමිකයන් සඳහා නිරන්තරයෙන් ඉහළ නගින ඉල්ලුම ඉටු කරනු පිණිස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පුහුණු අංශය මගින් විදේශ රැකියා කර්මාන්තය තුල පවතින අවශ්‍යතා සම්පූර්ණ කිරීමේ අරමුණින් ඔවුන්ගේ කුසලතා වර්ධනය කරනු වස් විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතරම කාර්යාංශය සතු දීප ව්‍යාප්ත පුහුණු මධ්‍යස්ථාන ජාලය හරහා පාඨමාලා සම්පූර්ණ කරන රැකියා අපේක්ෂකයන් හට සහතික ලබා දීම සිදු කෙරේ.

ගෘහස්ථ නොවන පුහුණු අංශයේ කාර්යභාරයන්

- රැකියා බලපත්‍ර ක්‍රමය (EPS) යටතේ දකුණු කොරියාවේ රැකියා අපේක්ෂා කරන්නන් සඳහා වන කොරියානු භාෂා විභාගය සමත් වූවන් රැකියා සඳහා පිටත්ව යාමට පෙර පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ගෘහස්ථ නොවන සේවා අංශවලින් රැකියා බලාපොරොත්තු වන පුද්ගලයන් සඳහා දින 05 පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ඊශ්‍රායලයේ කෘෂිකාර්මික රැකියා අවස්ථා සඳහා තෝරාගන්නා ලද ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් රැකියා සඳහා පිටත්ව යාමට පෙර පුහුණුව ලබා දීම.
- විදෙස් රැකියා බලාපොරොත්තුවෙන් සිටින්නන්ගේ භාෂා කුසලතා වර්ධනය කරනු පිණිස (ඉතාලි, ඉංග්‍රීසි හා ජපන්) විශේෂ භාෂා පාඨමාලා පැවැත්වීම.
- ජාතික මට්ටමේ පිළිගත් ආයතන (TVEC, VTA, NITA) සමග එක්ව ජාත්‍යන්තර ප්‍රමිතීන් හඳුන්වා දීම මගින් තෝරාගත් අංශවලට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් සඳහා පුහුණු මොඩියුල සකස් කිරීම.
- පුහුණුකරුවන් තුළ විවිධ විෂයයන් සම්බන්ධ දැනුම වර්ධනය කරනු පිණිස පුහුණු වැඩසටහන් පැවැත්වීම.

2016 දී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය

ක්‍රියාකාරකම	පාඨමාලා	පුහුණු ලාභීන්
දින 05 පුහුණු වැඩසටහන්	882	29,023
දින 02 දැනුවත් කිරීමේ වැඩසටහන්	291	9,005
කොරියානු රැකියා සඳහා පිටත්ව යාමට පෙර පුහුණු වැඩසටහන්	21	856
දින 05 පුහුණු වැඩසටහන් - ඊශ්‍රායල කෘෂිකාර්මික රැකියා	6	282

කාර්යාංශය විසින් විවිධ පුහුණු වැඩසටහන් හරහා පුහුණුකරුවන් සඳහා පවත්වන ලද ප්‍රායෝගික සැසි











ආංශික කාර්යසාධනය

සේවා කාලය තුළ

සමථ අංශය

2016 වසර තුළදී සමථ අංශය වෙත පැමිණිලි 6,145 ක් ලැබුණු අතර ඉන් 6,550 ක් විසඳනු ලැබිණ (මෙම විසඳන ලබ පැමිණිලි අතරට පසුගිය වසරේදී ලැබුණු පැමිණිලිද ඇතුළත් වේ). පැමිණිලි 295 කට අදාළව දේශීය හා විදේශීය රැකියා නියෝජිතායතන වලින් රු. 10,534,890 ක් අයකර ගැනීමට හැකි වූ අතර වන්දි හෝ නිග මුදල් වශයෙන් එම මුදල අදාළ ශ්‍රමිකයින් වෙත බෙදා දෙන ලදී.



සමථ අංශයේ ක්‍රියාකරී සැලැස්මට අනුව ප්‍රධාන කර්යාලය සහ ශාඛා කාර්යාල ආශ්‍රිතව "සමථ දින" වැඩසටහන් කිහිපයක්ම පවත්වන ලදී



සමථ නිලධාරීන් වෙනුවෙන් විශේෂ පුහුණු වැඩසටහනක් 2016 ජූනි 17 දින ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී

විදේශ දුත මණ්ඩල පරිපාලන හා විදේශ සම්බන්ධතා අංශය

ශ්‍රී ලාංකිකයන්ගේ ශ්‍රමය ලබා ගන්නා රටවල ස්ථාපිත ශ්‍රී ලාංකික තානාපති කාර්යාලවල කම්කරු අංශවලට අදාළ පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීමේ අරමුණින් විදේශ දුත මණ්ඩල පරිපාලන හා විදේශ සම්බන්ධතා අංශය පිහිටුවන ලදී.

2016 වසරේදී විදේශ දුත මණ්ඩල පරිපාලන හා විදේශ සම්බන්ධතා අංශය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යභාරයන් පහත දැක්වේ:

ප්‍රතිපත්ති සකස් කිරීම

විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සහ විදේශ රැකියා කර්මාන්තයට අදාළ ප්‍රතිපත්ති සකස් කිරීමේදී සහ විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල හරහා එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මෙම අංශය සහය දක්වයි. 2016 වසරේදී පහත දැක්වෙන රටවල් සමග ගිවිසුම් තුනකට අත්සන් තබන ලදී.

- ඊශ්‍රායලය - ජාතික වැඩිහිටි පුද්ගලයන් හෝ ආබාධිත පුද්ගලයන් රැකබලා ගැනීම සඳහා සාත්තු සේවකයන් වෙනුවෙන් ශ්‍රී ලාංකිකයන් බඳවාගෙන රැකියාවලට අනුයුක්ත කිරීම සඳහා 2016.05.25 දින හවුල් නියමු වැඩසටහනක් පවත්වන ලදී.
- ඇමරිකා එක්සත ජනපදය - සෞඛ්‍යාරක්ෂණ වෘත්තිකයන් බඳවා ගැනීම සහ 2016.04.01 දින ඔවුන් ඇමරිකා එක්සත් ජනපදය හා දකුණු අප්‍රිකාව යන රටවල සේවයේ යෙදවීම.
- මැලේසියාව - ශ්‍රමිකයන් බඳවා ගැනීම, ඔවුන්ගේ සේවා නියුක්තිය සහ පෙරළා ශ්‍රී ලංකාව බලා පැමිණීම යන කරුණුවලට අදාළව අවබෝධතා ගිවිසුමක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ මැලේසියානු රජය අතර 2016.12.16 දින අත්සන් තබන ලදී.

විදේශ රැකියා නියෝජිතයන් ලියාපදිංචි කිරීම

2016 වසරේදී අලුතින් ලියාපදිංචි කරන ලද විදේශ රැකියා නියෝජිත ආයතනවල මුළු එකතුව 1,166 ක් වූ අතර විදේශ රැකියා නියෝජිත ආයතන 8,971 ක බලපත්‍ර අලුත් කරන ලදී.

කාරණය	2011	2012	2013	2014	2015	2016
අලුතින් ලියාපදිංචි තිරිමි	540	590	838	1,850	2,391	1,166
ලියාපදිංචි අලුත් කිරීම්	4,908	5,157	5,062	7,016	6,949	8,971
එකතුව	**5,448**	**5,747**	**5,900**	**8,866**	**9,340**	**10,137**

දේශීය හා විදේශීය රැකියා නියෝජිත ආයතන හා සේවකයින් අසාධු ලේඛනයට ඇතුළත් කිරීම හා ඔවුන්ගේ නම් එම ලේඛන වලින් ඉවත් කිරීම

2016 වසර තුළ මෙම අංශය විසින් දේශීය විදේශ රැකියා ආයතන 71 ක්, විදේශවල පිහිටි රැකියා නියෝජිත ආයතන 62 ක් සහ 2,032 ක් වූ විගමණික සේවක සංඛ්‍යාවක් අසාධු ලේඛනයට ඇතුළත් කරන ලද අතර දේශීය රැකියා නියෝජිත ආයතන 85 ක්, විදේශවල පිහිටි රැකියා නියෝජිත ආයතන 71 ක් හා 62,665 ක් වූ විගමණික සේවක සංඛ්‍යාවක් අසාධු ලේඛනයෙන් ඉවත් කරන ලදී.

විවිධ ගැටළු වලට මුහුණ දුන් ශ්‍රමිකයන් සහ මියගිය ශ්‍රමිකයන්ගේ සිරුරු හා සිරුරු කොටස් නැවත ගෙන්වා ගැනීම සහ වන්දි හෝ හිඟ වැටුප් අයකර ගැනීම

මෙම සමාලෝචනයට ලක් වන වසර තුළ පුද්ගලයන් 75 දෙනෙකු නැවත ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම වෙනුවෙන් පිරිවැය වශයෙන් රු. මිලියන 2.09 ක් වැය කරන්නට සිදු විය. මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් ආපසු ශ්‍රී ලංකාව බලා ඒමට ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සඳහා මූල්‍ය සහය ඉල්ලා සිටි විදෙස් ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් වෙනුවෙන් එම මුදල ලබා දෙන ලදී. මීට අමතරව, විදෙස් රැකියාවල නිරතව සිටියදී මරණයට පත් වූ ශ්‍රමිකයන් වෙනුවෙන් මරණ වන්දි, හිඟ වැටුප් සහ අනෙකුත් ලැබිය යුතු මුදල් ලබා ගැනීම සඳහා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් හට සහයෝගය ලබා දෙන ලදී. ඒ අනුව 2016 වසරේදී මරණ 295 ක් වාර්තා වූ අතර අවමංගල්‍ය වියදම් සහ අදාළ පුද්ගලයන්ගේ සිරුරු ගෙන්වා ගැනීම වෙනුවෙන් රු. මිලියන 11.55 ක් වැය කරන ලදී.

	2011		2012		2013		2014		2015		2016	
	සංඛ්‍යාව	වියදම (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම (රු. මිලියන)
වාර්තා වූ මරණ ප්‍රමාණය	302		289		303		315		312		295	
මෘත දේහ ගෙන්වීම සඳහා ගිය වියදම්	23	03.947	26	6.69	36	10.45	22	04.95	25	06.49	16	04.05
අවමංගල්‍ය වියදම්	219	02.159	236	02.36	259	02.67	247	05.02	236	07.08	249	07.5
මුළු එකතුව	**242**	**06.106**	**262**	**09.05**	**295**	**13.12**	**269**	**09.97**	**261**	**13.57**	**265**	**11.55**

විශේෂ පැමිණිලි විභාග කිරීම

2016 වසරේදී ලැබුණු පැමිණිලි 691 ක් අතරින් 581 ක් විසඳන ලදී. මීට අමතරව වරදකරුවන් 145 දෙනෙකු සිරගත කරනු ලැබූ අතර පුද්ගලයින් රෝහල්ගත කිරීම් 139 ක් වාර්තා විය.

විදේශ ශ්‍රමික සුභසාධන අරමුදල

විදේශ සම්බන්ධතා අංශය සතු ප්‍රධාන කාර්යභාරයක් වන්නේ විදේශ ශ්‍රමික අරමුදලේ කටයුතු නිරීක්ෂණය කිරීම සහ පාලනය කිරීමයි. 2016 ජනවාරි සිට දෙසැම්බර් මාසය දක්වා කාලය තුළ එකතු වූ මුළු මුදල රු. මිලියන 527.31 ක් වූ අතර මුළු වියදම රු. මිලියන 690.93 ක් ලෙස වාර්තා වේ.

විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාල 16 ක කම්කරු අංශ සඳහා ඒ ඒ රටවල හා ශ්‍රී ලාංකික නිලධාරීන් 150 ක් පත් කරන ලද අතර එහි අරමුණ වූයේද අදාළ රටවල සේවයේ යෙදී සිටින ශ්‍රී ලාංකිකයන් සඳහා අවශ්‍ය සහය ලබා දීමයි.

ධාරක රටෙහි රක්ෂණ ක්‍රම

කුවේටය, කටාර් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි රටවල් විසින් පවත්වාගෙන යනු ලබන රක්ෂණ යෝජනා ක්‍රමද මෙම අංශයේ නිරීක්ෂණයට ලක් වේ.

දූත පිරිස් පිටත් කර යැවීම හා පිළිගැනීම

2016 වසර තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙත විදේශ නියෝජිතයෝ 11 ක් පැමිණියහ. 2011-2015 අතර කාලය තුළ එවැනි නිලධාරීන් 50 ක් පැමිණ ඇත. 2016 දී පහත සඳහන් විවිධ අරමුණු සඳහා ශ්‍රී ලංකාව බලා පැමිණි විදේශ නියෝජිතයින් සංඛ්‍යාව 59 කි.

- විවිධ කර්මාන්ත පිළිබඳව දැනුම ලබා ගැනීම සහ වෙළෙඳ කටයුතු ප්‍රවර්ධනය කිරීම
- කම්කරු අංශවල කටයුතු නිරීක්ෂණය කිරීම
- ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, වැඩමුළු ආදියට සහභාගී වීම

රියාද්, ජෙඩා, කුවේට්, සයිප්‍රස්, අබුඩාබි, ඩුබායි, ඕමානය, කටාර්, ජෝර්දානය, ලෙබනනය හා මැලේසියාව යන රටවල් හා නගර ආශ්‍රිත ශ්‍රී ලංකා තානාපති කාර්යාලවලට සම්බන්ධව ආරක්ෂක නවාතැන් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පියවර ගනියි. එහි අරමුණ වන්නේ විපතට පත් ශ්‍රී ලාංකික කාන්තා ශ්‍රමිකයන්ට නවාතැන් පහසුකම් සහ ආහාර, වෛද්‍ය සහය හා ආරක්ෂාව වැනි පහසුකම් සැලසීමයි. එම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මෙම සමාලෝචිත වසර තුළ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ විසින් රු. මිලියන 57.06 ක මුදලක් වැය කර ඇත.

රට	ආරක්ෂිත නවාතැන්වල නතර වූ සේවක සංඛ්‍යාව
අබුඩාබි	136
ඩුබායි	194
ජෙඩා	81
ජෝර්දානය	57
කුවේට්	1,318
ලෙබනනය	13
මැලේසියාව	11
ඕමානය	294
කටාරය	433
රියාද්	904
සයිප්‍රස්	111
එකතුව	**3,552**



ඉතියෝපියානු දූත පිරිසක් 2016 අගෝස්තු 15 සිට 17 දක්වා ශ්‍රී ලංකාවේ සිදු කළ අධ්‍යයන චාරිකාවෙහි ඡායාරූපයකි

අනෙකුත් විශේෂ කාර්යයන්

- කොළඹ ක්‍රියාවලි අමාත්‍යවරුන්ගේ රැස්වීම 2016 අගෝස්තු 25 දින කොළඹ ගාලුමුවදොර හෝටලයේදී පැවැත්වුණු අතර සංක්‍රමණික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ සංවර්ධනයට අදාළ කරුණු හා ගැටළු සාකච්ඡා කිරීම සඳහා සාමාජික රටවල් 11 ක් නියෝජනය කළ අමාත්‍යවරු ඊට සහභාගී වූහ.

- ඕමානය හා ශ්‍රී ලංකාව අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුම ප්‍රකාරව විදේශ ශ්‍රමිකත්වය හා පුහුණුවලට අදාළ ගැටළු සාකච්ඡා කිරීම සඳහා පැවැත්වුණු තාක්ෂණික හවුල් කමිටු රැස්වීමකට සහභාගී වනු පිණිස එරට නිල දූත පිරිසක් 2016 සැප්තැම්බර් 22 දින මෙරටට පැමිණියේය.

- විදේශ රැකියා ඇමතී ගරු තලතා අතුකෝරළ මැතිනියගේ නායකත්වය සහ මෙම අංශයේ සම්බන්ධීකරණය යටතේ සාමාජිකයින් පස් දෙනෙකුගෙන් යුතු නියෝජිත කණ්ඩායමක් 2016 අගෝස්තු 25 සිට 28 දක්වා ඊශ්‍රායල සංචාරයක නිරත විය. මෙම සංචාරයේදී කලින් කල කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා බඳවා ගැනීමට ඇති ඉඩකඩ විමසා බැලීම සඳහා ඊශ්‍රායලයේ කෘෂිකර්ම සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍ය ගරු යූරි යෙහූදා ඒරියල් හෝයන් මහතා සමගද, ඊශ්‍රායලයෙහි රැකියාවල නිරත වීම සඳහා වීසා ලබා ගැනීමේදී ශ්‍රී ලාංකිකයන් හට මුහුණපෑමට සිදු වන ගැටළු විසඳා ගැනීමේ යාන්ත්‍රණයක් ඇතිකර ගැනීම සම්බන්ධයෙන් එරට අදාළ නිලධාරීන් සමගද ගරු ඇමතිතුමිය සාකච්ඡා පැවැත්වූවාය. මීට අමතරව, එරට රැකියා නියෝජිත ආයතන සමගද සාකච්ඡා පැවැත්විණි.

ඊශ්‍රායලය

වඩා හොඳ ජීවන තත්ත්වයක් ළඟාකර ගැනීමේ අරමුණින් බොහෝ දෙනා ඊශ්‍රායලයේ විවිධ කෙෂ්ත්‍රවල රැකියා බලාපොරොත්තු වෙති. ඊශ්‍රායලයේ රැකියා අවස්ථා බලාපොරොත්තු වන ශ්‍රී ලාංකිකයන් සංඛ්‍යාවද මේ වන විට ඉහළ ගොස් ඇත. 2016 වසරේදී ශ්‍රී ලාංකිකයන් වෙනුවෙන් රැකියා අවස්ථා 2,400 ක් ලබා දී ඇත.

විදේශ සම්බන්ධතා II අංශය

පෞද්ගලික පාර්ශ්ව වෙතින් රැකියා අවස්ථා ලබා ගැනීමෙන් අනතුරුව පිටත්ව ගොස් ඇති ශ්‍රමිකයන් විසින් සිදු කරනු ලබන පැමිණිලි සහ ඔවුන්ට අදාළ ගැටළුවලදී දේශීය නියෝජිත ආයතන වෙත වගකීම පැවරිය නොහැකි අවස්ථාවලදී කටයුතු කිරීම වෙනුවෙන් විදේශ සම්බන්ධතා II අංශය පිහිටුවන ලදී.

ප්‍රධාන වගකීම් හා කාර්යභාරයන්

- කොන්ත්‍රාත් කාල සීමාව සම්පූර්ණ වීමෙන් අනතුරුව සේවා යෝජකයින් විසින් ශ්‍රී ලංකාව බලා නැවත පැමිණීමට ඉඩ ලබා නොදෙනු ලැබෙන විදෙස් ශ්‍රමිකයන්ගේ පැමිණිලි විසඳීම.
- නීත්‍යානුකූල සේවා ස්ථානයෙන් හෝ වගකීම දරන පාර්ශ්වයෙන් පලා ගිය ශ්‍රමිකයන්ගේ පැමිණිලි විසඳීම.
- අතුරුදන් වූ බවට හෝ තොරතුරු නොමැති බවට වාර්තා වන විදෙස් ශ්‍රමිකයන්ට අදාළ පැමිණිලි විසඳීම.
- ශ්‍රී ලාංකික තානාපති කාර්යාල විසින් පවත්වාගෙන යනු ලැබෙන ආරක්ෂිත නවාතැන්වල ආරක්ෂාව ලබන ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන්ගේ පැමිණිලි විසඳීම.
- කොන්ත්‍රාත් කාලය ඇතුළත සේවා යෝජකයන්ගේ විවිධ හිංසාවන් හේතුවෙන් අසනීප වූ හෝ තුවාල, ආබාධ සිදු වූ සේවකයන්ට අදාළ පැමිණිලි විසඳීම.
- පෙරළා සිය රටට පැමිණීමට ඉල්ලා සිටින විදෙස් ශ්‍රමිකයන්ගේ ඥාතීන් විසින් යොමු කරන ලද පැමිණිලි විසඳීම.
- තම වැටුප් නොලැබීම හෝ සේවා කාලය තුළ මුහුණ පෑමට සිදු වූ වෙනත් ගැටළු සම්බන්ධයෙන් නැවත ශ්‍රී ලංකාව බලා පැමිණෙන සේවකයන් විසින් සිදු කරනු ලබන පැමිණිලි විසඳීම.

2016 වසර තුළ විදේශ සම්බන්ධතා II අංශය වෙත ලැබුණු හා විසඳන ලද පැමිණිලි ප්‍රමාණය

	ලැබුණු පැමිණිලි	විසඳන ලද පැමිණිලි
පළමු කාර්තුව	432	307
දෙවන කාර්තුව	324	455
තෙවන කාර්තුව	494	448
සිව්වන කාර්තුව	385	347
එකතුව	**1,635**	**1,557**

ආංශික කාර්යසාධනය

පෙරළා පැමිණීමෙන් පසුව

මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකයෙහි ප්‍රධාන අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ සිට පිටතට පුද්ගලයින් ජාවාරමේ යෙදීම වැළැක්වීම සඳහා අවශ්‍ය පියවර ගැනීමයි. මෙවැනි ජාවාරම් විමර්ශනය කොට අපරාධකරුවන් හට ශ්‍රී ලංකාවේ මහාධිකරණයක නඩු පැවරීමට බලතල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පවරා නොමැති හෙයින් එවැනි සිදුවීම්වලට අදාළ තොරතුරු හෝ පැමිණිලි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විමර්ශන අංශය වෙත යොමු කිරීමට මෙම අංශය පියවර ගනියි.

මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකයේ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ පවතින මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකය වෙත මහජනතාවගෙන් සහ ලොව පුරා ශ්‍රී ලාංකික ආයතනවලින් ලැබෙන තොරතුරුවලට අනුව අපරාධකරුවන් සහ සැකකරුවන් පිළිබඳ විස්තර එකතු කරමින් එම වාර්තා පවත්වාගනු ලබයි. මෙම අංශයේ කාර්යභාරයන් පහත දැක්වේ:

- මිනිස් ජාවාරම් කටයුතුවල වින්දිතයන් බවට පත් වූවන් හඳුනා ගැනීම.
- අදාළ වින්දිතයා පැමිණිල්ලක් ඉදිරිපත් කොට තමන්ට සිදු වූ අසාධාරණයට විරුද්ධව කටයුතු කිරීමට කැමැත්ත දක්වන්නේ නම් ඔහු/ඇය වැඩිදුර විමර්ශන කටයුතු සඳහා අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.
- අධිකරණමය විභාග කිරීම් අවසන් වන තුරු ඔවුන්ගේ පැමිණිල්ල සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුව සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සමග එක්ව කටයුතු කිරීම.
- සැකකරුවන් පිළිබඳව විමර්ශන කිරීම සඳහා කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශය මෙහෙයවීම.
- මහජනතාව, රාජ්‍ය නිලධාරීන් සහ බාහිර පාර්ශ්වකරුවන් වෙනුවෙන් මිනිස් ජාවාරම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- මිනිස් ජාවාරම පිළිබඳව පැවැත්වෙන වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වයෙන් සහය දැක්වීම.
- ජාතික මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ කාර්ය බලකාය නියෝජනය කිරීම.
- ජාත්‍යන්තර Trafficking In Persons (TIP) වාර්තාව වෙනුවෙන් තොරතුරු ලබා දීම.

කිසිදු ශ්‍රී ලාංකික පුරවැසියෙකු මිනිස් ජාවාරමක වින්දිතයෙකු බවට පත් වීමේ ඉඩකඩ අහුරාලීම සඳහා මෙම අංශය විසින් පහත ක්‍රියාමාර්ග අනුගමනය කරයි:

- අධිකරණමය විභාග කිරීම් අවසන් වන තුරු පැමිණිලි සම්බන්ධයෙන් අදාළ දෙපාර්තමේන්තු සමග එක්ව කටයුතු කිරීම.
- සැකකාර පුද්ගලයින්ගේ තොරතුරු ලබා දී ඇත්නම් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත් විධිවිධාන යටතේ ඔවුන්ට එරෙහිව අවශ්‍ය පියවර ගැනීම සඳහා ඔවුන්ද විශේෂ විමර්ශන ඒකකය වෙත යොමු කෙරේ.
- දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කාර්යාංශ නිලධාරීන් හා බාහිර පාර්ශ්වකරුවන් සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය සැපයීම.
- මිනිස් ජාවාරම තුරන් කිරීමට සටන් වැදීම ගැන කාර්යාංශය වෙනුවෙන් වාර්තා සකස් කිරීම.
- වාසස්ථාන ලබා දීම තුළින් වින්දිතයින් ආරක්ෂා කිරීම, විශේෂයෙන්ම කාන්තාවන් වෙනුවෙන් මෙම සේවය ලබා දේ.

2016 වසරේදී දිවයින පුරා සිටින 1593 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් මිනිස් ජාවාරමට එරෙහි කාර්යාංශ ඒකකය විසින් ක්‍රියාත්මක කර ඇත. 2016 වසරේදී එම ඒකකය සඳහා පැමිණිලි 62 ක් ලැබී ඇති අතර පැමිණිලි 14 ක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යොමුකර ඇති අතර එම නඩු තවදුරටත් නොපැවැත්වීමට තීරණය කර ඇති 08 දෙනෙකු නැවත මෙරටට ගෙන්වා තිබේ.





මහජනතාව, රාජ්‍ය නිලධාරීන් සහ බාහිර පාර්ශ්වකරුවන් වෙනුවෙන් මිනිස් ජාවාරම පිළිබඳව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන



එක්සත් අරාබි එමීර් රාජ්‍යය

එක්සත් අරාබි එමීර් රාජ්‍යය ආශ්‍රිතව රැකියාවල නිරතව සිටින ශ්‍රී ලාංකික ශ්‍රම බලකායෙන් සැලකියයුතු පිරිසක් අබුඩාබි, සාජා, අල්-අයින් සහ රස් අල්-ඛයිමා යන නගරවල දැකිය හැකි වුවද ඔවුන් අතරින් අති බහුතරය සිටින්නේ ඩුබායි හීය. 2016 වසර තුළ ශ්‍රී ලාංකිකයන් 40,000 කට අධික පිරිසක් රැකියා අවස්ථා සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යය බලා පිටත්ව ගොස් ඇත.

ප්‍රත්‍යානුකලන අංශය

මෙම අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ විදේශගත ශ්‍රමිකයන් අභිමානවත් හා ආරක්ෂිත ලෙස පෙරළා මෙරටට පැමිණෙන බව සහ ඔවුන්ව සුරක්ෂිත හා වගකීම් සහගත පවුල් හා ප්‍රජා පරිසරයක් වෙත සාර්ථක ලෙස අනුගත කරනු ලැබෙන බව සහතික කිරීමයි.

මෙම අරමුණ ළඟාකර ගැනීම සඳහා ප්‍රත්‍යානුකලන අංශය විසින් පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි:

- මෙරටට පැමිණෙන ශ්‍රමිකයන් සමාජානුයෝජනය කිරීම.
- මෙරටට පැමිණෙන ශ්‍රමිකයන් ආර්ථිකමය වශයෙන් නැවත ස්ථාපිත කිරීම.
- ශ්‍රී ලංකාවට පැමිණෙන ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ශාරීරික හා මානසික යහපැවැත්ම.
- ශ්‍රී ලංකාවට පැමිණෙන ශ්‍රමිකයන් සවිබල ගැන්වීම.
- ශ්‍රී ලංකාවට පැමිණෙන ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල් සමාජගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථක ලෙස කළමනාකරණය කිරීම.

2016 වසර තුළ මෙම අංශය විසින් "ස්වයං-රැකියා අවස්ථා" පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලද අතරම ඒ සඳහා අවශ්‍ය මූල්‍ය සහයෝගයද ලබා දෙන ලදී.

සමාජ විද්‍යා අංශය

සමාජ විද්‍යා අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ වඩා සුරක්ෂිත, සැලසුම්ගත හා මිත්‍රශීලී විදේශ රැකියා සංක්‍රමණ පරිසරයක් පවතින බව සහතික කිරීම හා විදේශ රැකියා කර්මාන්තයට අදාළ සියලු පාර්ශ්වකරුවන්ගේ ශාරීරික හා භෞතික ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම තහවුරු කරමින් සමාජ සබඳතා ශක්තිමත් කිරීමයි.

විදේශගත ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

දිනය	දිස්ත්‍රික්කය	ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
12.02.2016	පුත්තලම	නවගත්තේගම	29
29.02.2016	පුත්තලම	පනංගොඩ සතිපොල	24

විදෙස් ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල්වල සෞඛ්‍ය තත්ත්වය නගා සිටුවීම හා HIV / AIDS ඇතුළු සමාජ රෝගතුරන් කිරීම වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

දිනය	දිස්ත්‍රික්කය	ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
26.05.2016	බදුල්ල	බදුල්ල	50
27.06.2016	පොලොන්නරුව	පොලොන්නරුව	42
25.07.2016 26.07.2016	අනුරාධපුර	අනුරාධපුර	110
15.08.2016	මොණරාගල	මොණරාගල	61
19.08.2016	මහනුවර	මහනුවර	66
22.08.2016	මාතලේ	මාතලේ	21
23.08.2016	නුවර එළිය	නුවර එළිය	11
10.10.2016	කුරුණෑගල	කුරුණෑගල	124
11.10.2016	කුරුණෑගල	කුරුණෑගල	113
07.11.2016	මාතර	"සණස" ශ්‍රවණාගාරය	123
08.11.2016	ගාල්ල	ගාල්ල	167

විදේශ රැකියා අමාත්‍යාංශයට අනුබද්ධිත සංවර්ධන නිලධාරීන් වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් හා ප්‍රගති සමාලෝචන රැස්වීම්

දිනය	දිස්ත්‍රික්කය	ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
08.02.2016	අම්පාර	අම්පාර	54
19.02.2016	හම්බන්තොට	තංගල්ල	31
04.03.2016	රත්නපුර	රත්නපුර	45
14.03.2016	මොණරාගල	මොණරාගල	23
09.05.2016	ත්‍රිකුණාමලය	ත්‍රිකුණාමලය	24
10.05.2016	මඩකලපුව	මඩකලපුව	40
16.05.2016	මාතර	මාතර	44
17.05.2016	ගාල්ල	ගාල්ල	51
27.06.2016	වව්නියාව	වව්නියාව	16
27.06.2016	පොලොන්නරුව	පොලොන්නරුව	19
28.06.2016	පුත්තලම	හලාවත	39
05.07.2016 08.07.2016	රත්නපුර	රත්නපුර	39
25.07.2016 26.07.2016	අනුරාධපුර	අනුරාධපුර	59
07.08.2016 08.08.2016	බදුල්ල	බදුල්ල	87
15.08.2016	මොණරාගල	මොණරාගල	28
19.08.2016	මහනුවර	මහනුවර	44
22.08.2016	මාතලේ	මාතලේ	21
23.08.2016	නුවර එළිය	නුවර එළිය	11
10.10.2016	කුරුණෑගල	කුරුණෑගල	24
11.10.2016	කුරුණෑගල	කුරුණෑගල	21
18.10.2016	කොළඹ	ශ්‍රී.ලං.වි.සේ.නි.කා. ශ්‍රවණාගාරය	107
07.11.2016	මාතර	"සණස" ශ්‍රවණාගාර	44
08.11.2016	ගාල්ල	ගාල්ල	21

දරුවන්ගේ අධ්‍යාපනය ඉහළ නැංවීමේ අරමුණින් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

දිනය	දිස්ත්‍රික්කය	ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
11.10.2016	කුරුණෑගල	කුරුණෑගල	113
07.11.2016	මාතර	"සණස" ශ්‍රවණාගාරය	123
08.11.2016	ගාල්ල	ගාල්ල	167
17.11.2016	කොළඹ	රත්මලාන ප්‍රා.ලේ. කාර්යාලය	20
29.12.2016	මාතර	තිහගොඩ ප්‍රා.ලේ. කාර්යාලය	148

ශ්‍රී ලංකාවට පැමිණි විදෙස් ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල් වෙනුවෙන් ස්වයං-රැකියා අවස්ථා වර්ධනය කරනු පිණිස පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

දිනය	දිස්ත්‍රික්කය	ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
13.06.2016	හම්බන්තොට	තංගල්ල	42
27.06.2016	පොලොන්නරුව	පොලොන්නරුව	42
05.07.2016 08.07.2016	රත්නපුර	රත්නපුර	23
25.07.2016 26.07.2016	අනුරාධපුර	අනුරාධපුර	110
07.08.2016 08.08.2016	බදුල්ල	බදුල්ල	87
15.08.2016	මොණරාගල	මොණරාගල	61
19.08.2016	මහනුවර	මහනුවර	66
22.08.2016	මාතලේ	මාතලේ	21
23.08.2016	නුවර එළිය	නුවර එළිය	11
10.10.2016	කුරුණෑගල	කුරුණෑගල	124
11.10.2016	කුරුණෑගල	කුරුණෑගල	113
18.10.2016	කොළඹ	ශ්‍රී.ලං.වි.සේ.නි.කා. ශ්‍රවණාගාරය	107
07.11.2016	මාතර	"සණස" ශ්‍රවණාගාරය	123
08.11.2016	ගාල්ල	ගාල්ල	167

මිනිස් ජාවාරම වැළැක්වීම පිළිබඳව ශ්‍රී ලංකාව බලා පැමිණි විදෙස් ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල් වෙනුවෙන් පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

දිනය	දිස්ත්‍රික්කය	ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
10.10.2016	කුරුණෑගල	කුරුණෑගල	124
11.10.2016	කුරුණෑගල	කුරුණෑගල	113
18.10.2016	කොළඹ	ශ්‍රී.ලං.වි.සේ.නි.කා. ශ්‍රවණාගාරය	107
07.11.2016	මාතර	"සණස" ශ්‍රවණාගාරය	123
08.11.2016	ගාල්ල	ගාල්ල	167

සුභසාධන අංශය

සුභසාධන අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුරක්ෂිතතාව සහතික කරනු වස් සාර්ථක, ගුණාත්මක හා සඵලදායී සුභසාධන සේවා සැපයීමයි.

ඉහත අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා සුභසාධන අංශය විසින් පහත සේවාවන් ලබා දීම සිදු කරයි:

- විගමණික ශ්‍රමිකයන් ලබා ගෙන ඇති ණය මුදල්වල පොලි ගෙවීම සඳහා මුදලින් සහය දැක්වීම.
- විගමණික ශ්‍රමිකයන්ගේ වෛද්‍ය ප්‍රතිකාර බිල්පත් ගෙවීම සහ මූල්‍ය හා මූල්‍ය නොවන සහයෝගය ලබා දීම.
- පූර්ණ ආබාධිත විගමණික ශ්‍රමිකයන් සඳහා නිවාස ඉදිකර දීම.
- රක්ෂණ ප්‍රතිලාභ (දේශීය) ලබා දීම.
- විගමණික ශ්‍රමිකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා වෛද්‍ය පහසුකම් ලබා දීම උදෙසා වෛද්‍ය කඳවුරු පැවැත්වීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පැමිණෙන අවශ්‍යතා සහිත විගමණික ශ්‍රමිකයන් සඳහා සුභසාධන පහසුකම් ලබා දීම. (බස් ගමන් ගාස්තු, ආහාර ආදී)
- විගමණික ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම.
- විගමණික ශ්‍රමිකයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය ඉලක්ක කරගත් වැඩසටහන් පැවැත්වීම.
- විගමණික ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා පාසල් උපකරණ ලබා දීම.
- හදිසි අවස්ථාවලදී හෝ ස්වභාවික ආපදාවන්හිදී හෝ විදෙස්ගත ශ්‍රී ලාංකික විගමණික ශ්‍රමිකයන්ගේ පවුල් සඳහා විශේෂ උපකාර ලබා දීම.
- ''ශ්‍රමික සුරැකුම' ජංගම සේවාව සඳහා සහය ලබා දීම.



රත්නපුර දිස්ත්‍රික්කයේ පදිංචි ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් කහවත්ත වෛද්‍ය කඳවුරේදී



ආබාධිත තත්ත්වයට ලක් වූ විදෙස් ශ්‍රමිකයෙකු හට ගිලන් ඇඳක් ලබා දීම



පාදුක්ක ප්‍රදේශයේ ආබාධිත ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයෙකු වෙනුවෙන් නිවසක් ඉදිකිරීම



ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා ආධාර ලබා දීම





ශ්‍රී ලාංකික විදෙස් ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා අරලියගහ මන්දිරයේදී පැවැත්වූ ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩසටහන

විදෙස් ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ ආරක්ෂාව හා සුභසාධනය වෙනුවෙන් සිදු කරන ලද ක්‍රියාකාරකම්

විස්තරය	2011		2012		2013		2014		2015		2016	
	සංඛ්‍යාව	වියදම් (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම් (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම් (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම් (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම් (රු. මිලියන)	සංඛ්‍යාව	වියදම් (රු. මිලියන)
විදෙස් ශ්‍රමිකයන් සඳහා වන රක්ෂණ යෝජනා ක්‍රමය	2,109	192.1	2,308	115.22	2,784	299.208	2,730	161.935	2,629	150.03	207,903	136.59
ශ්‍රමික සුභසාධන අරමුදල (W.W.F.)	71	2.093	104	7.59	117	9.386	69	3.846	44	4.077	152	25.09
විදෙස් ශ්‍රමිකයන්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව ලබා දීම	1,821	34.095	2,715	52.42	2,296	4.404	2,147	4.053	3,311	6.028	3,942	71.77
රෝහල්ගත කරන ලද විදෙස් ශ්‍රමිකයන් සඳහා වෛද්‍ය උපකරණ, පෝෂණ අවශ්‍යතා, ආහාර සහ ඖෂධ ලබා දීම	7	0.11	10	0.13	125	0.02	-	-	2	0.013	6	0.319
'සහන නිවාස යෝජනා ක්‍රමය' යටතේ ආබාධිත විදෙස් ශ්‍රමිකයන් වෙනුවෙන් නිවාස ඉදිකිරීම හා පරිත්‍යාග කිරීම	6	1.647	7	2.1	6	03	03	01.5	-	-	1	0.188
රැකියා බලා පිටත්ව යාමට පෙර ණය ලබා දීම	46	2.262	26	1.275	28	1.382	28	01.4	7	0.33	48	0.406
විදෙස් ශ්‍රමිකයන් හට අඩු පොළි අනුපාත යටතේ ණය ලබා දීම	28	7.52	25	8.22	24	7.3	14	04.45	1	0.3	157	0.367
විදෙස් ශ්‍රමිකයන්ගේ දරුවන් හට පාසල් උපකරණ ලබා දීම	-	-	1,339	2011 උපකරණ තොගයෙන්	476	0.33	267	0.191	05	0.025	122	0.616
විදෙස් ශ්‍රමිකයන්ගේ පවුල්වල සාමාජිකයන් වෙනුවෙන් වෛද්‍ය කඳවුරු පැවැත්වීම	-	-	-	-	1,911	1.510	1	0.499	-	-	-	-

ආංශික කාර්යසාධනය

උපකාරක සේවා

පරිපාලන හා මානව සම්පත් අංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පරිපාලන හා මානව සම්පත් අංශය ස්ථාපිත කරන ලද්දේ කාර්යක්ෂම මානව සම්පත් කළමනාකරණය සහ නිසි පරිපාලනමය විධිවිධාන තුළින් කාර්ය මණ්ඩලය වෙත ඉහළම තත්ත්වයේ සේවාවන් ලබා දීම පහසු කිරීමේ අරමුණිනි.

2011-2016 අතර කාලය තුළ පරිපාලන සහ මානව සම්පත් කාර්යසාධන සාරාංශය

වර්ෂය	2011	2012	2013	2014	2015	2016
දෙසැම්බර් 31 දිනට සමස්ථ කාර්ය මණ්ඩලය	831	930	1,088	1,117	1,184	1,177
බඳවාගැනීම්	58	136	188	55	131	25
උසස්වීම්	05	220		102	112	08
සේවකයින් ඉවත්ව යාම (අල්ලා අස්වීම, සේවය අත්හැර යාම, සේවය අත්හිටුවීම, සේවයෙන් පහකිරීම)	42	33	30	24	59	30
වැටුප් වර්ධක ලද සේවකයින්	855	541	743	674	712	927
ලබා දුන් පුහුණු වැඩසටහන්වලට අදාළ මූල්‍ය වටිනාකම (රු. මිලියන)	4.866	4.412	4.559	5.052	4.626	4.886

කාර්ය මණ්ඩලය සඳහා ණය	2011	2012	2013	2014	2015	2016
ආපදා ණය						
ලබා දුන් ණය මුදල	334	336	359	393	428	425
වියදම (රු. මිලියන)	42.52	47.252	46.989	69.814	106.38	92.688
රථ වාහන ණය						
ලබා දුන් ණය මුදල	58	46	95	63	59	54
වියදම (රු. මිලියන)	21.123	19	46.541	30.804	31.455	29.83
නිවාස ණයවල පොළියෙන් 2/3 ක් ප්‍රතිපූරණය කිරීම						
ප්‍රතිපූරණ ලෙස ලබා දුන් පොළි මුදල	1,055	1,023	880	704	646	704
වියදම (රු. මිලියන)	5.386	6.572	7.138	7.113	7.958	13.66
ක්ෂණික ණය						
ලබා දුන් ණය මුදල	80	56	69	94	75	93
වියදම (රු. මිලියන)	1.483	1.42	1.84	2.995	3.028	3.856
උත්සව අත්තිකාරම්						
ලබා දුන් අත්තිකාරම් මුදල	593	626	748	758	787	814
වියදම (රු. මිලියන)	2.965	3.13	3.74	3.79	7.87	8.14
සෞඛ්‍ය ප්‍රතිකාර වෙනුවෙන් මුදල් ප්‍රතිපූරණය කිරීම						
සමස්ථ හිමිකම් පෑම් වටිනාකම	3,330	3,913	5,111	5,609	6,477	5,864
මුළු පිරිවැය (රු. මිලියන)	11.295	17.511	21.828	27.46	36.571	33.795
මතුගම, නිට්ටඹුව, රත්නපුර, හොරණ හා මරදාන යන ස්ථාන පහක් සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දෙන ලදි						
කාර්ය මණ්ඩලය සඳහා ප්‍රවාහන වියදම් (රු. මිලියන)	11.27	12.58	11.042	11.664	12.81	14.912

මුදල් අංශය

2016 අයවැය යෝජනාවට අනුව කාර්යාංශයේ ලියාපදිංචි ගාස්තුව රු. 5,200 සිට රු. 15,200 දක්වා ඉහළ දමන ලද අතර 2016 වසරට සාපේක්ෂව සැලකියයුතු මට්ටමේ ආදායම් ඉහළ යාමක් සඳහා එය මග පෑදීය. එසේම, 2016 වසරේ බදු පෙර ලාභයද 2015 වසරට වඩා සැලකිය යුතු තරමින් ඉහළ යාමක්ද දැකිය හැකිය.

විචක්ෂණශීලී මූල්‍ය කළමනාකරණ පරිචයන් හේතුකොට ගෙන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙතෙක් අත්කර ගත් ඉහළම බදු පෙර ලාභය වාර්තා කිරීමට 2016 වසරේදී හැකි විය.

	රු. මිලියන		
	2016	2015 (යළි ප්‍රකාශිත)	වෙනස (%)
සමූහය			
ආදායම	4,032	3,479	16%
බදු පෙර ලාභය	1,315	880	49%
බදු පසු ලාභය	944	884	7%
මූල්‍ය නොවන වත්කම්	7,689	7,441	3%
ජංගම වත්කම්	6,618	5,788	14%
ජංගම වගකීම්	1,531	1,384	11%
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය			
ආදායම	3,974	3,433	16%
බදු පෙර ලාභය	1,309	877	49%
බදු පසු ලාභය	942	883	7%
මූල්‍ය නොවන වත්කම්	7,619	7,279	5%
ජංගම වත්කම්	6,468	5,769	12%
ජංගම වගකීම්	1,449	1,337	08%
ශ්‍රී ලංකා විදේශ රැකියා පුද්ගලික සමාගම			
ආදායම	57	46	24%
බදු පෙර ලාභය	5.2	2.7	93%
බදු පසු ලාභය	2	0.89	125%
මූල්‍ය නොවන වත්කම්	79	167	-53%
ජංගම වත්කම්	155	29	434%
ජංගම වගකීම්	88	47.62	85%

හාලි ඇළ සහ රත්නපුර අභිනව විගමණික ශ්‍රමික සම්පත් මධ්‍යස්ථානය වැනි දිගු කාලීන ව්‍යාපෘති ආශ්‍රිතව සිදු කරන ලද අති විශාල ආයෝජනයන්හි ප්‍රතිඵලයක් ලෙස 2016 වසරේදී සමස්ථ වත්කම් ප්‍රමාණය 2015 වසරට වඩා ඉහළ ගොස් ඇත.

සමූහයේ ප්‍රධාන මූල්‍ය විස්තර වැඩිදුර වටහා ගැනීම උදෙසා පහත ලබා දී ඇත:

සමූහය රු. මිලියන

විස්තරය	2012	2013	2014	2015	2016
ආදායම	2,499	2,939	3,537	3,479	4,032
බදු පෙර ලාභය	258	326	459	880	1,315
බදු පසු ලාභය	170	234	336	884	944
මූල්‍ය නොවන වත්කම්	5,180	2,435	5,560	7,441	7,689
ජංගම වත්කම්	4,916	8,761	6,682	5,788	6,618
ජංගම වගකීම්	3,809	4,309	4,714	1,384	1,531

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

රු. මිලියන

විස්තරය	2012	2013	2014	2015	2016
ආදායම	2,470	2,871	3,461	3,433	3,974
බදු පෙර ලාභය	253	309	416	877	1,309
බදු පසු ලාභය	165	222	299	883	942
මූල්‍ය නොවන වත්කම්	5,006	2,238	5,356	7,279	7,619
ජංගම වත්කම්	4,900	8,736	6,645	5,769	6,468
ජංගම වගකීම්	3,696	4,196	4,613	1,337	1,449

ශ්‍රී ලංකා විදේශ රැකියා පුද්ගලික සමාගම

රු. මිලියන

විස්තරය	2012	2013	2014	2015	2016
ආදායම	29	68	76	46	57
බදු පෙර ලාභය	5	17	43	2.7	5.2
බදු පසු ලාභය	5	12	37	0.89	2
මූල්‍ය නොවන වත්කම්	174	197	204	167	79
ජංගම වත්කම්	16	25	37	29	155
ජංගම වගකීම්	113	113	101	47.62	88

ආදායම



ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන ආදායම උත්පාදනය වන්නේ ලියාපදිංචි ගාස්තු, බලපත්‍ර ගාස්තු, කොරියානු රැකියා සඳහා බඳවා ගැනීම් හා පුහුණු කිරීමේ ගාස්තු, අතිරික්ත ආදායම සහ ආයෝජන ආදායම යන ආදායම් මාර්ගවලිනි.

බදු පෙර ලාභය



කාර්යාංශය වාර්ෂිකව ආදායම් බද්දෙන් 28% ක ප්‍රතිපාදනයක් වෙන් කරයි. 2015 සහ 2016 වසරවල බදු පෙර ලාභය සැලකියයුතු තරමින් ඉහළ ගොස් ඇත.

නඩත්තු අංශය

නඩත්තු අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ වඩා කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීම සඳහා කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙනුවෙන් හිතකර සේවා පරිසරයක් නිර්මාණය කිරීමයි.

මෙම අංශය විසින් 2016 වසරේදී ඉටු කරන ලද කාර්යභාරයන් පහත දැක්වේ.

- මතුගම විගමණික ශ්‍රමික සම්පත් මධ්‍යස්ථානයේදී වර්ග අඩි 700 ක තාවකාලික ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
- ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙහි තීන්ත ගෑම.
- ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි සිසිලන උපකරණ පද්ධති දෙකක් සවි කිරීම.
- සීදුව පුහුණු මධ්‍යස්ථානයේ අංශ බෙදීම් කටයුතු නිම කිරීම.
- ශ්‍රවණාගාරයේ ඇති ආසන 100 ක් අලුත්වැඩියා කිරීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල ආශ්‍රිතව අලුතින් කවුන්ටර ඉදිකිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- කතරගම යෝජිත නිවාඩු නිකේතනය සඳහා මුල්ගත තැබීමේ උත්සවය සංවිධානය කිරීම.





තොරතුරු තාක්ෂණ අංශය

ශ්‍රී ලංකා විදේශ සේවා කාර්යාංශයේ තොරතුරු තාක්ෂණ අංශය ඵලදායීතාව උපරිම මට්ටම කරා ගෙන යාම සඳහා කැප වූ පහත සඳහන් ඒකකවලින් සමන්විත වේ.

වැඩසටහන් සංවර්ධන ඒකකය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ව්‍යාපාරික ක්‍රියාවලි අවශ්‍යතාවන්ට අනුකූලව පරිගණක වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් වගකීම මෙම ඒකකය වෙත පැවරේ. මෙම ඒකකය මගින් සංවර්ධනය කරනු ලැබෙන වැඩසටහන් ප්‍රධාන කාර්යාලයේ, දීප ව්‍යාප්ත ශාඛා ජාලයේ සහ ශ්‍රී ලාංකික විදේශ තානාපති කාර්යාල 16 ක අවශ්‍යතා සඳහා යොදා ගැනේ.

දෘඩාංග ඒකකය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පරිගණක ජාල පද්ධතියේ නිසි ක්‍රියාකාරිත්වය සහ අවශ්‍ය අවස්ථාවලදී දෝෂහරණ කටයුතු සිදු කිරීමේ වගකීමද සහිතව පරිගණක, පරිගණක උපාංග සහ ජාල උපකරණ ආදියට අදාළ සියලුම නඩත්තු කටයුතු සිදු කරනු ලබන්නේ දෘඩාංග ඒකකය විසිනි.

තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය

සියලුම පුහුණු මධ්‍යස්ථාන හා ප්‍රාදේශීය කාර්යාල ප්‍රධාන කාර්යාලයෙහි පිහිටා ඇති ප්‍රධාන පරිගණක පරිගණක වෙත සම්බන්ධ කර ඇත. ක්‍රියාත්මක කරන ලද අන්තර්ජාලය පාදක කරගත් පද්ධතියද IP / VPN සබඳතාවක් හරහා සියලුම පුහුණු මධ්‍යස්ථාන හා ප්‍රාදේශීය කාර්යාල සමග සම්බන්ධ කර තිබේ. විදෙස් රටවල ශ්‍රී ලාංකික තානාපති කාර්යාලවල කම්කරු අංශද අන්තර්ජාලය හරහා ප්‍රධාන සර්වරය සමග සම්බන්ධ කර ඇති අතර ඒ හරහා අන්තර්ජාලය පදනම් කරගත් පද්ධතියක් ක්‍රියාත්මක කෙරේ. මේ මගින් දේශීය හා විදේශීය රැකියා නියෝජිත ආයතන වෙත අන්තර්ජාලය පාදක බඳවා ගැනීම් පද්ධතිය වෙත ප්‍රවේශ වීමට අවස්ථාව ලබා දීමට හැකි වී ඇත.

2016 වසරට අදාළ කාර්යසාධනය සහ ප්‍රධාන ක්‍රියාකාරකම්

- පද්ධතියේ කාර්යසාධනය ඉහළ නංවනු පිණිස සියලුම ප්‍රාදේශීය කාර්යාල හා පුහුණු මධ්‍යස්ථානවල පැවැති IP / VPN සබඳතාවන්හි ධාරිතාව උත්ශ්‍රේණි (upgrade) කිරීම.
- ජාල සේවා ලබා තථ්‍යකාලීනව ලබා ගැනීමට ඇති හැකියාව, කාර්යසාධනය හා උපයෝජ්‍යතාව නිරීක්ෂණය කිරීම සඳහා සේවා විසඳුමක් ක්‍රියාත්මක කිරීම.
- නව high-end සේවා දක්වා උත්ශ්‍රේණි කිරීම.
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පැවැති රැකියා කාණ්ඩ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව වර්ගීකරණය කිරීම. (ISCO 8.0)
- විදෙස් ගමන් බලපත්‍ර ස්කෑන් කිරීම සඳහා නව පද්ධතියක් හඳුන්වා දීම - විදෙස් ගමන් බලපත්‍රයේ ඡායාරූප පිටුව ස්කෑන් කොට එහි තොරතුරු හා ඡායාරූප පද්ධතියට ඇතුළත් කළ හැකි පරිදි සකසන ලද මෘදුකාංගයකි.

2016 වසරේදී නිපදවන ලද නව පරිගණක වැඩසටහන්

ක්‍රියාකාරී සැලැස්ම පරිගණක පද්ධතිය ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබාදීම

වසර සඳහා ක්‍රියාකාරී සැලැස්මක් ලබා දීම, එය සම්පූර්ණ වන්නේද යන්න නිරීක්ෂණය කිරීම සිහිකැඳවීම් (reminders), ඒවාට අදාළ කටයුතු ඉටු කිරීම, කාර්ය ප්‍රගතිය නිරීක්ෂණය කිරීම හා කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණාත්මක වාර්තා ලබා දීම ආදිය ක්‍රියාකාරී සැලසුම් මෘදුකාංගය විසින් සිදු කෙරේ. ගත වූ වසර තුළ සෑම අංශයක් තුළම මිනිස් ශ්‍රමය යොදාගෙන සිදු කිරීමට සිදු වූ වැඩ කටයුතු ස්වයංක්‍රියකරණය කිරීමටද එමගින් හැකි විය.

විදේශ රක්ෂණ කළමනාකරණ වෙබ් අඩවිය

Union Insurance Company (UIC) හි තොරතුරු පද්ධතිය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ තොරතුරු පද්ධතිය සමග ඒකාබද්ධ කිරීම සඳහා 'විදේශ රක්ෂණ කළමනාකරණ වෙබ් අඩවියක්' (Overseas Insurance Management Web Service) සකස් කරන ලදී. කිසිදු ප්‍රමාදයකින් තොරව අදාළ දත්ත තථ්‍යකාලීනව දත්ත පද්ධතිය වෙත ඇතුළත් වීම එමගින් ස්වයංක්‍රීයව සිදු වේ. විදේශ රටක සේවයේ නියුතු ශ්‍රී ලාංකික ශ්‍රමිකයෙකුට අදාළ රක්ෂණාවරණ තත්ත්වය හා ඒවාට හිමිකම් පෑම වැනි කටයුතු වර්තා තබා ගනිමින් නිරීක්ෂණය කිරීමට එම පද්ධතියට හැකිය.

ලියාපදිංචි කිරීමේදී දත්ත ඇතුළත් කිරීම නිරීක්ෂණය කිරීම

ප්‍රධාන කාර්යාලය සහ අනෙකුත් මධ්‍යස්ථාන මගින් ලියාපදිංචි කිරීම්වලට අදාළ දත්ත ඇතුළත් කිරීමේ ක්‍රියාවලිය නිරීක්ෂණය කිරීමටත්, ඇතුළත් නොකරන දත්ත වේ නම් ඒවා හඳුනා ගැනීමටත් රක්ෂණ වාරික දත්ත නියාමනය කිරීමටත් මෙම පද්ධතියෙන් සහය ලැබේ.



මාලදිවයින

සෑම විටම සංචාරක කර්මාන්තය ඉහළම තැනක පවතින මාලදිවයින තුළ පසුගිය වසර කිහිපය තුළ විදේශ රැකියා අවස්ථා රැසක් ඉස්මතු විය. 2016 නොවැම්බර් මාසයේදී 10,000 කට අධික ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් පිරිසක් රැකියා අවස්ථා සඳහා මාලදිවයින බලා පිටත්ව ගියහ.

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය යනු අභ්‍යන්තර පාලනය සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පාලන යාන්ත්‍රණ වැඩිදියුණු කිරීම සඳහා කළමනාකාරිත්වය වෙත ස්වාධීන උපදේශන සේවා ලබා දෙන ස්වාධීන අංශයකි. 2016 වසර තුළදී සිය විගණන සොයා ගැනීම් හා නිර්දේශයන් හරහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 3E සංකල්පය වෙනුවෙන් අති විශාල දායකත්වයක් ලබා දෙන ලදී. (ගනුදෙනු කටයුතුවල Economy (ආර්ථිකය), Efficiency (කාර්යක්ෂමතාව) හා Effectiveness (සඵලතාව).

ඉහළ ගුණාත්මකභාවයෙන් යුතු විගණන කාර්යයක් සිදු වන බව සහතික කරනු වස් අභ්‍යන්තර විගණන අංශයේ සෑම නිලධාරියෙකුම මෙම සමාලෝචනයට ලක් වන වසර තුළ ඒකාබද්ධතාව, ශක්‍යතා සහ රහස්‍යතා ආදී මූලධර්ම විමර්ශනය කරමින් සිය විගණන නිරීක්ෂණ සිදු කර ඇත.

මෙම අංශය විසින් විගණන කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇති අතර හඳුනාගත් ක්ෂේත්‍රවලට අදාළව සභාපතිතුමාගේ සමාලෝචනය වෙනුවෙන් විගණන වාර්තා 88 ක් ඉදිරිපත් කර ඇත.

මෙම සමාලෝචනයට ලක් වන වසර තුළ මෙම අංශයේ කාර්යසාධනය ගත වූ වසර පහට සාපේක්ෂව පහත දක්වා ඇත.

	2011	2012	2013	2014	2015	2016
විගණන හා කළමනාකරණ කමිටු	04	03	04	04	03	04
කෝප් කමිටු රැස්වීම්වලට සහභාගී වීම	01	01	-	02	-	-
දේශීය විගණන (පිරික්සුම්)	08	08	11	07	04	10
විදේශීය විගණන (පිරික්සුම්)	01	02	01	03	04	03

2011 සිට 2016 අතර කාලය තුළ අභ්‍යන්තර විගණන අංශය විසින් පවත්වන ලද හා සම්පූර්ණ කරන ලද විමර්ශන



සැලසුම් හා අධීක්ෂණ අංශය

සැලසුම් හා අධීක්ෂණ අංශය සතු ප්‍රධාන කාර්යභාරයන්

ආයතනික සැලසුම් සකස් කිරීම

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ආයතනික සැලසුම හා වාර්ෂික ක්‍රියාකාරී සැලසුම ඇතුලු සැලසුම් සකස් කිරීමේ වගකීම සැලසුම් හා අධීක්ෂණ අංශය වෙත පැවරේ. දැනට භාවිත වන ආයතනික සැලසුම 2016 සිට 2020 දක්වා වසර 05 ක කාලයක් සඳහා සකස් කර ඇති අතර ශ්‍රී ලංකාව සඳහා වන ජාතික කම්කරු සංක්‍රමණ ප්‍රතිපත්තියේ සහ අනෙකුත් ප්‍රතිපත්තිමය තීරණ අනුගමනය කරමින් එහි අරමුණු, ඉලක්ක හා උපායමාර්ග ආශ්‍රිතව ව්‍යුහාත්මක වෙනස්කම් කිහිපයක්ම සිදු කරන ලදී. ඒ ඒ වසරට අදාළ ආයතනික සැලසුම සලකා බලමින් සැලසුම් අංශය විසින් සෑම වසරක් සඳහාම වන වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සකස් කරනු ලබන අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සෑම අංශයක්ම ඊට අනුකූලව කටයුතු කළ යුතු වේ. කෙසේ වෙතත්, වසර මැද භාගය වන විට වසරේ ඉතිරි කාලයට අදාළ ප්‍රතිපත්තිමය වෙනස්කම් සලකමින් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය පියවර මෙම අංශය විසින් ගනු ලැබේ.

ආයතනික සැලසුම් අධීක්ෂණය කිරීම

මෙම අංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සැලකිල්ලට ගනිමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් සෑම මාස තුනකටම වරක් පවත්වනු ලබන අතර සාමාන්‍යාධිකාරී, අතිරේක සාමාන්‍යාධිකාරී, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ අංශ ප්‍රධානීන් සහභාගී වේ. ඉන් අනතුරුව එම රැස්වීම්වල ප්‍රගතියද මාස තුනකට වරක් විදේශ රැකියා අමාත්‍යාංශය හා රජයේ විගණන දෙපාර්තමේන්තුව වෙත වාර්තා කරනු ලැබේ.

කාර්තුමය පදනම යටතේ කාර්යසාධන වාර්තා පිළියෙළ කිරීම

මෙම අංශය විසින් මාස තුනකට වරක් (කාර්තුවකට එක බැගින්) සිංහල, ඉංග්‍රීසි හා දෙමළ යන භාෂා තුනෙන්ම පිළියෙළ කරනු ලබන කාර්යසාධන වාර්තා විදේශ රැකියා අමාත්‍යාංශය වෙත යවනු ලබන අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සෑම අංශයක්ම විසින් ක්‍රියාත්මක කරන ලද සියලුම කාරයයන්ට අදාළ ඡායාරූප ඊට ඇතුළත් වේ.

අභ්‍යන්තර අරමුණු සඳහා සහ රජයේ ආයතන විසින් ඉල්ලා සිටිනු ලැබෙන විට වාර්තා පිළියෙළ කිරීම

මෙම අංශය විසින් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙනුවෙන් විදේශ රැකියා නියුක්තියට අදාළ විවිධ පැති සම්බන්ධ වාර්තා මෙන්ම පහත ඉල්ලීම් පදනම් කරගෙන අනෙකුත් රජයේ ආයතන ඇතුළු බාහිර පාර්ශ්ව වෙතද වාර්තා ලබා දෙන ලදී:

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය විධිවිධාන පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තාව. මෙය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉල්ලා සිටින විට එය වෙත යොමු කළ යුතුය.
- කාර්යාංශයේ ආයතනික ප්‍රතිපත්ති රාමුව (ORF) සලකා බලමින් කාර්ය සාධන ප්‍රගතිය පිළිබඳ වාර්තාව - ව්‍යාපාර හා කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත යැවිය යුතුය.
- 2015 නොවැම්බර් 05 දින ගරු අග්‍රාමාත්‍යතුමා විසින් සිදු කරන ලද ආර්ථික ප්‍රතිපත්ති ප්‍රකාශනය ක්‍රියාත්මක කිරීම නිරීෂණය කිරීම සම්බන්ධ වාර්තාව.
- අනෙකුත් අමාත්‍යාංශ විසින් කලින් කල ඉල්ලා සිටිනු ලබන විවිධ වාර්තා.
- අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තා.

තත්ත්ව කළමනාකරණ අංශය

සියලුම කාර්ය ක්‍රමවේදයන් නිසි පරිදි නිරීක්ෂණය කරමින් පාරිභෝගික තෘප්තිමත්භාවය ඉහළ නංවනු වස් කාර්යක්ෂම හා සඵලදායී සේවාවක් ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සෑම විටම ඇපකැප වී සිටී.

2016 දී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්

කාර්යය	2013	2014	2015	2016
කාර්යාංශයේ කාර්ය මණ්ඩලය වෙනවෙන් ජාත්‍යන්තර ප්‍රමිති (ISO) දැනුවත් කිරීමේ වැඩසටහන	16	12	12	05
සහභාගී වූ සංඛ්‍යාව	600	250	250	250
ශාඛා කාර්යාල ආශ්‍රිත අභ්‍යන්තර විගණන සංඛ්‍යාව	26	26	23	23
ප්‍රධාන කාර්යාල ආශ්‍රිත අභ්‍යන්තර විගණන සංඛ්‍යාව	02	01	01	01
ශ්‍රී. ලං. ප්‍රමිති ආයතනය විසින් පවත්වන ලද තුන්වැනි පාර්ශ්ව විගණනය (ප්‍රවීක්ෂණ ඒකකය)	01	01	-	-
ශ්‍රී. ලං. ප්‍රමිති ආයතනය විසින් පවත්වන ලද යළි-සහතිකකරණ (රු-ජැරඑසසෙප්එසදබ) විගණනය	0	-	01	-
කළමනාකරණ සමාලෝචන රැස්වීම්	02	02	02	02

ප්‍රසම්පාදන අංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රසම්පාදන අංශය පිහිටුවන ලද්දේ මුදලට නිසි වටිනාකම එක් කරමින් විනිවිදභාවයකින් හා වගවීමෙන් යුතුව සියලුම ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවීම සඳහාය. මේ සඳහා මෙම අංශය විසින් මෙම සමාලෝචනයට ලක් වන වසර තුළ පහත කාර්භාරයන් ඉටු කර ඇත:

- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහා අවශ්‍ය භාණ්ඩ, සේවා, වැඩ සහ උපදේශන සේවා සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු ඉටු කිරීම.
- සැපයුම්කරුවන් වාර්ෂිකව ලියාපදිංචි කිරීම යාවත්කාලීන කිරීම.
- සැපයුම්කවරුවන් සඳහා ගෙවිය යුතු මුදල් පියවීම.
- කාර්යමණ්ඩලය සඳහා නිල ඇඳුම් හා අනෙකුත් උපකරණ ලබා දීම.
- පුහුණු මධ්‍යස්ථාන සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම.
- ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සඳහි අවශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම.

මේ වන විට මෙම අංශය තංගල්ල, මතුගම, රත්නපුර හා හාලි-ඇල යන ප්‍රදේශවල විගමණික සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් සිටියි.

රත්නපුර සහ බදුල්ල සඳහා යෝජිත සංක්‍රමණික ශ්‍රමික සම්පත් මධ්‍යස්ථාන

ගමනාන්තයන්හි අවශ්‍යතා ඉටු කිරීම හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ ප්‍රධාන කාර්යාලයේ කාර්යභාරයන් විමධ්‍යගත කිරීම සඳහා විගමණික සම්පත් මධ්‍යස්ථාන පිහිටුවන ලද අතර විදේශීය හවුල්කරුවන් සමග එක්ව විවිධ රැකියාවන්ට සුවිශේෂයෙන් අදාළ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

රත්නපුර විගමණික මධ්‍යස්ථානය වැඩ නිම කිරීමෙන් අනතුරුව 2017 මාර්තු මාසයේදී විවෘත කිරීමට අපේක්ෂිතයි.



රත්නපුර යෝජිත විගමණික සම්පත් මධ්‍යස්ථානය



බදුල්ල යෝජිත විගමණික සම්පත් මධ්‍යස්ථානය

කතරගම යෝජිත සංචාරක බංගලාවේ තොරතුරු

ව්‍යාපෘති	ව්‍යාපෘති ආරම්භ වන දින	ව්‍යාපෘතිය සම්පූර්ණ වන දින	ඇස්තමේන්තුගත පිරිවැය රු. (VAT බදු එකතු නොකර)
විදෙස් ශ්‍රමිකයන් සඳහා වන සංචාරක බංගලාව	03.05.2016	27.04.2017	38,494,623.13
කාර්යාංශයේ නිලධාරීන් සඳහා වන සංචාරක බංගලාව	04.04.2016	25.04.2017	55,888,487.77
විශේෂ අමුත්තන් සඳහා වන සංචාරක බංගලාව	18.04.2016	20.01.2017	32,515,493.64



කතරගම යෝජිත සංචාරක බංගලාව

ප්‍රචාරක හා මහජන සම්බන්ධතා අංශය

ප්‍රචාරක හා මහජන සම්බන්ධතා අංශයේ ප්‍රධාන කායර්භාරය වන්නේ ප්‍රසිද්ධිය හා දැනුවත්භාවය ඇති කිරීම හා විදේශ රැකියා සඳහා පිටත්ව යාමට අපේක්ෂා කරන පුද්ගලයින් සහ සාමාන්‍ය මහජනතාව දැනුවත් කිරීම සඳහා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා තොරතුරු ලබා දීමයි. මේ සඳහා මෙම අංශය මාධ්‍ය වෙත පුවත් වාර්තා ලබා දීම, පුවත්පත් ලිපි පළ කිරීම, විශේෂ අවස්ථාවල ඡායාරූප ප්‍රදර්ශනය කිරීම, මාධ්‍ය නිවේදන නිකුත් කිරීම, පුවත්පත් දැන්වීම් පළ කිරීම, ජංගම සේවා පැවැත්වීම, ප්‍රසිද්ධ සම්මන්ත්‍රණ, බැනර්, පෝස්ටර්, අත්පත්‍රිකා හා ග්‍රැෆික් සැලසුම් කිරීම ආදී කාර්යයන් ඉටු කරයි.

2016 දී පවත්වන ලද ක්‍රියාකාරකම් සාරාංශය

කාර්යය	මුළු ගණන
පුවත්පත් දැන්වීම්	41
රූපවාහිනී දැන්වීම්	05
ගුවන්විදුලි දැන්වීම්	05
දැනුවත් කිරීමේ වැඩසටහන්	03
විදේශ වැඩසටහන් සඳහා මාධ්‍ය ආවරණය ලබා දීම	70



මෙම අංශය විසින් සංවිධානය කරන ලද මාධ්‍ය හමුවක්



ගරු අමාත්‍යතුමියගේ ඕමාන හා කටාර් සංචාරය වාර්තා කිරීම

පර්යේෂණ අංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පර්යේෂණ අංශය කාර්යාංශයේ අරමුණු හා ඉලක්ක සකස්කර ගැනීමේදී විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පර්යේෂණ සහ අධ්‍යයන කටයුතු සිදු කරමින් ප්‍රමුඛ භූමිකාවක නියැළී ඇත.

2016 දී පර්යේෂණ අංශය විසින් පහත පර්යේෂණ සිදු කර ඇත:

ශ්‍රී ලංකාවට පෙරළා පැමිණෙන ශ්‍රමිකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල යහපැවැත්ම පිළිබඳ අධ්‍යයනය

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ විදේශ රැකියාවල නිරතව සිට පැමිණි ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ යහපැවැත්ම විමර්ශනය කිරීමයි. මෙම අධ්‍යයනයේ නියැදිය වශයෙන් කළුතර දිස්ත්‍රික්කයේ ශ්‍රමිකයන් 600 ක් තෝරාග ැනුණු අතර ප්‍රශ්නමාලා හා කණ්ඩායම් සාකච්ඡා යන ක්‍රමවේද හරහා දත්ත රැස් කරන ලදී.

ගෘහ සේවිකාවන් වශයෙන් කාන්තාවන් විදෙස් රැකියා සඳහා පිටත්ව යාමට බලපාන මූල්‍ය නොවන අවශ්‍යතා

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වූයේ කාන්තාවන් ගෘහ සේවිකා රැකියා සඳහා විදේශ රටවලට පිටත්ව යාමට බලපාන ආර්ථික නොවන සාධක අධ්‍යයනය කිරීමයි. නියැදියක් වශයෙන් කාන්තා සේවිකාවන් 156 දෙනෙකු තෝරාගන්නා ලද අතර දත්ත රැස්කිරීම සඳහා ප්‍රශ්නමාලා ක්‍රමය යොදා ගැනුණි.

ඉතුරු කිරීමේ හා මුදල් ප්‍රේෂණය කිරීම් වැඩිදියුණු කිරීම

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ 2012/2013 කුටුම්භ ආදායම හා වියදම් සමීක්ෂණයේ නවතම දත්ත යොදා ගනිමින් සමාලෝචන හා විශ්ලේෂණ සිදු කොට පවතින අධ්‍යයන පරාසය යාවත්කාලීන කිරීමයි.

මීට අමතරව, මෙම අංශය විසින් පර්යේෂණ පුස්තකාලයක් පවත්වාගෙන යනු ලබන අතර සංඛ්‍යාන දත්ත හා තොරතුරු ලබා දීම මගින් අදාළ කරුණු කෙරෙහි උනන්දුවකින් පසු වන පුද්ගලයන් හා ආයතන අතර දැනුම බෙදාහදා ගනු ලබයි. 2016 වසරේදී පර්යේෂණ අංශය විසින් නිලධාරීන්ගේ කියවීමේ කුසලතාව වර්ධනය කිරීමට පොත් ප්‍රදර්ශන 04 ක් පවත්වන ලදී.





බේරුවල ප්‍රදේශයේ පැවැති කණ්ඩායම් සාකච්ඡාවක්

ප්‍රවාහන අංශය

ප්‍රවාහන අංශයේ ප්‍රධාන අරමුණ වන්නේ පහත කාර්යභාරයන් ඉටු කිරීම තුළින් කාර්යාංශයේ දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය දායකත්වය ලබා දීමයි:

- ඒ ඒ අංශවල මෙහෙයුම් කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් පත් කරනු ලබන අංශ ප්‍රධානීන්ට හා අවශ්‍ය කාර්ය මණ්ඩලයට ප්‍රවාහන පහසුකම් ලබා දීම.
- 2016 වසරේදී මෙහෙයුම්වල යොදවා තිබූ වාහන 84ක් සහ කුලී පදනම මත ලබා ගත් වාහන 20 ක් ප්‍රවාහන අංශය සතුව තිබූ අතර වර්ෂය තුළදී එකී වාහන කිසිවක් භාවිතයෙන් ඉවත් කිරීමකට හෝ අත්පත් කර ගැනීමට ලක් නොවුණි.

විගණකාධිපති ජනරාල්ගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. | විවිවයි/ඩී/එස්එල්බීඑෆ්ඊ/01/16/20 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date | 2018 ජනවාරි 29 දින

සභාපති

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) සී වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හා එහි පරිපාලිත සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 18 (3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) සී වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 නත්ත්වාගණනය කළ මතය - සමුහය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

නත්ත්වාගණනය කළ මතය - කාර්යාංශය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුව, පාරිතෝෂික වගකීම සතු ආයෝජනයක් පවතී නම් අදාළ ආයෝජනය සම්බන්ධයෙන් සාධාරණ අගය ගැලපීමක් සිදුකර සත්‍ය ප්‍රතිලාභය හා අපේක්ෂිත ප්‍රතිලාභය අතර වෙනස, ආයුගණක තක්සේරුව මත ගණනය කරන ලද ලාභය හෝ පාඩුව ලෙස හඳුනාගත යුතු ය. එහෙත් කාර්යාංශය විසින් පාරිතෝෂික වගකීම සඳහා කරන ලද ආයෝජනයේ 2016 දෙසැම්බර් 31 දිනට වූ රු.151,637,722 ක වටිනාකමට අදාළ සාධාරණ අගය ගැලපීමක් සිදු කර නොතිබුණු අතර එම ආයෝජන වටිනාකම ආයුගණක තක්සේරුවේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම් විෂයයන් 02 ක පිළිවෙලින් රු.2,453,136 ක හා රු.21,140,548 ක පැහැදිලි නොකල ශේෂ ඇතුළත්ව තිබූ නමුත් එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගමනිකයින්ගේ පැමිණිලි /ආරවුල් සමනුයකට පත්කිරීම සඳහා නියෝජිත ආයතන විසින්, සමාලෝචිත වර්ෂය අවසානයට කාර්යාංශයේ තැන්පත් කර තිබූ ශේෂය රු.10,120,447 ක් වූ අතර ඒ තුළ 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු.6,788,954 ක ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට වන්දි ගෙවීම සඳහා කාර්යාංශයට ලැබී තිබූ රු.4,781,403 ක මුදලින් 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු.939,510 ක් විවිධ හේතූන් මත 2016 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ පාර්ශවයන්ට නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි.

(ඇ) විදේශ දූත මණ්ඩල සුභ සාධන අංශ විසින් 2006 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව රැස්කර කාර්යාංශය වෙත ප්‍රේෂණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ලබා දී තිබූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තු රු.2,622,815,725 කින් රු.953,461,366 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් කාර්යාංශය වෙත ලැබී නොතිබුණි.

(ඈ) 2000 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලයට අදාළව විදේශ රැකියා නියෝජිත ආයතන 84 කින් අයකර ගත යුතු රු.658,250 ක සෙස් බදු 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි.

(ඉ) 2013 වර්ෂය හා 2014 වර්ෂයට අදාළ සංවර්ධන නිලධාරීන්ගේ දුරකථන බිල්පත් නිරවුල් කිරීමට අදාළව රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.3,213,783 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගුවන් තොටුපල ඒකකය මගින් කාර්යාංශ ලියාපදිංචිය ලබාදීමේදී අයවිය යුතු සම්පූර්ණ ගාස්තුව නොගෙවූ විගමණිකයන්ගෙන් ලැබිය යුතු රු.602,759 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(උ) කාර්යාංශයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන ඕමාන් තානාපති කාර්යාලය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 2013 වර්ෂයේ සිට ලැබිය යුතු රු.52,270,080 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද අපොහොසත් වී තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට වූ රු.37,172,298 ක් වූ විවිධ ණය හිමි ශේෂය තුළ 2012 වර්ෂයේ සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු.24,317,124 ක් වූ ශේෂ 2017 ජුනි 30 දින වන විටත් නිරවුල් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(එ) 2015 වර්ෂයේ දී අයකරගන්නා ලද කොරියන් වීසා තැන්පතු රු.730,200 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) කොරියන් ප්‍රවේශපත්‍ර ගාස්තු වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළව අයකර ගෙන තිබූ රු.89,184,454 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් කොරියන් රැකියා අයදුම්කරුවන් වෙත නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) සේවක ණය සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවට අනුව, 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිටි තිබූ වර්ෂයක කාලය ඉක්මවන ලද ආපදා සහ වාහන ණය ශේෂය රු.2,222,165 ක් වූ අතර එය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම්
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මුදල් රෙගුලාසි 371	අතුරු අග්‍රිම වශයෙන් ලබාගත් අත්තිකාරම්, නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකල යුතු වුවත් ඊට පටහැනිව 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලබාදුන් රු.7,559,410 ක් වූ අග්‍රිම අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි.
	(ii) මුදල් රෙගුලාසි 571	ආපසු ගෙවිය යුතු රු.1,875,084 ක් වූ ටෙන්ඩර් තැන්පතු ශේෂය තුළ වර්ෂ 05 ක් ඉක්ම වූ රු.578,680 ක තැන්පතු රජයේ ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
	(iii) මුදල් රෙගුලාසි 757 (2)	2014 වර්ෂයේ වත්කම් සත්‍යාපනයේ දී හඳුනාගන්නා ලද උපකරණ අයිතම් 2106 ක අස්ථානගතවීම් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	කාර්යාංශය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් විධිමත්ව පවත්වා නොතිබුණි.
(ඇ)	2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2017 නොවැම්බර් 24 දින වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඇ) 2014 නොවැම්බර් 22 දිනැති අංක PRE/2015/43 දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 (i) ඡේදය

චක්‍රලේඛයට පටහැනිව බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල මැතිවරණ කාල සීමාව තුළ රටවිරූ සංවිධාන වැඩසටහන් සඳහා යොදවා ගැනීමට කුලී පදනම මත ලබාගත් වාහන වෙනුවෙන් 2016 වර්ෂයේ දී රු.2,858,641 ක් ගෙවා තිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් කාර්යාංශ නිලධාරීන් සඳහා පැමිණීමේ දීමනා, මාසික ඉලක්ක සපුරා ගැනීමේ දීමනා, ගුවන් තොටුපල ඒකකයේ නිලධාරීන්ට කරන ලද ගෙවීම්, පැය 24 පුරා ක්‍රියාත්මක විගමණික තොරතුරු මැදිරියේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා විශේෂ දීමනා ගෙවීම් හා අවදානම් දීමනා ලෙස රු.64,491,839 ක විවිධ දීමනා ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමුහයේ සහ කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.944,363,600 ක් සහ රු.942,355,085 ක ලාභයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ ලාභ පිළිවෙලින් රු.884,713,213 ක් සහ රු.883,817,095 ක් වුයෙන් ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ සමුහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.59,650,387 කින් සහ රු.58,537,990 කින් වර්ධනය වී තිබුණි. මෙහෙයුම් හා මූල්‍ය ආදායමේ රු.622,757,544 කින් වැඩිවීම හා ප්‍රචාරණ වියදමේ හා සුබසාධන අරමුදලේ වෙනත් වියදම් රු.44,714,891 කින් අඩුවීම ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ශුද්ධ ලාභයේ වර්ධනයක් සිදුවී තිබුණ ද එය 2015 වර්ෂයේදී සුළු වශයෙන් අඩුවීමක් සිදුවී තිබුණි. එහෙත් 2016 වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 57.5 ක වර්ධනයක් විය. තවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික රජයට ගෙවූ බදු හා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.1,252,718,830 ක් වූ කාර්යාංශයේ දායකත්වය

සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,640,624,061 ක් දක්වා වර්ධනය වී තිබුණු අතර 2015 වර්ෂයට සාපේක්ෂව එය සියයට 50ක වර්ධනයක් විය.

3.2 කාර්යාංශයට එරෙහිව හෝ කාර්යාංශය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

බාහිර හා අභ්‍යන්තර පාර්ශවයන් විසින් කාර්යාංශයට එරෙහිව සමාලෝචිත වර්ෂයේ අවසානයට නඩු 13 ක් ගොනු කර තිබු අතර කාර්යාංශය විසින් ඒ සඳහා රු.73,766,962 ක් අසම්භාව්‍ය බැරකම් ලෙස හඳුනාගෙන තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශය වෙත කරනු ලැබූ පැමිණිලි සම්බන්ධයෙන් සිදුකල විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබී තිබූ පැමිණිලිවලින් 2,267 ක් 2016 ජනවාරි 01 දින වන විට නොවිසඳී තිබුණු අතර වර්ෂය අවසානය වන විට ඉන් 244 ක් තවදුරටත් නොවිසඳී තිබුණි.

(ii) 2016 වර්ෂය තුළ ලැබූ පැමිණිලි 5,686 න් පැමිණිලි 2,320 ක් හෙවත් සියයට 41 ක් සඳහා පමණක් විසඳුම් ලබා දී තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂය තුළ පැමිණිලිකරු තවදුරටත් ක්‍රියාත්මකවීම අනවශ්‍ය ලෙස දැන්වීමෙන් හා පැමිණිලිකරුවන් විසින්ම ලිපි ගොනුව වසා දැමීමට තීරණය කර ඇති පැමිණිලි ප්‍රමාණය 1,911 ක් විය. ඒ අනුව විසඳීමකින් තොරව ලිපිගොනු වසා දැමීම හා පැමිණිලිකරු විසින් තවදුරටත් ක්‍රියාත්මකවීම අනවශ්‍ය ලෙස දැන්වීමෙන් වසා දැමීමට තීරණය කල පැමිණිලි 2,274 ක් විසඳූ පැමිණිලි ලෙස වාර්තා කර තිබූ අතර එය විධිමත් නොවන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, එම පැමිණිලි සම්බන්ධයෙන් අධ්‍යනය කර සත්‍ය වශයෙන්ම තවදුරටත් ගැටළුවක් පවතින්නේද යන්න පරීක්ෂා කර බැලීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(iv) පැමිණිලි සඳහා ලබා දී තිබූ විසඳුමක් ලෙස " විගමණික සේවකයා ආපසු ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම " යන්න සඳහන්ව තිබුණ ද එලෙස ගෙන්වා ගත් විගමණිකයන් ගණන 2,016 ක් විය. ඒ අනුව වර්ෂයේ විසඳා ඇති පැමිණිලි 5,686 න් 2,016 ක්ම සේවකයා නැවත ලංකාවට ගෙන්වා ගැනීමෙන් පමණක් විසඳුම් ලබා දී තිබූ ඒවා වූ අතර එවැනි ගැටළු නැවත ඇති නොවීමට ස්ථිරසාර පිළියම් යෙදීම කෙරෙහි අවධානය යොමු කරන ක්‍රමවේදයක් ගොඩනැගීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.

(ආ) කාර්යාංශ පනතේ 30 වගන්තිය යටතේ බලපත්‍රයක් අලුත් කිරීමේ දී එහි 28 වගන්තියේ වූ විධි විධාන පිළිපැද ඇති බවට කාර්යාංශය සෑහීමකට පත්විය යුතු අතර පනතේ 31 වගන්තිය යටතේ එකී විධිවිධාන කිසිවක් කඩකර ඇත්නම් බලපත්‍රය අවලංගු කිරීමටද හැකි බව දක්වා තිබුණි. නමුත් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන 27 ක් සම්බන්ධයෙන් වසර දෙකක ලද පැමිණිලි හා විදේශගතවීම් පරීක්ෂාවේ දී නියෝජිත ආයතනවල පැමිණිලිවල වැඩිවීමක් හා වසර දෙකක විදේශගතවීම් අඩුවීමට වඩා අඩු ප්‍රතිශතයකින් පැමිණිලි ලැබීම් අඩු වී තිබුණු අතර සමහර අවස්ථාවලදී විදේශගතවීම් වැඩි වී තිබුණද ඊට වඩා වැඩි ප්‍රතිශතයකින් පැමිණිලිවල වැඩිවීමක් නිරීක්ෂණය විය. එමනිසා කාර්යාංශය උක්ත පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළේද යන්න විගණනයේ දී ගැටළුකාරී විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සහ කාර්යාංශයේ සහයෝගිතාවයෙන් විගමණික සේවකයන් සඳහා ක්‍රියාත්මක වූ නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ විගමණිකයන් 10,264 දෙනෙකු සඳහා සමෘද්ධි බැංකුව මගින් රු.මිලියන 2,998ක ණය මුදලක් ලබා දී තිබූ අතර මේ වන විට එම යෝජනා ක්‍රමය අකර්මන්‍ය වී තිබුණි. ඉන් සියයට 26 ක් වූ විගමණිකයින් 2,674 දෙනෙකු වෙත ලබා දී තිබූ රු.මිලියන 610.14 ක (සියයට 20ක) ණය ආපසු ගෙවීම් පැහැර හැර තිබුණි. තවද විගමණිකයන් 1573 දෙනෙකු වෙත ණය ලබාදීමේ කොන්දේසිවලට පටහැනිව හා කිසිදු ඇපයක් තබා නොගෙන මුළු ණය ප්‍රමාණයෙන් සියයට 12 ක් හෙවත් රු.මිලියන 360.27 ක ණය ලබා දී තිබුණි. තවද, කාර්යාංශය විසින් උක්ත කාර්ය සඳහා සමෘද්ධි අධිකාරියේ තැන්පත් කරන ලද රු.මිලියන 100 ක තැන්පතු මුදලේ පොළියද 2014 වර්ෂයේ සිට ලැබී නොතිබුණි.

(ආ) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අබුඩාබි කාර්යාලයේ 2014 ජුනි මාසයේ සිදු වී තිබූ රු.1,058,276 ක මූල්‍ය අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට 2014 ජුනි 17 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් යොමු කර වර්ෂ තුනකට වැඩි කාලයක් ගත වී තිබුණ ද එහි සැලකිය යුතු ප්‍රගතියක් විගණනයේ දී නිරීක්ෂණය නොවිණි. මේ සම්බන්ධයෙන් කාර්යාංශය විසින් විධිමත් ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.

(ඇ) කාර්යාංශය විසින් අවස්ථා 101 කදී විවිධ කාර්යන් සඳහා ලබා දී තිබූ රු.2,822,750 ක අත්තිකාරම් මුදලින් රු.1,762,741 ක්, එනම් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීමෙන් තොරව නැවත කාර්යාංශය වෙත පියවා තිබුණි. ඒ අනුව අත්තිකාරම් මුදල් නිසි කළමනාකාරීත්වයකින් යුතුව ලබා දී ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවිය.

(ඈ) ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 95 ක් වූ සී/ස කහගොල්ල ඉංජිනේරු සේවා සමාගමකට අයත් ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගැනීම සඳහා කාර්යාංශය විසින් 2013 වර්ෂයේ රු.මිලියන 20 ක අත්තිකාරමක් සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ගෙවා තිබුණි. 2013 ජනවාරි 17 දිනැති අංක 10/2013 (M-01) දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව ගොඩනැගිලිවල හා ඉඩමේ නිරවුල් භුක්තිය භාරගන්නා ලෙස කාර්යාංශය වෙත දන්වා තිබුණද 2017 ඔක්තෝබර් වන විටත් ඉඩමේ නිරවුල් භුක්තිය ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඉ) කාර්යාංශය විසින් තංගල්ල හා කුරුණෑගල ඉඩම් සංවර්ධනය කිරීමේ කටයුතු වෙනුවෙන් රු.309,600,107 ක් වැය කර තිබුණු නමුත් 2017 ඔක්තෝබර් වන විටත් එම ඉඩම් කාර්යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිටිපන මාහේනවත්තේ පිහිටි අක්කර 05 ක ඉඩම් ප්‍රමාණයක් අවු.50 ක කාලයකට බදු පදනම මත ලබා දීමට 2010 නොවැම්බර් 03 දින තීරණය කර තිබුණි. 2010 ජනවාරි 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර තක්සේරු කමිටුව විසින් රු.මිලියන 52 කට තක්සේරු කර එම මුදලින් සියයට 50 ක් වූ රු.මිලියන 26 ක් කාර්යාංශය විසින් 2010 පෙබරවාරි 26 දින ගෙවා ඉඩමෙහි භෞතික අයිතිය කාර්යාංශය වෙත පවරාගෙන තිබුණි. මෙම ඉඩම සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරු ලවා තක්සේරුවක් ලබා ගැනීමෙන් තොරව සියයට 50 ක ගෙවීම් සිදුකර තිබුණු අතර 2017 දෙසැම්බර් 04 දින දක්වාම එම ඉඩමේ

නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට හා අදාළ කාර්යය සඳහා යෙදවීමට ක්‍රියාකර නොතිබුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්යාංශයේ පරමාර්ථ අතරට ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම ඇතුළත්ව තිබූ නමුත් 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාර්යාංශය වෙත අනුමත කිරීම සඳහා ලැබී තිබූ රැකියා ඇණවුම් ප්‍රමාණයෙන් සියයට 50 ක් සඳහාවත් ශ්‍රමිකයන් සැපයීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.

(ආ) 2008 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ විදේශ රැකියා ඇණවුම්වල පහල යාම සියයට 40 ක් වූ අතර 2013 වර්ෂයේදී එය සියයට 21 කින් වර්ධනය වී තිබුණි. එහෙත් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එය ක්‍රමයෙන් පහළ ගොස් තිබූ අතර එය 2014 වර්ෂයට සාපේක්ෂව සියයට 34 ක් විය. ඒ අනුව, 2008 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ රැකියා වෙළඳපල අහිමිවීම සියයට 73 ක් විය. 2008 වර්ෂයේ දී සියයට 16 ක් වූ ශ්‍රමික සම්පාදනය 2016 වර්ෂය වන විට සියයට 32 ක් දක්වා වර්ධනය වීමක් පෙන්නුම් කළද, එය කාර්යාංශයේ කාර්ය සාධනයේ උන්නතියක් නිසා සිදුවුවක් නොව විදේශ රැකියා වෙළඳපලේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා පැවති ඉල්ලුම හීන වීම නිසා බව විගණනයේ දී නිරීක්ෂණය විය.

(ඇ) පුහුණු ශ්‍රමිකයින් වැඩි වශයෙන් විදේශ රැකියා වෙළඳපල වෙත යොමු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියන් දැනුවත් කිරීම සඳහා රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කර ගනිමින් ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත එම දිස්ත්‍රික්කවලින් සම්බන්ධීකරණ නිලධාරීන් පිළිවෙලින් 06 දෙනෙකු සහ 04 දෙනෙකු බඳවාගෙන තිබුණි. 2016 වර්ෂයේදී රු.30,000 ක දීමනාවක් මත බඳවාගෙන තිබූ එම නිලධාරීන් 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඡේද අංක 07 හි නියමයන්ට පටහැනිව බඳවා ගෙන තිබූ අතර ඒ සඳහා 2016 දෙසැම්බර් 31 දින දක්වා රු.2,344,000 ක වියදමක් කාර්යාංශය විසින් දරා තිබුණි. එහෙත් එම නියමු ව්‍යාපෘතියේ කාල සීමාව අවසන්ව තිබුණද ඊට අදාළ ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ කිසිදු පසු විපරමක් කාර්යාංශය විසින් සිදු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යවරිය විසින් සිංගප්පුරුවේ දී ලබාගත් වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් වැය වූ සිංගප්පුරු ඩොලර් 989.25 ක මුදල (ආසන්න වශයෙන් රු.102,993 ක්) කාර්යාංශයේ සුභ සාධන අරමුදලින් දැරිය නොහැකි වුවද එම මුදල වෙනත් නිලධාරියෙකු නමින් අමාත්‍යවරිය වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි.

4.4 නිශ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අපහරණය කිරීමට නියමිතව ඇති කාර්යාංශයේ වාහන 27 ක් 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වසා දැමූ පුහුණු මධ්‍යස්ථානවල තිබූ භාණ්ඩ අයිතම් 07 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

4.5 ආර්ථික නොවන ගනුදෙනු

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා පිටව යන හා සේවා නියුක්තියෙන් පසු පෙරලා රටට පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් පිහිටුවා පවත්වාගෙන යාමට කාර්යාංශය කටයුතු කර තිබුණි. ඒ අනුව, 2016 ජනවාරි 08 සිට 14 දක්වා වූ කාල සීමාව තුළ දී ලියාපදිංචිය සිදුකිරීම සඳහා ක්‍රියාත්මක කල ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කාර්යාංශය රු.8,274,964 ක් වැය කර තිබුණි.

කෙසේ වුවද, එම කාල සීමාව තුළදී 2014 හා 2015 වර්ෂවල විදේශගත වූ ශ්‍රමිකයින් 563,768 ගෙන් සියයට 25 ක තරම්වත් වූ ප්‍රමාණයක් උක්ත දත්ත බැංකුවේ ලියාපදිංචි වීම සිදු වී නොතිබුණි. ඒ අනුව ඒ සඳහා දරන ලද වියදම් ඵලදායී නොවන බව විගණනයේ දී නිරීක්ෂණය විය.

4.6 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රේඛීය අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබූ විදේශ ගමන් සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද රු.463,481 ක් අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් තොරව සිදු කර තිබීම හේතුවෙන් අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ආ) කාර්යාංශ පනතේ 53(3) වගන්තියෙන් බැහැරව කාර්යාංශය විසින් නම් කරනු ලැබූ විදේශ රැකියා නියෝජිත ආයතනයන් හරහා ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට ඉඩ සලසමින් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි. ඒ හේතුවෙන් ලියාපදිංචි ගාස්තු ලෙස කාර්යාංශය විසින් 2015 සහ 2016 වර්ෂවල රැස්කර ගන්නා ලද ආදායමින් සියයට 70 ක් එනම් පිළිවෙලින් රු.31,612,000 ක් හා රු.91,623,000 ක් ලෙස එකතුව රු.123,235,000 ක් එසේ නම් කරනු ලැබූ පෞද්ගලික නියෝජිත ආයතනවලට ගෙවීමට කටයුතු කර තිබීමෙන් කාර්යාංශයට එම ආදායම අහිමි වී තිබුණි.

(ඇ) කොරියානු රැකියාලාභීන්ගේ වෛද්‍ය පරීක්ෂණයන් සිදු කිරීම සඳහා අවශ්‍ය වන පරිපාලන සේවාවන් ලබාදීමේ කටයුතු වෙනුවෙන් අදාළ මාසයේ වෛද්‍ය ගාස්තු ආදායමින් සියයට 25 ක් කාර්යාංශය පරිපාලිත සමාගම වෙත ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ සමාගම රු.9,507,988 ක ආදායමක් උපයාගෙන තිබූ නමුත් අදාළ සියලු පරිපාලන කටයුතු කාර්යාංශයේ බලවා ගැනීම් අංශය විසින් සිදු කර තිබුණි.

4.7 වෙනත් ආයතන වෙත ලබා දුන් කාර්යාංශයේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය තුළ කාර්යාංශය විසින් රේඛීය අමාත්‍යාංශය වෙත නිලධාරීන් 07 දෙනෙකු හා පරිපාලිත සමාගම වෙත නිලධාරීන් 03 දෙනෙකු සේවය සඳහා යොදවා තිබූ අතර වැටුප් හා දීමනා ලෙස රු.5,308,240 ක් කාර්යාංශය විසින් වැය කර තිබුණි. මීට අමතරව සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය වෙත නිලධාරීන් දෙදෙනෙකු නිදහස් කර තිබුණි.

(ආ) කාර්යාංශය විසින් 2016 වර්ෂය තුළ විදේශ රැකියා අමාත්‍යාංශයේ කටයුතු සඳහා වාහන 04 ක් වෙන් කර තිබූ අතර ඒ වෙනුවෙන් රු.3,292,242 ක වැයකර තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1248 ක් වූ අතර මාණ්ඩලික ශ්‍රේණියේ, මාණ්ඩලික නොවන ශ්‍රේණියේ සහ වෙනත් යන කාණ්ඩවල පිළිවෙලින් නිලධාරීන් 81, 38 හා 11 ක ඌනතාවයක් වූ අතර සුළු සේවකයින් 46 ක අතිරික්තයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අනුමත නොවූ තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 44 දෙනෙකු වෙනුවෙන් රු.17,892,771 ක වැටුප් ගෙවා තිබුණි.

(ඇ) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දූත මණ්ඩල සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කර ඇති තනතුරුවලට අනුමත බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව කාර්යාංශය විසින් සකසාගත් බඳවා ගැනීමේ ක්‍රම වේදයකට බඳවා ගැනීම් සිදු කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

	පද්ධති හා පාලන ක්ෂේත්‍ර		නිරීක්ෂණ
(අ)	ගිණුම්කරණය	(i)	කාර්යාංශයට ලැබිය යුතු හා කාර්යාංශය විසින් ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් පැවතීම.
		(ii)	විදේශ දූත මණ්ඩල මගින් උපයා ගනු ලබන ආදායම් රැස්කර ගැනීම හා ඵලදායී ලෙස

විගමණික ශ්‍රමිකයන්ට එම මුදල් සේවාවන් සැපයීම සඳහා ප්‍රයෝජනයට නොගැනීම.

(ආ) මෙහෙයුම් පාලනය

(i) ඉඩම් මිලදී ගැනීමේ දී විධිමත් අයිතිය පිළිබඳ තහවුරු කර ගැනීමකින් තොරව මිලදී ගැනීමට කටයුතු කිරීම.

(ii) විදේශ රැකියා නියෝජිත ආයතනවල කටයුතු ක්‍රමවත් කිරීම හා පාලනය කිරීමට කටයුතු නොකිරීම.

(ඇ) මානව සම්පත් පාලනය

කාර්යාංශය සතු භෞතික හා මානව සම්පත් පාලනය හා උපයෝජනය විධිමත්ව සිදු නොවීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.

සභාපතිතුමාගේ සමීක්ෂණ වාර්තාව

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

විගණකාධිපතිගේ වාර්තාව	වර්තමාන තත්ත්වය
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හා එහි පරිපාලිත සමාගමේ 2016 දෙසැම්බර් 31දිනට මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සරාංශයකින් සමන්විත2016 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශන 1971අංක 38දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985අංක 21දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 18(3)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි .මුදල් පනත 14(2) (සී)වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ . **1 .2.මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම** --- මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ	

මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ .මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තරවිගණන ප්‍රමිති වලට (ISSAI 1000 – 1810) අනුරූපශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී .ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශනප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ .තෝරාගත් පරිපාටීන් ,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්විගණකගේ විනිශ්චය මත පදනම් වේ .එම අවදානම් තක්සේරුකිරීම්වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි .කළමනාකරණය විසින්

අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ . විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971අංක 38දරන මුදල් පනතේ 13වගන්තියේ (3)හා (4)උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2 මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සහ එහි පරිපාලිත සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

තත්ත්වාගණනය කළ මතය - කාර්යාංශය --- මෙම වාර්තාවේ 2.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. **2 .2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම** --- **2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුව,පාරිතෝෂික වගකීම් සතු ආයෝජනයක් පවතී නම් අදාළ ආයෝජන සම්බන්දයෙන් සාධාරණ අගය ගැලපීමක් සිදුකර සත්‍ය ප්‍රතිලාභය හා අපේක්ෂිත ප්‍රතිලාභය අතර වෙනස,ආයුගණක තක්සේරුව මත ගණනය කරන ලද ලාභය හෝ පාඩුව ලෙස හඳුනාගත යුතුය. එහෙත් කාර්යාංශය විසින් පාරිතෝෂික වගකීම සඳහා කරන ලද ආයෝජනයේ2016 දෙසැම්බර් 31 දිනට වූරු.151,637,722 ක වටිනාකමට අදාල සාධාරණ අගය ගැලපීමක් සිදු කර නොතිබුණු අතර එම ආයෝජන වටිනාකම ආයුගණක තක්සේරුවේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 ට අනුව පාරිතෝෂික වගකීම් සතු ආයෝජන සඳහා සාධාරණ අගය ගැලපීමක් සිදුකර 2017 වර්ෂයේ අදාල හෙලිදරව් කිරීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.

2.2.2ගිණුම්කරණ අඩුපාඩු --- සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ගිණුම් විෂයන් 02 ක පිළිවෙලින් රු.2,453,136 ක හා රු.21,140,548 ක පැහැදිලි නොකල ශේෂ ඇතුලත්ව තිබූ නමුත් එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2015 වර්ෂයට පෙර දක්වා ඇති ගිණුමෙහි (අත්තිකාරම් ගිණුම) පැවති රු.2,453,136 ක වෙනස ප්‍රමාණවත් තොරතුරු නොවීමෙන් හඳුනාගැනීමට නොහැකි වී ඇත. සමාලෝචිත වර්ෂයේ ගණුදෙනුවලදී එවැනි වෙනසක් ඇති වී නැති බව සඳහන් කරමි. අදාල වෙනස හඳුනාගැනීමට තවදුරටත් උත්සාහ කරනු ලැබේ. 2015 වර්ෂයට පෙර කොරියානු බදවාගැනීමේ ගාස්තු ගිණුමෙහි පවතින හඳුනානොගත් රු.21,140,548 ක වටිනාකමක් පවතී. සමාලෝචිත වර්ෂයේ ගණුදෙනුවලදී එවැනි වෙනසක් ඇති වී නැති බව සඳහන් කරමි. අදාල වෙනස හඳුනාගැනීමට තවදුරටත් උත්සාහ කරනු ලැබේ. 2017.12.31 දිනෙන් අවසන් වර්ෂය වන විට ඉහත ගිණුමෙහි පැවති හඳුනානොගත් වටිනාකම් රු.19,301,089.26 දක්වා අඩු වී ඇත.
2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් --- පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ. **(අ)** විගමනිකයින්ගේ පැමිණිලි/ ආරවුල් සමථයකට පත් කර ගැනීම සඳහා නියෝජිත ආයතන විසින් කාර්යාංශයේ කර තිබූ තැන්පත්වල සමාලෝචිත වර්ෂය අවසානයට ශේෂය රු. 10,120,447 ක් වූ අතර, 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාළ රු.6,788, 954 ක ශේෂය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි.	අ) විගමණිකයින්ගේ පැමිණිලි සමථයට පත්කිරීම සඳහා නියෝජිත ආයතන කාර්යාංශයේ තැන්පත් කර තිබූ වටිනාකම්න් 2005 වසරේ සිට 2015 දක්වා කාල පරිච්ඡේදයට අදාලව 2017.12.31 දිනට නිරවුල් නොවී පවතින වටිනාකම රු. 4,307,784.29 දක්වා අඩුවී ඇත. විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වලදීද මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල අතර මෙම වටිනාකම නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වන්දි ගෙවීම සඳහා කාර්යාංශයට ලැබී තිබූ රු.4,781,403 ක මුදලින් 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල රු.939,510 ක් විවිධ හේතූන් මත 2016 දෙසැම්බර් 31 දින වන විටත් අදාළ පාර්ශවයන්ට නිරවුල් කිරීමට නොහැකිවී නොතිබුණි.	ආ) 2005 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා කාල පරිච්ඡේදයට අදාල රු.939,510/- ක වටිනාකමක් විවිධ හේතූන් මත තවදුරටත් නිරවුල් නොකල වටිනාකමක් ලෙස පවතී. අදාල රක්ෂණ ලාභීන්ගේ තොරතුරුවල පවතින අසම්පූර්ණතාවය සුභ සාධන අංශය මගින් නිරාකණය කරදුන් පසුව අදාල ගෙවීම් කටයුතු සිදුකිරීමට අපේක්ෂා කරමි.
(ඇ) විදේශ දූත මණ්ඩල සුභ සාධන අංශ විසින් 2006 වර්ෂයේ සිට2013 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව රැස්කර කාර්යාංශය වෙත ප්‍රේෂණය කිරීම සඳහා මහා භාණ්ඩාගාරය වෙත ලබා දී තිබූ කම්කරු කොන්ත්‍රාත් ගිවිසුම් ගාස්තු රු.2,622,815,725 කින් රු.953,461,366 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් කාර්යාංශයට ලැබී නොතිබුණි.	ඇ) විදේශ දූත මණ්ඩල සුභ සාධන අංශය විසින් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර කාර්යාංශය වෙත ලැබිය යුතු මුදලින් රු.83,505,565.05 ක වටිනාකමක් 2017 වසර සඳහා කාර්යාංශය වෙත ලැබී ඇත. තවදුරටත් අයවිය යුතු වටිනාකම රු.869,955,801.22 ක් ලෙස සඳහන් කරමි. විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම් වලදීද මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල අතර අදාල මුදල් භාණ්ඩාගාරයට ගෙවියයුතු ලාභාංශ වලින් අඩුකර ගැනීමට අපේක්ෂා කරමි.
(ඈ) 2000 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාලයට අදාලව විදේශ රැකියා නියෝජිත ආයතන 84 කින් අයකර ගත යුතු රු.658,250 ක සෙස් බදු 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්යක් කාර්යාංශය විසින් ගෙන නොතිබුණි.	(ඈ) රැකියා නියෝජිත ආයතන වලින් 2017.12.31 දිනට තවදුරටත් අයවිය යුතුව පැවති ශේෂය රු.493,250 ක් වන අතර විදේශ රැකියා නියෝජිතායතන වෙත ගෙවනු ලබන ඒජන්සි භාගයේදී ආදල අයකර ගැනීම් සිදුකරමින් පවති.
(ඉ) 2013 වර්ෂය හා 2014 වර්ෂවලට අදාල සංවර්ධන නිලධාරින්ගේ දුරකථන බිල්පත් නිරවුල් කිරීමට අදාලව රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.3,213,783 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	(ඉ) 2017.12.31 වන දිනට රේඛීය අමාත්‍යාංශයෙන් ලැබිය යුතු සංවර්ධන නිලධාරීන්ගේ දුරකථන බිල්පත් වටිනාකම රු.11,055,414.11 ක් වන අතර 2013-2014 වර්ෂයන් සඳහා රු. 3,213,783.19 ක මුදලක් ලැබිය යුතු මුදලක් ලෙස මෙම ශේෂය තුල අන්තර්ගතවේ.

	භාණ්ඩාගරයෙන් සංවර්ධන නිලධාරීන්ගේ දුරකථන බිල්පත් ප්‍රතිපූර්ණයට අදාලව මුදල් වෙන්කර නොමැති බැවින් අදාල වියදම කාර්යාංශයේ වියදමක් ලෙස ගිණුම්ගත කරන ලෙස අමාත්‍යාංශ ලේකම්තුමා විසින් දැනුවත් කර ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් පසු 2018 වසරේදී අවශ්‍ය ගැලපීම් සටහන් තැබීමට කටයුතු කරනු ලැබේ.
(ඊ) 2008 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා ගුවන් තොටුපල ඒකකය මඟින් කාර්යාංශ ලියාපදිංචිය ලබාදීමේදී අයවිය යුතු සම්පූර්ණ ගාස්තුව නොගෙවූ විගමණිකයිනගෙන් ලැබිය යුතු රු.602,759 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට හෝ ඒ සම්බන්ධයෙන් වෙනත් සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කාර්යාශය කටයුතු කර නොතිබුණි.	(ඊ) අදාල විගමණිකයින් නැවත විදේශ ගතවීමේදී මෙම මුදල් අයකරන්නා බැවින් අයවීම් කටයුතු ඉතා සෙමින් සිදුවේ. 2017.12.31 වන දිනට තවදුරටත් අයකරගත යුතු වටිනාකම රු. 525,987 කි.
(උ) කාර්යාංශයට අයත් ගොඩනැගිල්ලක පවත්වාගෙන යනු ලබන ඕමාන් තානාපති කාර්යාල සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් 2013 වර්ෂයේ සිට ලැබිය යුතු රු.52,270,080 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදී ද අපොහොසත් වී තිබුණි.	(උ) මේ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම ඉල්ලීම්කර ඇතත් මේ දක්වා අදාල ගෙවීම් විදේශ කටයුතු අමාත්‍යාශයෙන් සිදුකර නොමැත.
(ඌ) සමාලෝචිත වර්ෂය අවසානය වූ රු.37,172,298 ක් වූ විවිධ ණය හිමි ශේෂය තුල 2012 වර්ෂයේ සිට 2015 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල රු.24,317,124 ක් වූ ශේෂ 2017 ජුනි 30 දින වන විටත් නිරවුල් කිරීමට හෝවෙනත් සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.	(ඌ) විවිධ ණය හිමි ශේෂය තුල අන්තර්ගත ශේෂයන්ගෙන් රු.22,996,225 ක් 2012 සිට 2015 වර්ෂයන්ට අදාල වුවද එම මුදල ගෙවිය යුතු ශේෂයන් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර ඇත්තේ 2016 වර්ෂයේදීය. ඉහත ගෙවියයුතු ශේෂයන් හඳුනාගෙන ගිණුම්ගත කලද නිරවුල් කිරීම කල හැක්කේ අදාල සේවාව සම්පූර්ණ කල බවට ප්‍රමාණවත් උපලේඛණ සහ අදාල අනුමැතීන් සමග මුදල් අංශයට

	ඉදිරිපත් කිරීමෙන් පසුවය.
(එ) 2015 වර්ෂයේ දී අයකරගන්නා ලද කොරියන් වීසා තැන්පතු රු.730,200 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	එ) කොරියන් වීසා තැන්පතු රු.730,200/- ක වටිනාකමින් තවදුරටත් නිරවුල් කිරීමට පවතින ශේෂය රු. 678,000කි. කොරියානු අංශය මගින් ප්‍රමාණවත් ලිපිලේඛන සහිතව මුදල් අංශය වෙත ඉදිරිපත් කරනු ලබන වවුවර් පත් සඳහා අදාල නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් කොරියානු අංශය සමග මුදල් අංශය සතුව ඇති උප ලේඛණ සැසඳීම් කිරීම සඳහා යොමුකොට ඇත.
(ඒ) කොරියානු ප්‍රවේශ ගාස්තු වෙනුවෙන් 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදයට අදාලව අයකර ගෙන තිබූ රු.89,184,454 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් කොරියන් රැකියා අයදුම්කරුවන් වෙත නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	ඒ) 2011 වසරේ සිට 2015 වසර දක්වා කාල පරිච්ඡේදයට අදාල කොරියානු ප්‍රවේශ ගාස්තු වටිනාකම් ගිණුමෙහි තවදුරටත් නිරවුල් කර ගැනීමට ඉතිරිව ඇති ශේෂය රු.19,301,089.26 කි. ඉහත ශේෂයෙන් තවදුරටත් නිරවුල් නොවී පවතින වටිනාකම 2018 වර්ෂයේ අවසන් ගිණුම් පිලියෙල කිරීමේදී ආදායමක් ලෙස ගිණුම්ගත කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇත.
(ඔ) සේවක ණය සම්බන්ධයෙන් කරන ලද නියැදි පරීක්ෂාවට අනුව 2016 දෙසැම්බර් 31 දිනට අයවීම් හිඟ හිටි තිබූ වර්ෂයක කාලය ඉක්මවන ලද ආපදා සහ වාහන ණය ශේෂය රු.2,222,165 ක් වූ අතර එය අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඔ) වර්ෂයක කාලයක් ඉක්මවා ඇති ඇතැම් නිලධාරින්ගේ ණය ශේෂයන් අය කර ගෙන ඇති අතර අයකර ගැනීමට නොහැකි වී ඇති අනෙක් නිලධාරින්ගේ ලිපි ගොනු ණය මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදු කිරීමට නීති අංශයට යොමු කර ඇත.

2.3 නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම --- පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.	
නීති ,රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව --- අනුකූල නොවීම ---	අ)
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ---	
(i) මුදල් රෙගුලාසි 371 අතුරු අග්‍රිම වශයෙන් ලබා ගත් අත්තිකාරම්, නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකල යුතු වුවත් ඊට පටහැනිව 2003 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලබා දුන් රු.7,559,410 ක් වූ අග්‍රිම අත්තිකාරම් මුදල් පියවා නොතිබුණි.	(i) මින් රු.182,500 ක් වටිනා අත්තිකාරම් 2003 සහ 2004 වර්ෂයන්ට අදාල වන අතර, ඒවා අයකර ගැනීමේ හැකියාවක් නොමැති බැවින් පොත්වලින් ලියා හැරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. අත්තිකාරම් අංක 1103/B/14 රු.1,891,500 අයකර ගැනීමට මිරිහාන පොලිසියෙහි පැමිණිල්ලක් සටහන්කර ඇති අතර පරීක්ෂණ සිදුවෙමින් පවතී. රු.3,962,350 ක් අත්තිකාරම් පියවීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් මේ වන විට ක්‍රියාත්මක වේ. ඉතිරි රු.1,523,060 /- ක මුදල මේ වන විට පියවා ඇත.
(ii)මුදල් රෙගුලාසි 571 ආපසු ගෙවිය යුතු රු. 1,875,084 ක් වූ ටෙන්ඩර් තැන්පතු ශේෂය තුළ වර්ෂ 05 ක් ඉක්ම වූ රු. 578,680 ක තැන්පතු රජයේ ආදායමට ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	(ii) ආපසු ගෙවියයුතු ටෙන්ඩර් තැන්පතු නිරවුල් කිරීම සඳහා පුවත්පත් දැන්වීමකින් ප්‍රසිද්ධ කරන ලදී. එහෙත් නියමිත කාලය තුලදී අදාල පර්ශවකරුවන් ඉදිරිපත් නොවීය. ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත අදාල ශේෂය ආදායමක් ලෙස සැලකීම සඳහා 2017 වසරේදී අදාල ගැලපීම් සටහන් තබන ලදි.
	(iii) සත්‍යාපනයේදී හඳුනාගන්නා ලද අස්ථානගත උපකරණ අයිතම් වැඩි

(iii) මුදල් රෙගුලාසි 757 (2)	2014 වර්ෂයේ වත්කම් සත්‍යාපනයේදී හඳුනාගන්නා ලද උපකරණ අයිතම් 2106 ක අස්ථානගත වීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ප්‍රමාණයක් එක් ම්‍යස්ථානයකින් තව මධ්‍යස්ථානයකට මාරු කිරීමේදී ස්ථාවර වත්කම් ලේඛණයන්හි නිවැරදි සටහන් නොකිරීම හේතුවෙන් සිදුවී ඇති බව නිරීක්ෂණය වී ඇත. එමෙන්ම 2015,2016, සහ 2017 වසරවල ස්ථාවර වත්කම් භෞතික සමීක්ෂණ වලදී මෙම අස්ථානගතවී ඇති අයිතම් ප්‍රමාණය ඉතා අඩු අගයක් ගන්නා බව සඳහන් කරමි.
(ආ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 84-2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ	කාර්යාංශය විසින් ස්ථාවර වත්කම් පවත්වා ලේඛනයක් පවත්වා නොතිබුණි.	ආ) කාර්යාංශය විසින් ස්ථාවර වත්කම් ලේඛණයක් මූල්‍ය වාර්තා සමග සංසන්ධනය කරමින් පවත්වාගෙන නොමැත. නමුත් ස්ථාවර වත්කම් පිලිබඳ වාර්තා නඩත්තු කරනු ලබන අතර එක් එක් අංශයන්හි පවතින ස්ථාවර වත්කම් ඒ අනුව හඳුනාගත හැකිය. මූල්‍ය වාර්තා සමග ස්ථාවර වත්කම් ලේඛණ සංසන්ධයනය කල නොහැකි බැවින් තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන වත්කම් තක්සේරු කිරීමක් සිදුකර එම අගයන් මූල්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතී. ඒ අනුව නව පරිසණක වැඩසටහන මගින් ස්ථාවර වත්කම් විධිමත් ලේඛණයක් පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට අපේක්ෂා කරමි.
(ඇ) 2003 ජුනි 02 දිනැති පිරිඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කල යුතු කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2017 නොවැම්බර් 24 වන විටත් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	ඇ) කාර්යාංශයෙහි මුදල් අංශය විසින් අනිකුත් අංශ විසින් ලබා දෙන තොරතුරු පදනම්කර ගනිමින් 2015 වර්ෂය වනතෙක්ම කාර්යාංශයෙහි වාර්ෂික වාර්තාව සකස්කර සෑම වර්ෂයකම අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. පසුගිය වර්ෂවල වාර්තා කළමණාකරණය විසින් නිරීක්ෂණය කිරීමෙන්

	නිගමනය වූයේ කාර්යාංශයේ වාර්ෂික වාර්තාව වෘත්තීමය ආකාරයට සහ නිර්මාණාත්මක ආකාරයට වෙනස්විය යුතු බවය. එබැවින් එම කාර්යය ඉටු කිරීමට කාර්යාංශයේ සැලසුම් අංශයය වෙත කළමණාකරණය විසින් පවරන ලදී. ඔවුන් විසින් මේ සඳහා කමිටුවක් පත් කර විවිධ අංශයටන්ට අදාල තොරතුරු එක් රැස්කරගෙන ඇති අතර ප්‍රසම්පාදන ක්‍රමවේදය ඔස්සේ සුදුසු සැපයුම් කරුවකු විසින් මෙම කාර්යය ඉටුකර ගැනීමට ටෙන්ඩරය ප්‍රදානය කර ඇත. ඒ අනුව කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත 2017.07.31වන දිනට පෙර ඉදිරිපත් කිරීමට අපේක්ෂා කල අතර මේ වනතෙක් අදාල වාර්තාව නිම කිරීමට අදාල ආයතනයට නොහැකි වී ඇත. මේ වනවිට අදාල ආයතනය විසින් කෙටුම්පත් වාර්තාවක් සකසමින් පවතී. අදාල කටයුතු නිම කල වහාම විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත පිටපතක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරමි.
(ඇ) 2014 නොවැම්බර් 22 දිනැති අංක PRE/2015/43දරනමැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 (i) ඡේදය	චක්‍රලේඛයට පටහැනිව බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල මැතිවරණ කාලසීමාව තුල රටවිරු සංවිධාන වැඩසටහන් සඳහා යොදවා ගැනීමට කුලී පදනම මතලබාගත් වාහන වෙනුවෙන් 2016 වර්ෂයේදී රු.2,858,641ක් ගෙවා තිබුණි.	ඇ)2014 වර්ෂයේ දෙසැම්බර් මස 01 දා සිට බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්ක වල රටවිරු සංවිධාන වැඩසටහන් සඳහා සහභාගිවන නිලධාරින් හට ප්‍රවාහන පහසුකම් සපයන ලෙස බදුල්ල පළාත් කාර්යාලයෙන් ඉල්ලීමක් කර තිබූ අතර ඊට අදාල අනුමැතිය මත ඒ සඳහා අවශ්‍ය වාහන බදුල්ල කාර්යාලය වෙත මුදාහරින ලදී. එහිදී කාර්යාංශ වාහන සංචිතයේ ප්‍රමාණවත් තරම් වාහන නොතිබූ හෙයින් කුලී පදනම මත වාහන ලබා ගැනීමට සිදුවිය.

2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු --- 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7ඡේදය ප්‍රකාරව භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් කාර්යාංශ නිලධාරින් සඳහා පැමිණීමේ දීමනා, මාසික ඉලක්ක සපුරා ගැනීමේ දීමනා, ගුවන් තොටුපල ඒකකයේ නිලධාරින්ට කරන ලද ගෙවීම්, පැය 24 පුරා ක්‍රියාත්මක විගමනික තොරතුරු මැදිරියේ සේවයේ නියුතු නිලධාරින් සඳහා විශේෂ දීමනා ගෙවීම් සහ අවදානම් දීමනා ලෙස රු.64,491,839 ක විවිධ දීමනා ගෙවා තිබුණි.	කාර්යාංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පැමිණීමේ දීමනා, මාසික ඉලක්ක සපුරා ගැනීමේ දීමනා, ගුවන් තොටුපල ඒකකයන්හි සහ සහන පියස මධ්‍යස්ථානයේ සේවයේ නියුතු නිලධාරින් සඳහා විශේෂ දීමනා, පැය 24 පුරා ක්‍රියාත්මක විගමනික තොරතුරු මැදිරියේ සේවයේ නියුතු නිලධාරින් සඳහා දීමනා සහ අවදානම් දීමනා ගෙවනු ලැබේ. **I.** පැමිණීමේ දීමනා රැකියා සඳහා විදේශගතව සිටින විගමණික ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ පවුල් වල සුබසාධනය හා යහපැවැත්ම සහතික කිරීම සඳහා මෙන්ම විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය හා පාලනය කිරීම සඳහා සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය දිරිගන්වමින් ඔවුන්ව නිතිපතා සේවයට කැඳවා ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන 2009.08.11 දිනැති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 25:42:04 ට අනුව ලබාදී ඇති අනුමැතිය පරිදි 2009.09.01 වන දින සිට කාර්ය මණ්ඩලය සඳහා පැමිණීමේ දීමනා ගෙවීම සිදු කරනු ලබන අතර පැමිණීමේ දීමනා ගෙවීම තුළින් කාර්ය මණ්ඩලය මූල්‍යමය වශයෙන් සවිබල ගැන්වීමක් සිදුවන අතර මේ තුළින් සේවකයන්ගේ නිවාඩු ලබාගැනීමේ සංඛ්‍යාව අඩුවීම තුළින් විගමණික ප්‍රජාව වෙනුවෙන් කාර්යක්ෂම සේවයක් ලබාදීම සඳහා කටයුතු කිරීමේ හැකියාව කාර්යාංශයට උදා වී ඇත. **II.** මාසික ඉලක්ක සපුරා ගැනීමේ දීමනා විගමණික ප්‍රජාව මුහුණ දෙනු ලබන ගැටළු විසඳීම සඳහා කාර්යාංශයේ

	සමථ අංශය පුළුල් කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර එසේම, සමථ අංශය කාර්යාංශයේ ප්‍රතිරූපය පෙන්නුම් කරනු ලබන කැඩපතක් බඳුවන අතර එම අංශයෙන් සිදුවන කටයුතු පිළිබඳව නිරතුරුව විවිධ රාජ්‍ය ආයතන වල මෙන්ම ජනමාධ්‍ය ආයතන වලද අවධානය යොමුව ඇති අතර සමථ අංශයෙන් සිදුකරන කටයුතු විගමණික ප්‍රජාවගේ හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන්ගේ ජීවිත හා සෘජුව බැඳි පවතින බැවින් එම අංශයෙන් සිදුවන කටයුතු කාර්යක්ෂමව හා ප්‍රමාදයකින් තොරව ඉටුකල යුතුව ඇති අතර කිසියම් වූ ප්‍රමාදයක් ඇති වුවහොත් එය විගමනික ශ්‍රමිකයන්ගේ ජීවිත වලින් පවා ඇතැම් අවස්ථාවල වන්දි ගෙවීමට සිදුවන තත්වයක් පසුගිය කාලසීමා වල අත්දැකිම් හා සැසඳිමේදී පෙනී යයි. මෙවැනි තත්වයක් තුළ සමථ අංශයේ කටයුතු වඩාත් කාර්යක්ෂම අයුරින් ඉටු කරලීම සඳහා නිලධාරීන් දිරිමත් කිරීමට නිලධාරීන් හට ඉලක්කයන් ලබා දෙමින් ඒ අනුව දීරි දීමනා ගෙවීමේ ක්‍රමයක් 2011.07.22 දිනැති කාර්යාංශයේ අධ්‍යක්ෂක මණ්ඩල තීරණ අංක 27.39.10 යටතේ 2011.08.01 වන දින සිට ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත. මෙම දීමනා ගෙවීම කාර්යසාධනය පදනම් කරගෙන සිදු කරනු ලබන අතර නිලධාරීන් විසින් අංශයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම තුලින් අදාල ඉලක්ක සපුරා දිරි දීමනාවන් උපයා ගත යුතු වේ. අවම කාර්ය සාධන මට්ටමට මාසයකට පැමිණිලි ලිපි ගොනු 30ට වැඩි ප්‍රමාණයක් විසඳා අවසන් කිරීම පදනම් කරගෙන මෙම දිරි දීමනාව ගෙවීම සිදුකර තිබේ. 2013.12.12 දිනැති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 29:80:15 අනුව අවම කාර්ය සාධන මට්ටම මාසයකට පැමිණිලි ලිපිගොනු 40කට වැඩි ප්‍රමාණයක් විසඳා අවසන් කිරීම පදනම් කරගෙන මෙම දිරි දීමනාව

	ගෙවීම 2013.12.01 වන දින සිට ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබී තිබේ. එසේම විදේශ සම්බන්ධතා 02 අංශයේ නිලධාරීන් විසින් ද විගමණික සේවකයන්ගේ ගැටළු විසඳීම සම්බන්ධ රාජකාරි කටයුතු වල නිරත වන බැවින් එම අංශයේ නිලධාරීන් සඳහාද 2011.09.28 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 76/2011(M-8)සඳහා තීරණ අංක 27.53.06 යටතේ ලද අනුමැතිය පරිදි විදේශ සම්බන්ධතා 02 අංශ සේවකයන් සඳහාද මාසික ඉලක්ක සපුරාලීම මත දිරි දීමනාවන් ගෙවනු ලබන අතර අදාල නිලධාරියා විසින් මාසික ඉලක්ක සපුරාලමින් අදාල දීමනා උපයාගත යුතුයි. **III.** ගුවන් තොටුපල ඒකකයන්හි සහ සහන පියස ඒකකයේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා විශේෂ දීමනා ගෙවීම. • ආහාර දීමනාව කාර්යාංශයේ ගුවන් තොටුපල ඒකකයන්හි සහ සහන පියස මධ්‍යස්ථානයේ කටයුතු දවසේ පැය 24 පුරා සේවා මුර ක්‍රමයන් යටතේ ක්‍රියාත්මක වනු ලබයි. සේවා මුර ක්‍රමයන් යටතේ සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය සඳහා ආහාරපාන පිටතින් සපයා ගැනීමේ හැකියාවන් අවම බැවින් හා ගුවන් තොටුපල ඒකකයෙහි ආපන ශාලා තුළ ආහාරපාන වල මිල ගණන් අධික බැවින් කාර්යාංශය විසින් ගුවන් තොටුපල හා සහන පියසේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලය සඳහා ආහාර සඳහා දීමනාවක් ලබා දීම සිදුකරනු ලබයි. • ඉලක්ක සපුරාගැනීමේ දීමනාව

	කටුනායක හා ගුවන්ගොටුපල ඒකකයෙහි හා සහන පියස මධ්‍යස්ථානයෙහි කාර්ය මණ්ඩලය සඳහා ගුවන්තොටුපල ඒකකයේ මාසික ආදායම එකතුකිරීමේ ඉලක්කය රු.මිලියන 17.5 ඉක්මවා ඇති අවස්ථාවකදී ඔවුන්හට විශේෂ දීමනාවක් ගෙවීම 2007.10.11 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 23.56.04.01 යටතේ අනුමැතිය අනුව විශේෂ දීමනාව ගෙවීම ආරම්භ කර ඇත. තවද 2007.09.21 දිනැතිව අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අංක 106/2017/(M-8) දරන අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකාවට තීරණ අංක 33.53.12 යටතේ ලැබූ අනුමැතිය අනුව මෙම ගෙවීම තවදුරටත් සිදුකරනු ලබයි. • දුෂ්කර දීමනාව (Hardship Allowance) කාර්යාංශපනතේ නියමයන් අනුව, ශ්‍රමිකන් රැකියා සඳහා විදේශගත වන බවට තහවුරු කර ගැනීම සඳහා ඇති අවසන් සේවා කවුළුව කාර්යාංශයේ ගුවන් තොටුපල ඒකකය වන අතර නීති විරෝධී ක්‍රම මඟින් මිනිස් ජාවාරම්හි නිරත වෙමින් පුද්ගලයන් විදේශගත කිරීම අසුරාලීම සඳහා කාර්යාංශයේ ගුවන් තොටුපල ඒකකයට විශේෂිත වගකීමක් පැවරී ඇත. කාර්යාංශයේ අරමුණු හා පරමාර්ථ ළඟා කර ගැනීම සඳහා පුළුල් වූ කාර්යභාරයක් ඉටු කරනු ලබන පැය 24 පුරාම සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය දිරිමත් කරමින් රජයට අයකර ගත යුතු ලියාපදිංචි ගාස්තු අයකර ගෙන රාජ්‍ය ආදායම් ශක්තිමත් කිරීම සඳහා කැපවන කාර්ය මණ්ඩලය දිරිමත් කිරීම සඳහා ගුවන් තොටුපල ඒකකයේ කාර්ය මණ්ඩලය වෙත 1994 වර්ෂයේ සිට මෙම දීමනාව ගෙවා ඇති අතර, අංක 107/2017/(M-8)දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට තීරණ අංක 33.53.13

	යටතේ ලැබී ඇති අනුමැතිය අනුව මෙම විශේෂ දීමනාව තවදුරටත් ගෙවනු ලබයි. **IV.** පැය 24 පුරා ක්‍රියාත්මක විගමනික තොරතුරු මැදිරියේ සේවයේ නියුතු නිලධාරීන් සඳහා දීමනා ගෙවීම. ලොවපුරා විසිරි සිටින විගමනික ශ්‍රමිකයන් හට අවශ්‍ය තොරතුරු දවසේ පැය 24 පුරාම ලබාදීමේ අරමුණ පෙරදැරි කරගෙන 24 පැයේ තොරතුරු මැදිරිය කාර්යාංශය විසින් ආරම්භ කරන ලද අතර එහි කටයුතු සේවා මුර ක්‍රමයක් යටතේ දවසේ පැය 24 පුරා ක්‍රියාත්මක වේ. එම නිලධාරීන් දිරිමත් කරමින් වඩා ඵලදායී වූ සේවාවක් විගමනික ප්‍රජාවට ලබාදීම සඳහා අදාළ දීමනාවන් 24 පැයේ සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා 2012.04.01 සිට ගෙවීම් කර ඇත. **V.** අවදානම් දීමනා. විගමනික ප්‍රජාව හා ඔවුන්ගේ පවුල් වල සුභසාධන කටයුතු, විදේශ රැකියා ක්ෂේත්‍රය නියාමනය හා පාලනය කිරීමේ කටයුතු, විදේශ රැකියා ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනය කිරීමේ කටයුතු වල නිරත වන කාර්ය මණ්ඩලය තම කාර්ය ඉටු කිරීමේදී දැඩි කාර්ය බහුල වතාවරණයක් තුළ දැඩි පීඩනයකින් යුක්තව එක් එක් අංශයන්හි රාජකාරි කටයුතු ඉටු කරනු ලබයි. විදේශ රැකියා ක්ෂේත්‍රයේ කටයුතු පුළුල් වීමත් සමඟ එක් එක් අංශයන් මඟින් සිදුකල යුතු කාර්යභාරයන් පුළුල් වී ඇති අතර ඒ තුළින් එක් නිලධාරියෙකු හට ඉටු කිරීමට ඇති රාජකාරි වැඩ කොටස් ප්‍රමාණය ඉහළයාමක් දක්නට ඇත. නිලධාරීන් විසින් අවදානම් දරමින් සිදුකරනු

	ලබන එම කාර්ය සඳහා දිරිගැන්වීමක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013.11.14 දිනැති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 29:74:02 යටතේ ලබා දී ඇති අනුමැතිය පරිදි 2013.11.01 වන දින සිට බලපැවැත්වෙන පරිදි මෙම දීමනාව ලබාදීම සිදුකරනු ලබයි.
3. මූල්‍ය සමාලෝචනය --- **3.1 මූල්‍ය ප්‍රතිඵල** --- ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ සහ කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.944,363,600 ක් සහ රු.942,355,085 ක ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.884,713,213 ක් සහ රු.883,817,095 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ සමූහයේ හා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල පිළිවෙලින් රු.59,650,387 කින් සහ රු.58,537,990 කින් වර්ධනය වී තිබුණි. මෙහෙයුම් හා මූල්‍ය ආදායමේ රු.622,757,544 කින් වැඩිවීම හාප්‍රචාරන වියදමේ හා සුභසාධන අරමුදලේ වෙනත් වියදම් රු.44,714,891 කින් අඩුවීම ඉහත වර්ධනයට හේතුවී තිබුණි. සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේදී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා ශුද්ධ ලාභයේ වර්ධනයක් සිදුවී තිබුනද එය 2015 වර්ෂයේදී සුළු වශයෙන් අඩුවීමක් සිදුවී තිබුණි.එහෙත් 2016 වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 57.5 ක වර්ධනයක් විය. තවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික රජයට ගෙවූ බදු හා ක්ෂය නැවත ගැලපීමේදී 2012	

වර්ෂයේදී රු.1,252,718,830 ක් වූ කාර්යාංශයේ දායකත්වය සමාලෝචිත වර්ෂය අවසානයට රු.2,640,624,061ක් දක්වා වර්ධනය වී තිබුණු අතර 2015 වර්ෂයට සාපේක්ෂව එය සියයට 50 ක වර්ධනයක් විය.	
3.2 කාර්යාංශයට එරෙහිව හෝ කාර්යාංශය විසින් ආරම්භකර ඇති නෛතික සිද්ධි --- බාහිර පාර්ශවයන්හා කාර්යාංශ නිලධාරීන් විසින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනටකාර්යාංශයට එරෙහිව නඩු 13 ක් ගොනු කර තිබූ අතර කාර්යාංශය විසින් රු.73,766,962 ක් අසම්භව්‍ය බැරකම් ලෙස හඳුනාගෙන තිබුණි.	නීති අංශය මගින් හඳුනාගන්නා ලද අසම්භාව්‍ය බැරකම් මූල්‍ය ප්‍රකාශනයන්හි හෙලිදරව් කර ඇත.
4. මෙහෙයුම් සමාලෝචනය --- **4.1 කාර්යසාධනය** --- පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ	
(අ) කාර්යාංශය වෙත කරනු ලැබූ පැමිණිලි සම්බන්ධයෙන් සිදුකල විගනන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.	**(අ)**
(i) 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා ලැබී තිබූ පැමිණිලි වලින් 2267 ක් 2016 ජනවාරි 01 දින වන විට නොවිසඳී තිබුණු අතර වර්ෂය අවසානය වන විට ඉන් 244 ක් තවදුරටත් නොවිසඳී තිබුණි.	**i.** 2010සිට 2015 දක්වා ලැබී ඇති පැමිණිලි අතුරින් පැමිණිලි 244ක් නොවිසඳී පැවති බව ඔබ විසින් සඳහන් කර ඇත. නමුත් මේවනවිට එම කාලය තුළ ලැබී ඇති පැමිණිලි වලින් නොවිසඳී ඇති පැමිණිලි සංඛ්‍යාව 69 කි. (2018.02.14)
(ii) 2016 තුල ලැබූ පැමිණිලි 5,686, න් පැමිණිලි 2,320 ක් හෙවත් සියයට 41	**ii.** එක් වර්ෂයක් තුල ලැබෙන පැමිණිලි එම වර්ෂය තුලදීම අවසන් කිරීමට නොහැකි වන අවස්ථා පහත පරිදි වේ.

සඳහා පමණක් විසඳුම් ලබා දී තිබුණි.	01. තානාපති කාර්යාල, දේශීය රැකියා නියෝජිත ආයතන වලින් ලැබෙන තොරතුරු මත පැමිණිළි විසඳීමට සිදුවන අතර මෙමගින් තොරතුරු ලබා දීමේදී ප්‍රමාද විය හැක. 02. නියෝගයක් ලබා දී එය ක්‍රියාත්මක වීමට ගතවන කාලය අනුව පැමිණිලි විසඳීමට ගතවන කාලය තීරණය වේ. 03. සමහර විගමණික සේවක සේවිකාවන් සේවා ස්ථාන කිහිපයකට මාරු වී තිබෙන අවස්ථාවක තොරතුරු සොයාගැනීමට කාලයක් ගතවීම තුලින් ලිපි ගොනු විසඳීමට ගතවන කාලය තීරණය වේ. 04. ලිපි ගොනු නීති අංශය වෙත යොමු කළ පසු නීතිමය කටයුතු සඳහා ගතවන කාලය 05. තානාපති කාර්යාල මගින් ටී පී එන් (TPN) එකක් යොමු කල පසු එයින් විසඳුමක් ලබා දීමට ගතවන කාලය අනුව පැමිණිළි විසඳීම සඳහා ප්‍රමාදවීම සිදුවේ.
(iii) සමාලෝචිත වර්ෂය තුලළ පැමිණිලිකරු තවදුරටත් ක්‍රියාත්මකවීම අනවශ්‍ය ලෙස දැන්වීමෙන් හා ඔවුන් විසින්ම ලිපිගොනුව වසා දැමීමට තීරණය කර ඇති පැමිණිලි ප්‍රමාණය 1,911 ක් විය. ඒ අනුව විසඳීමකින් තොරව ලිපි ගොනු වසා දැමීම හා පැමිණිලිකරු විසින් තවදුරටත් ක්‍රියාත්මක වීම අනවශ්‍ය ලෙස දැන්වීමෙන් වසා දැමීමට තීරණය කල පැමිණිලි 2,274 න් විසඳූ පැමිණිලි ලෙස වාර්තා කර තිබූ අතර එය විධිමත් නොවන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද එම පැමිණිලි සම්බන්ධයෙන් අධ්‍යනය කර සත්‍ය වශයෙන්ම තවදුරටත් ගැටළුවක් පවතින්නේද යන්න පරීක්ෂා කර බැලීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.	**iii.** පැමිණිලිකරුවෙකු විසින් සමථ අංශයට ගැටළුවක් සහිත පැමිණිල්ලක් ඉදිරිපත් කල පසු දේශීය රැකියා නියෝජිත ආයතන විදේශ රැකියා නියෝජිත ආයතන හා තානාපති කාර්යාලය හරහා ගැටළුව විසඳීමට සමථ අංශය විවිධ ක්‍රියාමාර්ග ගනු ලබයි. ඒ තුලින් විසඳුමක් ලැබුනු පසු එම තත්වය පැමිණිලිකරු වෙත දැනුම් දී තව දුරටත් කාර්යාංශයෙන් යමක් සිදුවිය යුතුද යන්න පැමිණිලිකරුගෙන් කරනු ලබන විමසීමට පිළිතුරු ලෙස පැමිණිලිකරුවන් විසින් තවදුරටත් කටයුතු කිරීම අවශ්‍ය නොවන බව ප්‍රකාශ කරනු ලබයි. එසේ නොමැතිව ලිපි ගොනුවක් විසඳීමකින් තොරව අවසන් කිරීමට නොහැකි වේ. ඒඅනුව පැමිණිලිකරුගේ එකඟතාවය ඇතිව පැමිණිල්ලක් අවසන් වේ.

(iv) පැමිණිලි සඳහා ලබා දී තිබූ විසඳුමක් ලෙස "විගමණික සේවකයා ආපසු ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම"යන්න සඳහන්ව තිබුණ ද එලෙස ගෙන්වා ගත් විගමණිකයන් ගණන 2,016 ක් විය. ඒ අනුව වර්ෂයේ විසඳා ඇති පැමිණිලි 5,686 න් 2,016 ක්ම සේවකයා නැවත ලංකාවට ගෙන්වා ගැනීමෙන් පමණක් විසඳුම් ලබා දී තිබූ ඒවා වූ අතර එවැනි ගැටළු නැවත ඇති නොවීමට ස්ථිරසාර පිළියම් යෙදීම කෙරෙහි අවධානය යොමු කරන ක්‍රමවේදයක් ගොඩනැගීමට කාර්යාංශය කටයුතු කර නොතිබුණි.	**iv.** සමථ අංශයට ලැබෙන පැමිණිලි වලට අදාලව පැමිණිල්ලේ ස්වභාවය අනුව පැමිණිලි ලිපිගොනුවලට අදාල විසඳුම් ලබා දීම සිදු කරනු ලබන අතර පැමිණිලිකරුගේ ඉල්ලීම් විගමණික ශ්‍රමිකයා ගෙන්වීමට නම් විගමණික ශ්‍රමිකයා ශ්‍රී ලංකාවට ගෙන්වීම සිදු කරනු ලබයි. මෙහි ගිවිසුම් සේවා කාලය අවසන් කලද සේවාදායකයා විසින් ආපසු නොඑවීම නිසා කාර්යාංශය මැදිහත් වූ අවස්ථා ද ඇත. එසේම ගිවිසුම් සේවා කාලය අතරතුර ගෙන්වා දෙන ලෙසට කාර්යාංශයෙන් ඉල්ලුම් කල අවස්ථාද ඇත. එ අනුව පැමිණිලිකරුගේ ඉල්ලීම පරිදි ලිපිගොනුවල කටයුතු අවසන් කර ඇත. ගිවිසුම් සේවා කාලය අවසන් නොකර අවස්ථා කීපයකදී පිළිගත හැකි හේතුවක් නොමැතිව අතරමඟ ලංකාවට පැමිණෙන සේවාලාභීන් නැවත විදේශගත වීම වැලැක්වීම සඳහා අසාධු ලේඛනගත කරනු ලබයි. හේතුව එසේ පැමිණීමේදී හාම්පුතා වෙත ගත් විශාල මුදලක් ගෙවීමට සිදු වීමයි.
(ආ) කාර්යාංශ පනතේ 30 වගන්තිය යටතේ බලපත්‍රයක් අලුත් කිරීමේදී එහි 28 වගන්තියේ වූ විධි විධාන පිලිපැද ඇති බවට කාර්යාංශය සෑහීමකට පත්විය යුතු අතර පනතේ 31 වගන්තිය යටතේ එකී විදිවිධාන කිසිවක් කඩකර ඇත්නම් බලපත්‍රය අවලංගු කිරීමටද හැකි බව දන්වා තිබුණි. නමුත් බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිත ආයතන 27 ක් සම්බන්ධයෙන් වසර දෙකක ලද පැමිණිලි හා විදේශගතවීම් පරීක්ෂාවේදී නියෝජිත ආයතන වල පැමිණිලි වල වැඩිවීමක් හා වසර දෙකක විදේශගතවීම් අඩුවීමට වඩා අඩු ප්‍රතිශතයකින් පැමිණිලි ලැබීම් අඩු වී තිබුණු අතර සමහර අවස්ථා වලදී විදේශගතවීම් වැඩි වී තිබුණද ඊට වඩා වැඩි	**(ආ)** රැකියා නියෝජිත ආයතනයකින් විදේශ ගතවී සිටින ශ්‍රමිකයන්ට අදාලව ලැබෙන පැමිණිලිවලට කාර්යාංශය බලාපොරොත්තු වන ආකාරයට විසඳුම් ලබා දීමට එම රැකියා නියෝජිත ආයතනය ඉදිරිපත් වන්නේ නම්, බලපත්‍රය අලුත් කිරීමේදී දේශීය රැකියා නියෝජිත වෙත සමථ අංශයේ නිර්දේශය ලබා දේ

ප්‍රතිශතයකින් පැමිණිලි වල වැඩිවීමක් නිරීක්ෂණය විය. එමනිසා කාර්යාංශය උක්ත පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කලේද යන්න විගණනයේදී ගැටළුකාරී විය.	
4.2කළමනාකරණ ක්‍රියාකාරකම් --- පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.	
(අ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය සහ කාර්යාංශයේ සහයෝගිතාවයෙන් විගමණික සේවකයන් සඳහා ක්‍රියාත්මක වූ නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ විගමණිකයන් 10,264 දෙනෙකු සඳහා සමෘද්ධි බැංකුව මඟින් රු. මිලියන 2,998 ක ණය මුදලක් ලබා දී තිබූ අතර මේ වන විට එම යෝජනා ක්‍රමය අකර්මනාය වී තිබුණි. ඉන් සියයට 26 ක් වූ විගමණිකයන් 2,674 දෙනෙකු වෙත ලබා දී තිබූ රු. මිලියන 610.14 ක (සියයට 20 ක) ණය ආපසු ගෙවීම පැහැර හැර තිබුණි. තවද විගමණිකයින් 1,573 දෙනෙකු වෙත ණය ලබාදීමේ කොන්දේසිවලට පටහැනිව හා කිසිදු ඇපයක් තබා නොගෙන මුළු ණය ප්‍රමාණයෙන් සියයට 12 ක් හෙවත් රු. මිලියන 360.27 ක ණය ලබාදී තිබුණි. තවද, කාර්යාංශය විසින් උක්ත කාර්ය සඳහා සමෘද්ධි අධිකාරියේ තැන්පත් කරන ලද රු. මිලියන 100 ක තැන්පත් මුදලේ පොළියද 2014 වර්ෂයේ සිට ලැබී නොතිබුනි.	**අ)** කාර්යාංශය විසින් 2013.12.31 දක්වා 15% පොලියක් සමෘද්ධි අධිකාරියෙන් ලබාගෙන ඇති අතර 2014 වර්ෂයේ සිට කිසිදු පොලියක් මේ දක්වා ලැබී නොමැත. නමුත් අප විසින් තැන්පත් කල මුදල ආපසු ලබාගෙන නොමැති අතර පොලී ගෙවන ලෙස ඉල්ලීම් කර ඇත. විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මූලික තැන්පතු මුදල වන රුපියල් මිලියන 100 සඳහා ශේෂයන් තහවුරු කිරීමේ ලිපියක් ලබා ගෙන විගනනය වෙත ඉදිරිපත් කර ඇත.පොලී ආදායම අයකර ගැනීම සම්බන්ධයෙන් අවිනිශ්චිත තත්වයක් පවතින නිසා ලැබිය යුතු පොලී ආදායම ගිණුම්ගත කර නැත.නමුත් මූලික තැන්පතුව සම්බන්ධයෙන් දෙපාර්ශවයේම ගැටළුවක් නැති බැවින් අදාල මුදල සම්බන්ධයෙන් ගිණුම්වල ගැලපුම් කිරීමේ අවශ්‍යතාවයක් නොමැත.
(ආ) විදේශ සේවා නියුක්ති කාර්යාංශය අබුඩාබි කාර්යාලයේ 2014 ජූනි මාසයේ සිදු වී තිබූ රු. 1,058,276 ක මූල්‍ය අක්‍රමිකතාව සම්බන්ධව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමට 2014 ජූනි 17 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් යොමුකර වර්ෂ තුනකට වැඩි කාලයක් ගත වී තිබුණ ද එහි සැලකිය යුතු ප්‍රගතියක් විගණනයේ දී නිරීක්ෂණය නොවිණි. මේ	**ආ)** මේ සම්බන්ධව අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිල්ල අනුව විමර්ශන කටයුතු සම්පූර්ණ කර ඇත. 2018.01.10 වන දිනැති විදේශ රැකියා අමාත්‍යාංශ ලේකම්තුමා විසින් කාර්යාංශය වෙත යොමුකරන ලද ලිපියෙන් දන්වා ඇත්තේ ඉදිරියේදී ගතයුතු ක්‍රියාමාර්ග උදෙසා නීතිපති දෙපාර්තමේන්තුව වෙත අදාල වාර්තාව යොමුකර ඇති බවත් කාර්යාංශයේ නීති අංශය මගින් ඉදිරි කටයුතු සොයා බලන ලෙසටය.

සම්බන්ධයෙන්කාර්යාංශය විසින් විධිමත් ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණි.	
(ඇ)කාර්යාංශය විසින් අවස්ථා 101 ක දී විවිධ කාර්යන් සඳහා ලබා දී තිබූ රු.2,822,750 ක අත්තිකාරම් මුදල් වලින් රු. 1,762,741 ක් , එනම් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් භාවිතා කිරීමෙන් තොරව නැවත කාර්යාංශය වෙත පියවා තිබුණි. ඒ අනුව අත්තිකාරම් මුදල් නිසි කළමණාකාරිත්වයකින් යුතුව ලබාදී ඇති බව විගණනයේදී නිරීක්ෂණය නොවීය.	ඇ) අත්තිකාරම් මුදල් ලබා දීමේදී අදාල නිලධාරීන් විසින් කිසියම් කාර්යයක් සිදුකිරීම සඳහා ඉල්ලීම් කරනු ලබන මුදල ලබා දීම සිදුකරනු ලබයි. සමහර අවස්ථාවලදී නිශ්චිතවම වියදම සඳහා අදාල අත්තිකාරම් ලබා දෙන අතර නිශ්චිතවම වියදම නොදන්නා අවස්ථා සඳහාද අත්තිකාරම් ලබා දීම සිදු කරයි. මුදල් අංශයේ වාර්තා අනුව 2016 වර්ෂයේදී අත්තිකාරම් 1199 ලබා දී ඇත. විගණන වාර්තාවෙහි දක්වා ඇති 101ක් වන අත්තිකාරම් ප්‍රමාණය සමස්ත අත්තිකාරම් ප්‍රමාණයෙන් 9% ක් පමණ වේ. මෙහිදී දක්වා ඇත්තේ ඉල්ලුම් කරන ලද මුදල් අඩුවෙන් භාවිත වූ අවස්ථා සම්බන්ධයෙනි. අදාල නිලධාරීන් විසින් මනා පාලනයකින් යුතුව අත්තිකාරම් මුදල් භාවිතා කිරීම මගින් ඇස්තමේන්තුගත වියදමට වඩා අඩු වියදමක් සත්‍ය වශයෙන් දැරීම මගින් ආයතනයට ආදල මුදල් ඉතිරියක් සිදු කර ඇත. නමුත් සමහර අවස්ථාවලදී ඉල්ලුම් කරන ලද ප්‍රමාණයට වඩා සත්‍ය වියදම වැඩිවන අවස්ථාද ඇත. ඉදිරියේදී හැකි තාක් විචලනයන් අවම වන ආකාරයට අත්තිකාරම් ලබා දීමට අපේක්ෂා කරමි.
(ඈ) ඇස්තමේන්තු වටිනාකම රු. මිලියන 95 ක් වූ සී/ස කහගොල්ල ඉංජිනේරු සේවා සමාගමකට අයත් ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත ලබා ගැනීම සඳහා කාර්යාංශය විසින් 2013 වර්ෂයේ රු. මිලියන 20 ක අත්තිකාරමක් සී/ස රාජ්‍ය සම්පත් කළමනාකරණ සංස්ථාවට ගෙවා තිබුණි. 2013 ජනවාරි 17 දිනැති අංක 10/2013 (M-01) අධ්‍යක්ෂක මණ්ඩල තීරණයට අනුව ගොඩනැගිලිවල හා ඉඩමේ නිරවුල් භුක්තිය භාරගන්නා ලෙස කාර්යාංශය වෙත දන්වා තිබුණ ද 2017ඔක්තෝම්බර් වන විටත් ඉඩමේ නිරවුල් භුක්තිය ලබාගැනීමට නොහැකිවී	ඈ . **කහගොල්ල ඉඩම** කහගොල්ල ඉඩම ශ්‍රී ලංකා යුධ හමුදාව වෙත පැවරීමට අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දී ඇති, අංක CP/18/0487/733/008හා 2018.04.10 දින දරණ අමාත්‍ය මණ්ඩල තීරණය, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශයේ අංක MTDI/SEC/09-GEN(Vol.II) හා 2018.04.27 දින දරණ ලිපිය මගින් කාර්යාංශය වෙත යොමු කර ඇත. කාර්යාංශය විසින් අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 29.04.10 දරණ තීරණය යටතේ සීමාසහිත රාජ්‍ය ව්‍යවසාය කළමනාකරණ සංස්ථාව

තිබුණි.	වෙත රු.මිලියන 20 ක මුදලක්, 2013.01.22 දින ගෙවා ඇති අතර, දැනට මෙම ඉඩමේ භුක්තිය කාර්යාංශය සතුව ඇති බැවින්, යුධ හමුදාව වෙත මෙම ඉඩම පවරා දීමට පෙර කාර්යාංශය විසින් ගෙවා ඇති රු. මිලියන 20 ක මුදල අදාල ආයතන වෙතින් අය කර දීමට කටයුතු කරන ලෙස ඉල්ලා අංක AD/02/15/228/2012 හා 2018.05.23 දින දරණ ලිපිය කාර්යාංශය විසින්, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම් වෙත යොමු කර ඇත.
(ඉ) කාර්යාංශය විසින්තංගල්ල හා කුරුණෑගල ඉඩම් සංවර්ධන කිරීමේ කටයුතු වෙනුවෙන් රු.309,600,107 ක් වැය කර තිබුණ නමුත් 2017 ඔක්තෝබර් මස වන විටත් එම ඉඩම් කාර්යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	**ඉ.** තංගල්ල ඉඩම, විදේශ රැකියා අමාත්‍යාංශය වෙත පවරා දීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙස ඉල්ලා, විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අංක MFE/DEV/5/6/2 හා 2016.06.28 දිනැති ලිපිය යොමු කර ඇත. ඒ අනුව මෙම ඉඩම විදේශ රැකියා අමාත්‍යාංශය වෙත නිදහස් කිරීම සුදුසු බව අනුමත කරමින්, පැවරීමට අදාල නිර්දේශ සහ බදු අනුමැතිය අවලංගු කිරීමට අදාල නිර්දේශ ඉදිරිපත් කරන ලෙස ඉඩම් කොමසාරිස් ජනරාල් විසින්, තංගල්ල ප්‍රදේශිය ලේකම් වෙත අංක 4/10/38198 හා 2016.08.23 දිනැති ලිපිය යොමුකර ඇත. ඉඩම පවරා ගැනීමේ වර්තමාන තත්වය විමසීම් කර විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින්, ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අංක MFE/DEV/5/6/34 හා 2017.12.06 දිනැති ලිපි යොමු කරමින් ඉඩම පවරා දීමට අවශ්‍ය කටයුතු කඩිනමින් කරන ලෙස ඉල්ලා ඇත. ඒ අනුව මෙම ඉඩම පවරා ගැනීම සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවතින බව කාරුණිකව දන්වමි. කුරුණෑගල ඉඩම පැවරීමට අවශ්‍ය නිර්දේශ සමඟ ලිපිලේඛණ කුරුණෑගල

	ප්‍රාදේශිය ලේකම් විසින් පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) මගින් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අංක 4/5/1/47 හා 2016.09.28 දිනැති ලිපි මඟින්දන්වා ඇත. ඒ අනුව පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) විසින් මෙම ලේඛණ වයඹ පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත 2016.10.12 දින යොමුකර ඇත.වයඹ පළාත් කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් වයඹ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත අංක NWP/AGR/ES9/17 හා 2016.10.28 දිනැති ලිපියෙහි සඳහන් පරිදි ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදෙස් අනුව මෙම ඉඩම ලබාදිය නොහැකි බව දැනුම්දී ඇත. කෙසේ වෙතත් මෙම ඉඩම පවරා ගැනීම වෙනුවෙන් අවශ්‍ය සියළු කටයුතු සිදු කර ඇති බැවින් ගරු විදේශ රැකියා අමාත්‍යතුමිය විසින් ගරු වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යතුමා වෙත MFE/DEV/5/6/16 හා 2016/12/07 දිනැති ලිපිය යොමු කරමින් යෝජිත ඉඩම පැවරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස ඉල්ලා ඇත. එසේම මෙම ඉඩම නිදහස් කිරීමට නොහැකි බව වයඹ පළාත් ඉඩම් කොමසාරිස් විසින් කුරුණෑගල ප්‍රාදේශිය ලේකම් වෙත 2017/01/10 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇති අතර , එහි පිටපතක් කාර්යාංශය වෙත යොමු කර ඇත. ගරු විදේශ රැකියා අමාත්‍යතුමිය විසින් 2017 ජනවාරි මස අතිගරු ජනාධිපතිතුමා වෙත ලිපියක් යොමු කරමින් මෙම ඉඩම විදේශ රැකියා අමාත්‍යාංශය වෙත පවරා දෙන ලෙස ඉල්ලා ඇත.

(ඊ)කාර්යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් පිටිපන මාහේනවත්තේ පිහිටි අක්කර 05 ක ඉඩම් ප්‍රමාණයක් අවු .50 ක කාලයකට බදු පදනම මත ලබා දීමට 2010 නොවැම්බර්03 දින තීරණය කර තිබුණි.2010 ජනවාරි 15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ අභ්‍යන්තර තක්සේරු කමිටුව විසින් රු.මිලියන 52 කට තක්සේරු කර එම මුදලින් සියයට 50 ක් වූ රු.මිලියන 26 ක් කාර්යාංශය විසින් 2010 පෙබරවාරි 26 දින ගෙවා ඉඩමෙහි භෞතික අයිතිය කාර්යාංශය වෙත පවරාගෙන තිබුණි.මෙම ඉඩම සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරු ලවා තක්සේරුවක් ලබා ගැනීමෙන් තොරව සියයට 50 ක් ගෙවීම් සිදුකර තිබුන අතර 2017 දෙසැම්බර් 04 දින දක්වාම එම ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට හා අදාල කාර්යය සඳහා යෙදවී ක්‍රියාකර නොතිබුණි. **4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්** --- පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ. **(අ)** කාර්යාංශයේ පරමාර්ථ අතරට ශ්‍රී ලාංකිකයින් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති අවස්ථා නංවාලීම සහ සංවර්ධනය කිරීම ඇතුලත්ව තිබූ නමුත් 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අනුමත කිරීම සඳහා ලැබී තිබූ රැකියා ඇණවුම් ප්‍රමානයෙන් සියයට 50ක් සඳහාවත් ශ්‍රමිකයින් සැපයීමට කාර්යාංශය අපොහොසත් වී තිබුණි.	ඒ අනුව මෙම ඉඩම පවරා ගැනීමට අදාලව කාර්යංශය හා අමාත්‍යාංශ මට්ටමෙන් ගත හැකි ක්‍රියාමාර්ග ගෙන ඇති බව දන්වමි. ඊ. හෝමාගම, පිටිපන මාහේන වත්ත ඉඩමෙහි කොටසක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත පවරා ගැනීම සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් ඇතුළු නිලධාරීන් සමග කාර්යාංශ නිලධාරීන් විසින් 2018.04.09 දින එම ආයතනයේ දී සාකච්ඡාවක් පවත්වන ලදි. එම සාකච්ඡාව අනුව, 50 අවුරුදු බදු පදනම මත කාර්යාංශය වෙත ලබා දීමට නියමිත ඉඩම, ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ එම අධිකාරිය වෙත පවරා ගැනීමට නියමිත බවත්, එසේ පවරා ගැනීමෙන් පසුව ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන වටිනාකම කාර්යාංශය වෙතින් අයකර ගැනීමෙන් අනතුරුව, කාර්යාංශය වෙත ලබා දීමට අදාළ බදු ගිවිසුම නිකුත් කිරීමට කටයුතු කරන බව නාගරික සංවර්ධන අධිකාරියේ අංක 10/8/3282 හා 2018.04.23 දිනැති මගින් කාර්යාංශය වෙත දන්වා ඇත. **අ)**රැකියා ඇණවුමක අඩංගු වනුයේ අදාල එතෙර සේවයන්ට අවශ්‍ය වන්නේයැයි ඇස්තමේන්තු ගත කරන ලද රැකියා ප්‍රමාණය වන අතර, එකම සේවායා මෙම අවශ්‍යතාවය දේශීය රැකියා නියෝජිත ආයතන කිහිපයකට මෙන්ම ශ්‍රමිකයන් සපයනු ලබන රටවල් රාශියකටද සපයනු

	ලැබේ. මෙම ප්‍රායෝගික තත්වය මත අනුමත කරන ලද රැකියා ඇණවුම් සංඛ්‍යාවේ සඳහන් ඇබෑර්තු සංඛ්‍යාව සහ සත්‍ය වශයෙන්ම එම ඇබෑර්තු යටතේ විදේශ ගතවූ සංඛ්‍යාව අතර විචලනයක් ඇතිවීම වැලැක්විය නොහැකි අතර එය කාර්යාංශයේ අසමත් භාවයක් නොවේ.
(ආ)2008 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ විදේශ රැකියා ඇණවුම් වල පහළ යාම සියයට 40 ක් වූ අතර2013 වර්ෂයේදී එය සියයට 21 කින් වර්ධනය වී තිබුණි. එහෙත් 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එය ක්‍රමයෙන් පහළ ගොස් තිබූ අතර එය2014වර්ෂයට සාපේක්ෂව සියයට34 ක් විය. ඒ අනුව 2008 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේ රැකියා වෙළඳපල අභිමිවීම සියයට 73 ක් විය. 2008 වර්ෂයේ දී සියයට 16 ක් වූ ශ්‍රමික සම්පාදනය 2016 වර්ෂය වන විට සියයට32 ක් දක්වා වර්ධනය වීමක් පෙන්නුම් කලද එය කාර්යාංශයේ කාර්ය සාධනයේ උන්නතියක් නිසා සිදු වූවක් නොව විදේශ රැකියා වෙළඳපලේ ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් සඳහා පැවති ඉල්ලුම හීනවීම නිසා බව විගණනයේදී නිරීක්ෂණය විය.	(ආ)මෙම ත්වයන්ට ඉහත (අ) සඳහන් කරුණු වලට අමතරව එතෙර ශ්‍රම වෙළඳ පොලෙහි රැකියා අවස්ථා අඩුවීම සඳහා පහත හේතු ද බලපානු ලැබේ. i. විදේශ රැකියා වෙළඳපොල සඳහා නව රටවල් ඇතුලත් වීම හා එම රටවල් අවම වැටුප් සහ සේවා කොන්දේසි යටතේ ශ්‍රමිකයන් සැපයීමට ඉදිරිපත් වීම හේතුවෙන් රැකියා අණවුම් ඔවුන් වෙත යොමුවීම. ii. ඇතැම් රට වල විදේශීය ශ්‍රමිකයන් සම්බන්ධයෙන් වන වීසා ප්‍රතිපත්ති වෙනස් වීම. iii. විදේශ ශ්‍රමිකයන් සඳහා විවෘතව පැවති ඇතැම් රැකියා අවස්ථා සඳහා ස්වදේශිකයන් ආදේශ කිරීමට ඇතැම් රටවල් ගෙනඇති ප්‍රතිපත්තිමය තීරණ. iv. විදේශීය ශ්‍රමිකයන් ලබාගන්නා ඇතැම් රටවල සිදු වී ඇති දේශපාලන හා ආර්ථිකමය අස්ථාවර තත්වයන්
(ඇ)පුහුණු ශ්‍රමිකයින් වැඩි වශයෙන් විදේශ රැකියා වෙළඳපල වෙත යොමු කිරීම සඳහා ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණියන් දැනුවත් කිරීම සඳහා රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්ක කේන්ද්‍ර කරගනිමින් ආරම්භ කරන ලද නියමු ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පදනම මත දිස්ත්‍රික්ක වලින් සම්බන්ධීකරණ නිලධාරීන් පිළිවලින් 06 දෙනෙකු සහ 04 දෙනෙකු බඳවාගෙන තිබූණි. මත 2016 වර්ෂයේ දී රු.30,000 ක දීමනාවක් මත බඳවාගෙන තිබූ එම නිලධාරීන් 2014 නොවැම්බර් 12 දිනැති අංක	(ඇ) පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා වෙළඳපළ වෙත යොමු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කරනුලැබූ නියමු ව්‍යාපෘතියෙහි සේවය සඳහා කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි සම්බන්ධීකරණ නිලධාරීන් 10 දෙනෙකු

25/2014 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඡේද අංක 07 හි නියමයන්ට පටහැනිව බඳවාගෙන තිබූඅතර ඒ සඳහා 2016 දෙසැම්බර් 31 දින දක්වා රු. 2,344,000 ක වියදමක් කාර්යාංශය විසින් දරා තිබුණි. එහෙත් එම නියමු ව්‍යාපෘතියේ කාල සීමාව අවසන්ව තිබුණ ද ඊට අදාල ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ කිසිදු පසු විපරමක් කාර්යාංශය විසින් සිදුකර නොතිබුණි.	කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගන්නා ලදී. පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා වෙළඳපළ වෙත යොමු කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතීන් සඳහා එවකට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (අලෙවිකරණ) විසින් ඉදිරිපත් කරන ලද “Concept Note” පදනම් කර ගෙනනියෝජ්‍ය සාමාන්‍යාධිකාරී පරිපාලන හා මානව සම්පත් විසින්, රත්නපුර දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතිය සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් 06 දෙනෙකු බඳවා ගැනීමටත්, ගාල්ල දිස්ත්‍රික්කය සඳහා සම්බන්ධීකරණ නිලධාරීන් 04 දෙනෙකු බඳවා ගැනීමටත්, අංක 144/2015 (M-8) හා 2015.12.23 දින දරණ සහ අංක 80/2016 (M-6) හා 2016.12.24 දින දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කර ඇත. කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතිය පරිදි රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතීන්ට අදාළ සම්බන්ධීකරණ නිලධාරීන් බඳවා ගැනීමේ කාර්යය පමණක් පරිපාලන හා මානව සම්පත් අංශය විසින් සිදු කර ඇත. මෙමනිලධාරීන් විසින්සිදු කරන ලද රාජකාරි කටයුතු වලට අදාල මාසික වාර්තා අනුව එහි ප්‍රගතිය පදනම් කරගෙන අලෙවිකරණ හා බඳවාගැනීම් (සාමාන්‍ය) මඟින් පහත සඳහන් කණ්ඩායම හඳුනාගනිමින් “නිපුණත්වයෙන් සවිබල ගැනුවූ එතෙර රැකියාවක්” මැයෙන් විදේශ රැකියා ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලදී. A කණ්ඩායම - නිපුණතාවයක් හා සේවා පළපුරුද්දක් ඇති විදේශ රැකියා

	අපේක්ෂකයින් B කණ්ඩායම - නිපුණතාවයක් නොමැතිව සේවා පළපුරුද්දක් පමණක් ඇති විදේශ රැකියා අපේක්ෂකයින් C කණ්ඩායම - නිපුණතාවයක් පමණක් ඇතත් සේවා පළපුරුද්දක් නොමැති විදේශ රැකියා අපේක්ෂකයින් D කණ්ඩායම - නිපුණතාවයක් හා සේවා පළපුරුද්දක් නොමැති විදේශ රැකියා අපේක්ෂකයින්
(ඈ) අමාත්‍යවරිය විසින් සිංගප්පූරුවේ දී ලබාගත් වෛද්‍ය ප්‍රතිකාර වෙනුවෙන් වැය වූ සිංගප්පූර් ඩොලර් 989.25 ක මුදල (ආසන්න වශයෙන් රු.102,993 ක්) කාර්යාංශයේ සුභ සාධන අරමුදලින් දැරිය නොහැකි වුවද එම මුදල වෙනත් නිලධාරියෙකු නමින් අමාත්‍යවරිය වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි.	**(ඈ)** අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක 13/2016 යටතේ 2016.01.28 දින පැවති අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අනුව සිදු කර ඇත.
4.4 නිශ්කාර්ය හා ඌන උපයෝජිත සම්පත් --- පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.	
(අ) අපහරණය කිරීමට නියමිතව ඇති කාර්යාංශයේ වාහන 27 ක් 2015 ජූලි 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2015 ප්‍රකාරව 2016 දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කරනොතිබුණි.	**අ)**ඒ අනුව, අපහරණය කිරීමට නියමිතව තිබූ කාර්යාංශ වාහන විසි හතෙන් (27) දොළහක් (12) අපහරණ කමිටුවේ තක්සේරුව හා තාක්ෂණ ඇගයුම් කමිටුවේ නිර්දේශය මත අපහරණය කිරීමට කටයුතු සිදු කරමින් පැවති අතර එම වාහන දොළහක් (12) න් පහක් (05) ක් මේ වන විට අපහරණය කර ඇත. අනෙකුත් ඉතිරි වාහන අපහරණය කිරීම සඳහා තක්සේරු කර අපහරණය කිරීමට නියමිතය.
(ආ) වසා දැමූ පුහුණු මධ්‍යස්ථාන වල තිබූ භාණ්ඩ අයිතම 07 ක් භාවිතයට නොගෙන නිශ්කාර්යව පැවතුණි.	

ආ) වසා දමන ලද කාර්යාංශ පුහුණු මධ්‍යස්ථාන වල භාවිතාකරන ලද පුහුණු අංශයට අදාල භාණ්ඩ ආසන්න පුහුණු මධ්‍යස්ථාන වලට හෝ ප්‍රධාන කාර්යාලයේ පුහුණු අංශය වෙත රැගෙන ආ අතර අවශ්‍යතාවයන් අනුවඉල්ලුම් කරනු ලබන පුහුණු මධ්‍යස්ථාන වෙත එම භාණ්ඩ ලබාදෙනු ලැබේ.

භාණ්ඩ වර්ගය	ප්‍රමාණය	නැවත භරදුන් දිනය	නැවත භරදුන් පුහුණු මධ්‍යස්ථානය
ටෝස්ටර්	01	2016.12.29	රත්නපුර පු.ම.
ටී කප් සෙට්	01	2016.12.29	”
රයිස් කුකර්	03	2016.12.29	”
ජූසර්	02	2016.11.28	”
ග්‍රයින්ඩර්	01	2016.12.29	”
මයික්‍රෝවේව් අවන්	01	2016.12.30	”
කිරි බෝතල් තම්බන මැෂින්	01	2016.12.30	”
විදුලි කේතල්	01	2016.11.03	කුරුණෑගල පු.ම.
අවන්	01	2016.11.03	”
රූපවාහිනී	01	2016.11.03	”

4.5ආර්ථික නොවූ ගණුදෙනු

ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්ති සඳහා පිටව යන සේවා නියුක්තියෙන් පසු පෙරලා රටට පැමිණෙන ශ්‍රී ලාංකිකයින් සම්බන්ධයෙන් තොරතුරු දත්ත බැංකුවක් පවත්වාගෙන යාමට කාර්යාංශය කටයුතු කර තිබුණි. ඒ අනුව 2016 ජනවාරි 08 සිට 14

දක්වා කාල සීමා තුළ දී ලියාපදිංචිය සිදුකිරීම සඳහා ක්‍රියාත්මක කල ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් කාර්යාංශය රු.8,274,964 වැය කර තිබුණි. කෙසේ වුවද එම කාල සීමාව තුලදී 2014 හා 2015 වර්ෂවල විදේශගත වූ ශ්‍රමිකයින් 563,768 ගෙන් සියයට 25 ක තරම්වත් වූ ප්‍රමාණයක් උක්ත දත්ත බැංකුවේ ලියාපදිංචි වී නොතිබුණි. ඒ අනුව ඒ සඳහා දරන ලද වියදම ඵලදායී නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.	"ශ්‍රමික සුරැකුම" වැඩසටහන යටතේ 2016 වර්ෂය තුල ශ්‍රමිකයින් 243912 කු ලියාපදිංචි වී ඇති අතර 2017 දෙසැම්බර් 31 දින වන විට තවත් 34408 කු ලියාපදිංචි වී සිටිති. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දින වන විට ලියාපදිංචි වී සිටින මුළු ශ්‍රමිකයින් ප්‍රමාණය 278,320 කි.
4.6 හඳුනාගත් පාඩු --- පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.	ඒ අනුව බලන කළ ලියාපදිංචි ශ්‍රමිකයින් ගණන සැලකිය යුතු මට්ටමකින් ඉහළ ගොස් ඇති බැවින් මෙහි ඵලදායිතාවය පිළිබඳව ගැටළුවක් පැන නොනගින බවද කාරුණිකව දන්වමි.
(අ) රේඛීය අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබූ විදේශ ගමන් සම්බන්ධයෙන් කාර්යාංශය විසින් දරන ලද රු.463,481 ක් අමාත්‍යාංශයේ පුර්ව අනුමැතියකින් තොරව සිදු කර තිබීම හේතුවෙන්අමාත්‍යාංශය මගින් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි.	**(අ)** ගරු අමාත්‍යතුමියගේ නිල විදේශ සංචාරයන්හි ප්‍රධාන අරමුණ වනුයේ විදේශ රැකියා ක්ෂෙත්‍රයට හා විගමනික ශ්‍රමිකයින්ගේ සුභසාධන උදෙසා ද්විපාර්ශවික ගිවිසුම් හා අවබෝධතා ගිවිසුම් සම්බන්ධ සාකච්ඡා කිරීමත්, විගමනික ශ්‍රමිකයින්ගේ සුභසාධන කටයුතු පිළිබඳ සොයා බැලීමත්, රැකියා ප්‍රවර්ධන කටයුතු ආදි විගමනික ක්ෂේත්‍රයට අදාල කටයුතු සම්බන්ධව සාකච්ඡා කිරීමත් නිසාවෙන් අදාල තානාපති කාර්යාලවල කම්කරු සුභසාධන අංශ වලට මේ සඳහා සෘජුවම මැදිහත්වීමට සිදුවන අතර එවැනි කටයුතු සඳහා වූ නිල සංචාරයන්හිදි දුන මණ්ඩල ප්‍රධානින්ගේ ඉල්ලීම මත

	කඩිනමින් අදාල සංවිධාන කටයුතු කිරීමට වියදම් කාර්යාංශයේ අදාල ක්‍රියාකාරී සැලැස්මේ දුන පිරිස් මෙරටින් යැවීමට වෙන් කර ඇති ප්‍රතිපාදන යටතේ ලබා දී ඇත.
(ආ)ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 53 (3) වගන්තියෙන් බැහැරව කාර්යාංශය විසින් නම් කරනු ලැබූ විදේශ රැකියා නියෝජිත ආයතනයන් හරහා ලියාපදිංචිය සඳහා අයදුම් කිරීමට ඉඩ සලසමින් අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි.ඒ හේතුවෙන් ලියාපදිංචි ගාස්තු ලෙස කාර්යාංශය විසින් 2015 සහ 2016 වර්ෂවල රැස්කර ගන්නා ලද ආදායමින් සියයට 70 ක් එනම් පිළිවෙලින් රු.31,612,000 ක් හා රු.91,623,000 ක් ලෙස එකතුව රු.123,235,000 ක් එසේ නම් කරනු ලැබූ පෞද්ගලික නියෝජිත ආයතනවලට ගෙවීමට කටයුතු කර තිබීමෙන් කාර්යාංශයට එම ආදායම් අහිමි වී තිබුණි.	කෙසේ නමුත් මේ වන විට ගරු විෂයභාර අමාත්‍යතුමියගේ නිල විදේශ සංචාර සම්බන්ධයෙන් කාර්යාංශයේ යම් මැදිහත්වීමක් අවශ්‍ය වන්නේ නම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ උපදෙස් හා අනුමැතිය අනුව කටයුතු කර ගෙන යනු ලැබේ.
(ඇ) කොරියානු රැකියා ලාභීන්ගේ වෛද්‍ය පරීක්ෂණයන් සිදු කිරීම සඳහාඅවශ්‍යවන පරිපාලන සේවාවන් ලබාදීමේ කටයුතු වෙනුවෙන් අදාල මාසයේ වෛද්‍ය ගාස්තු අදායමින් සියයට 25 ක් කාර්යාංශය පරිපාලිත සමාගම් වෙත ගෙවීමට එකඟ වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල සමාගම් රු.9,507,988 ක ආදායමක් උපයාගෙන තිබූ නමුත් අදාළ සියලු පරිපාලන කටයුතු කාර්යාංශයේ බඳවා ගැනීම් අංශය විසන් සිදු කර තිබුණි.	(ආ) පෞද්ගලික මාර්ගයෙන් විදේශගත වන පුද්ගලයින් ඒජන්සි හරහා ලියාපදිංචි වන ලෙස කිසිම දිනක කාර්යාංශය අභ්‍යන්තර චක්‍රලේඛයක් නිකුත් කර නොමැති අතර, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත අනුව ඒජන්සි ආයතනයක් මාර්ගයෙන් ලියාපදිංචි වීමේදී ලියාපදිංචි ගාස්තුවෙන් 70% එම ආයතනයට ආපසු ගෙවිය යුතු බැවින් ඒ අනුව අදාළ ඒජන්සි ආයතන වෙත 70% මුදල් ගෙවා ඇත.
	(ඇ) ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අයත් පූර්ණ පරිපාලිත රාජ්‍ය සමාගමක් වන අතර විදේශ රැකියා ඒජන්සි ආයතනයේ ලාභය/ අලාභය කාර්යාංශයේ ලාභය සමඟ ඒකාබද්ධ කර මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කරනු ලබන අතර, කොරියානු රැකියා අපේක්ෂකයන්ගේ වෛද්‍ය පරීක්ෂණ වාර්තා ලබා

4.7 වෙනත් ආයතන වෙත ලබා දුන් සම්පත් --- පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ. **(අ)** 2016 වර්ෂය තුළ කාර්යාංශය විසින් රේඛීය අමාත්‍යාංශය වෙත නිලධාරීන් 07 දෙනෙකු හා පරිපාලිත සමාගම වෙත නිලධාරීන් 03 දෙනෙකු සේවය සඳහා යොදවා තිබූ අතර වැටුප් හා දීමනා ලෙස රු. 5,308,240 ක් කාර්යාංශය විසින් වැය කර තිබුණි. මීට අමතරව සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය වෙත නිලධාරීන් දෙදෙනෙකුනිදහස් කර තිබුණි.	ගැනීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම යොදා ගැනීමට එහි පරිපාලන ආයතනය වශයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය කටයුතු කරන ලද්දේ පහත කරුණු සැලකිල්ලට ගෙනය. 1. අදාල ශ්‍රමිකයන්ගේ වෛද්‍ය වාර්තා නියමිත රෝහල් වෙතින් කඩිනමින් ලබාගෙන ඒ ක්‍රියාවලිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම හා 2. කාර්යාංශයේ බඳවාගැනීමේ යාන්ත්‍රනය වන විදේශ රැකියා ඒජන්සි ආයතනය බඳවාගැනීම් මත පමණක් ලබන ආදායම එය පවත්වාගෙන යාමට දැනට ප්‍රමාණවත් නොවන බැවින් එහි පවතින මානව සම්පත් තවදුරටත් යොදවා ගෙන එම ආයතනය වෙත යම්කිසි ආදායම් මාර්ගයක් සලසා දීම යන කරුණු සඳහා බව. එසේම 2016 වසරේදී දින 47.1 ක් වූ ශ්‍රී ලංකාවේ ප්‍රතිචාර දැක්වීමේ කාලය (Responsive Period) මේ වන විට දින 29.1 දක්වා අඩුකර ගැනීමට හැකියාව ලැබී ඇති බැවින් එම ක්‍රියාවලිය කාර්යක්ෂමව කිරීම සඳහා තවදුරටත් ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනයේ සේවය අවශ්‍ය නොවන බව පෙනී ගිය හෙයින් 2017.08.04 දින සිට ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි ආයතනයේ සේවය අවසන් කරන ලදී.

2016.12.31 දිනට විදේශ රැකියා ඒජන්සි සමාගමෙහි සේවයසඳහා අනුයුක්ත කර සිටි කාර්ය මණ්ඩලය

	නම	කාර්යාංශයේ දරනු ලබන තනතුර
01	ඒ.එම්.එන්. උමාරත් මයා	පරිපාලන නිලධාරි
02	එල්.සි.ඩී. සිගේරා මෙය	පරිපාලන නිලධාරි
03	සි. රණසිංහ මිය	පරිපාලන නිලධාරි

විදේශ රැකියා ඒජන්සි සමාගම කාර්යාංශය යටතේ ක්‍රියාත්මක වන උප ආයතනයක් වන අතර, සේවා අවශ්‍යතාවය පිළිබඳව සළකා බලා කාර්යාංශය විසින් ඉහත සඳහන් කාර්ය මණ්ඩලය විදේශ රැකියා ඒජන්සි සමාගම වෙත අනුයුක්ත කර තිබුණි.2016.12.31 දිනට විදේශ රැකියා ඒජන්සි සමාගම වෙත අනුයුක්ත කර සිටි ඉහත නිලධාරීන් අතුරින් මේ වන විට ඒ.එම්.එන්. උමාරත් මයා විදේශ රැකියා ඒජන්සි සමාගමට අනුයුක්තව සේවය කරනු ලබයි.

2016.12.31 දිනට විදේශ රැකියා අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර සිටි කාර්ය මණ්ඩලය

	නම	තනතුර
01	සි. රණසිංහ මිය	පරිපාලන නිලධාරි
02	පී.යූ. ගුණසේකර මිය	පොදු සහකාර
03	බී.යූ. හෙට්ටිගේ මිය	කළමනාකරණ සහකාර
04	එම්.ජී.ඩී. සඳරුවන් මයා	කාර්යාල කාර්ය සහයක
05	එස්.ඩී.සි. මදුරංග මයා	කාර්යාල කාර්ය සහයක

06	ආර්.ඒ. ගිහාන් මයා	රියදුරු
07	ජී.එච්.එම්. නවරුවන් මයා	රියදුරු

විගණන විමසුමෙහි සඳහන් කරුණු පිළිගනිමි.

සේවා අවශ්‍යතාවය පිළිබඳව සලකා බලා ඉහත සඳහන් කාර්ය මණ්ඩලය විදේශ රැකියා අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර සිටි අතර,2018.02.28 දින සිට එම කාර්ය මණ්ඩලය කාර්යාංශයේ සේවය සඳහා වාර්තා කර ඇත.

සබරගමුව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය වෙත අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩලය

සබරගමු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව වැටුප් හා දීමනා සබරගමු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයෙන් කාර්යාංශය වෙත ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම මත පහත නම් සඳහන් කාර්ය මණ්ඩලය සබරගමු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය වෙත නිදහස් කරනලදී.

	නම	තනතුර
01	දිනේෂා නිෂානි මිය	පොදු සහකාර
02	ඒ.එම්.ඒ.එන්.පි. දිසානායක මයා	රියදුරු

මෙම කාර්ය මණ්ඩලය වෙත 2017 දෙසැම්බර් මස දක්වා ගෙවන ලද වැටුප් හා දීමනා සබරගමු පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය විසින් කාර්යාංශය වෙත ප්‍රතිපූර්ණය කර ඇත.

(ආ) කාර්යාංශය විසින් 2016 වර්ෂය තුල විදේශ රැකියා අමාත්‍යාංශයේ කටයුතු සඳහා වාහන 04 ක් වෙන් කර තිබූ අතර ඒ වෙන්වෙන් රු. 3,292,242 ක වැයකර තිබුණි.

4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 1248 ක් වූ අතර මාණ්ඩලික ශ්‍රේණියේ, මාණ්ඩලික නොවන ශ්‍රේණියේ සහ වෙනත් යන කාණ්ඩවල පිළිවෙලින් 81,38, හා 11 ක ඌනතාවයක් වූ අතර සුළු සේවකයින් 46 අතිරික්තයක් විය.

කටයුතු සඳහා වෙන්කර තිබූ වාහන 04 මේ වන විට ප්‍රධාන කාර්යාලයේ වාහන සංචිතය වෙත නැවත ලබාගෙන ඇත.

අ)2016.12.31 දිනටසුළු සේවක කාර්ය මණ්ඩලය

තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	
		ස්ථිර	කොන්ත්‍රාත්
විදුලි කාර්මික ශිල්පි/ ජලනල කාර්මික ශිල්පි /වායු සමීකරණ කාර්මික ශිල්පි	3	4	1
රියදුරු	65	77	4
කාර්යාල කාර්ය සහයක	155	94	89

2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 මඟින් ස්ථිර සේවයට අන්තර්ග්‍රහනය කරන ලද කාර්ය මණ්ඩලය

වායු සමීකරණ කාර්මික ශිල්පි	02
විදුලි කාර්මික ශිල්පි	02
රියදුරු	37
කාර්යාල කාර්ය සහයක	16

2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 මඟින් තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනම මත බඳවාගෙන ඇති දින 180 සම්පූර්ණ කරන ලද කාර්ය මණ්ඩලය ස්ථිර

(ආ) සමාලෝචිත වර්ෂය තුල අනුමත නොවූ තනතුරු 05 ක් සඳහා නිලධාරීන් 44 දෙනෙකු වෙනුවෙන් රු.17,892,771 ක වැටුප් ගෙවා තිබුණි.	සේවයට අන්තර්ග්‍රහනය කිරීම හේතුවෙන් සුළු සේවක ගණය තුල සේවකයින් අතිරික්තයක් පෙන්නුම් කල අතර කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්යාංශය වෙත යොමු කරන ලද අංක DMS/1727/III හා 2017.08.09 දිනැති ලිපිය මඟින් රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ අංක 25/2014 යටතේ ස්ථිර පත්වීම් ප්‍රදානය කරන ලද කාර්ය මණ්ඩලය එම තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කරන ලද බව කාර්යාංශය වෙත දන්වා ඇත. එමෙන්ම කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්යාංශය වෙත යොමු කරන ලද අංක DMS/1727/IV හා 2018.01.28 දිනැති ලිපියට අනුව, කාර්යාංශය සඳහා කාර්යාල කාර්ය සහායක තනතුරු 25ක් අනුමත කර ඇත. ඒ අනුව සුළු සේවක ගණය තුල මේ වන විට කාර්ය මණ්ඩලය අතිරික්තව නොමැත. **ආ)** **තනතුර** — **නිලධාරීන් සංඛ්‍යාව** 01 කාර්මික ශිල්පි — 01 02 රියදුරු — 04 03 කාර්යාල කාර්ය සහායක — 28 04 සම්බන්ධීකරණ නිලධාරි — 10 05 පොදු කාර්මික (පැවරුම් පදනම) — 01 1. කාර්මික ශිල්පි 2. රියදුරු 3. කාර්යාල කාර්ය සහායක 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රෙල්ඛ අංක 25/2014ට අනුව,

	කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලද කාර්ය මණ්ඩලය ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීම හේතුවෙන් සුලු සේවක ගණය තුල අතිරික්තයක් පැවති අතර කළමණාරන සේවා දෙපාර්තමේන්තුවෙන් කාර්යාංශය වෙත යොමු කරන ලද අංක DMS/1727/III හා 2017.08.09 දිනැති ලිපිය මගින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 යටතේ ස්ථීර පත්වීම් ප්‍රදානය කරන ලද කාර්ය මණ්ඩලය එම තනතුරු දරන්නාට පෞද්ගලික වන සේ අනුමත කර ඇත. 4. සම්බණ්ධීකරණ නිලධාරී පුහුණු ශ්‍රමිකයන් විදේශ රැකියා වෙළඳපළ වෙත යොමු කිරීම හා ප්‍රවර්ධනය කිරීම උදෙසා රත්නපුර හා ගාල්ල දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කරනු ලැබූ නියමු ව්‍යාපෘතියෙහි සේවය සඳහා කාර්යාංශ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය පරිදි, සම්බන්ධීකරණ නිලධාරින් කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගන්නා ලදි.
(ඇ) විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දූත මණ්ඩල කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කර ඇති තනතුරු වලට අනුමත බඳවා ගැනීමේ පටිපාටියකින් තොරව කාර්යාංශය විසින් සකසාගත් බඳවා ගැනීමේ ක්‍රම වේදයකට බඳවා ගැනීම් සිදු කර තිබුණි.	5. පොදු කාර්මික ශිල්පි කාර්යාංශයේ විවිධ නඩත්තු කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පොදු කාර්මික ශිල්පි තනතුර සඳහා පුද්ගලයෙකු පැවරුම් පදනම මත බඳවා ගෙන ඇති අතර, ඔහුගේ පැවරුම් කාල සීමාව 2017.09.30 දිනෙන් අවසන්ව ඇත. (ඇ) දැනට විදේශ දූත මණ්ඩල බඳවා ගැනීම් සිදුකිරීමේදී අනුගමනය කරනු ලබන්නේ බඳවාගැනීම් පටිපාටිය 2010 වර්ෂයේදී විදේශ දූත මණ්ඩල සඳහා කාර්ය මණ්ඩලය අනුමත කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද බඳවාගැනීම් පටිපාටිය වන
6. පද්ධති හා පාලනයන්	

----------	අතර, කාර්යාංශය විසින් විදේශ දූත මණ්ඩල සඳහා බඳවාගැනීමේදී අනුගමනය කරන, දැනටමත් රජයේ විගණන අංශය වෙත ලබා දී ඇති බඳවාගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පිළිගෙන ඇති බව එවකට පවත්වාගෙන ගිය ලිපිගොනු නිරීක්ෂණය කිරීමේදී තහවුරු වීඇත.
විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානය සඳහා යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්දයෙන් විශේෂ අවධානය යොමු කල යුතුය.	
පද්ධති හා පාලන ක්ෂේත්‍ර නිරීක්ෂණ ---------- ----------	
අ) ගිණුම්කරණය (i)කාර්යාංශයට ලැබිය යුතු හා කාර්යාංශය විසින් ගෙවිය යුතු ශේෂයන් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් පැවතීම.	
(ii) විදේශ දූත මණ්ඩල මගින් උපයා ගනු ලබන ආදායම් රැස්කර ගැනීම හා ඵලදායී ලෙස විගමණික ශ්‍රමිකයන්ට එම මුදල් සේවාවන් සැපයීම සඳහා ප්‍රයෝජනයට නොගැනීම.	
ආ)මෙහෙයුම් පාලනය- (i)ඉඩම් මිලදී ගැනීමේ දී විධිමත් අයිතිය පිළිබඳ තහවුරුකරගැනීමකින් තොරව මිලදීගැනීමට කටයුතු කිරීම.	
(ii)විදේශ රැකියා නියෝජිත ආයතන වල කටයුතු ක්‍රමවත් කිරීම හා පාලනය කිරීමට කටයුතු නොකිරීම.	
ඇ) මානව සම්පත්- කාර්යාංශය සතු භෞතික හා මානව සම්පත් පාලනය	

භාෂාවන්	භාෂා උපයෝජනය විධිමත්ව සිදු නොවීම.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය
இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்பு பணியகம்
Sri Lanka Bureau of Foreign Employment

ප්‍රධාන කාර්යාලය

234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව

දුරකථන

+94 11 286 4101 - 105 / +94 11 288 0500

විද්‍යුත් තැපෑල

info@slbfe.lk

වෙබ් අඩවිය

www.slbfe.lk